## 2019.07.03 හා 04 යන දෙදින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදූර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.30ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸**

**(01)**

**01.01** **2019 – 06 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම**

2019-06-04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

- **ඒ අනුව 2019 – 06 - 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්.**
මා මේ මාසික සභා වාර්තාව සම්මත කරන අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ නගර සභාව සිටින සේවකයන් පිළිබඳව. ස්ථිර සේවකයන්ට රජයෙන් පඩි ගෙවනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
ඔබතුමා සංශෝධනයක් ද කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්.**
නැහැ . සංශෝධනයක් නෙමේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
න්‍යාය පත්‍රයට අනුව කතා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්.**
එහෙමනම් මාසික සභා වාර්තාවේ මුදල් පිළිබඳ අනුමතියට මාගේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන සියළුම ගරු මන්ත්‍රිවරු විමසනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
මොකක්ද පිටුව

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්.**
මුදල් ගෙවීම පිළිබඳව

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
සංශෝධනයක් විය යුතු තැනක් වේ නම් ඉදිරිපත් කරන්න.මුදල් ගෙවිම් පිළිබඳ සභාවේ අනුමතිය ලැබි අවසන්. මේ වාර්තාව පිළිබඳව තමයි අනුමතිය ලබා දෙන්නේ. ඒ වෙලාවේ ඔබතුමාලා අනුමත කර තිබෙන්නේ.

**සංශෝධන**
සුදුවැල්ල 11 වන හරස් පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම 2019.03.05 තීරණ අංක 10.07

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
සුදුවැල්ල 11 වන හරස් පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම 2019.03.05 තීරණ අංක 10.07

ඉහත කර්මාන්තයට අදාල ඇස්තමේන්තුගත මුදල රු.350,000/= වුවද එම ඇස්තමේන්තුව 2019.03.05 දින සභාගත ( අනුමත වීම ) වීමෙන් පසු සභා තීරණයෙහි රු.500,000/= ලෙස සටහන් වී ඇත. එය රු.350,000/= ලෙස සංශෝධනය කර නව සභාතීරණයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**තීරණය**
සුදුවැල්ල 11 වන හරස් පාර අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම සඳහා රු 350,000/= ක මුදලක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන ඇත

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. අද දින පැවැත්වෙන මාසික සභා රැස්වීමට අසනීප තත්ත්වය හේතුවෙන් පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් අසනිප තත්වය නිසා මාසික සභා රැස්විමට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ විලේගොඩ හල්වතුර ගම්වාසින් විසින් සංවිධානය කරන ලද රාත්‍රී මහා බත් දන්සැලට ජලය සඳහා ජල බවුසරය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබාදිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ විලේගොඩ හල්වතුර ගම්වාසින් විසින් සංවිධානය කරන ලද රාත්‍රී මහා බත් දන්සැලට ජලය සඳහා ජල බවුසරය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා . එය සභා අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා. ඒ සඳහා අනුමතිය ලබා දෙනලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ , විලේගොඩ , හල්වතුර ගම්වාසින් සංවිධානය කරන ලද රාත්‍රී මහ බත් දන්සැලට සභා අනුමැතියට යටත්ව ජල බවුසරය නොමිලේ ලබා දිම පිළිබඳව සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.02 අම්බලන්ගොඩ හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්කර ගන්නා ලද ඉඩම්වලට ගෙවිය යුතු වන්දි මුදල් ඉල්ලිම සම්බන්ධව ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය මහ ලේකම්, අම්බලන්ගොඩ අම්බලන්ගොඩ හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්කර ගන්නා ලද ඉඩම්වලට ගෙවිය යුතු වන්දි මුදල් ඉල්ලිම සම්බන්ධවයි. උක්ත අත්කර ගැනීමට අදාලව අභයස්ථාන්, රේගුව පාර , බලපිටියේ පදිංචි ඩී.ඩී.පී.ඩී.ජේ. අබේසේකර මහත්මියගේ වන්දි ඉල්ලිම් සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරනු ලැබූ 2018.11.07 දිනැති ලිපිය හා බැඳේ (ඇමුණුම් අංක 01) එමෙන්ම උක්ත අත්කර ගැනීමට අදාල ඉදිරි ක්‍රියාමාර්ග සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙත හල්වතුර ව්‍යාපෘතිය යටතේ අත්කර ගන්නා ලද ඉඩම්වල භුක්තිය ලබා ගැනීම සම්බන්ධයෙන් ඔබ විසින් විමසුම් කර ඇති 2018.06.28 දිනැති ලිපිය කෙරේද ඔබගේ කාරුණික අවධානය යොමු කරවනු ලැබේ.උක්ත අත්කර ගැනීමට අදාලව මේ වනවිට ඉඩම් අත්පත් පනතේ 9 වන වගන්ති පරීක්ෂණ පවත්වා හිමිකම තීරණය කර ඇති ඉඩම් සඳහා තක්සේරු කර ඇති වන්දි මුදල් ගෙවීම් සඳහා ද නගර සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් නොවන බව මා වෙත දන්වා ඇත. එබැවින් ඔබ සභාව භාරයේ පවතින ඉඩම්වල භුක්තිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාරදීමෙන් පසු අදාල වන්දි මුදල්, එම අධිකාරිය විසින් ගෙවනු ලබන බවට එකඟත්වය පළ කර ඇත. ඒ අනුව ඔබ නකර සභාව විසින් ද එකඟත්වය පළ කර ඇත. නමුත් මෙතෙක් එම භුක්තිය භාරදීමේ කටයුතු සිදු

වී නොමැති අතර මෙම ඉඩම් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද මෙතෙක් මා වෙත දන්වා නොමැත.එමෙන්ම ඉහත ඉල්ලුම්කාරිය ඇතුළු තවත් ඉඩම් හිමිකරුවට අදාලව ඉදිරියේදී වැඩිදුරටත් ඉඩම් අත්පත් පනතේ 9වන වගන්තිය යටතේ මිහිකම් පරික්ෂණ පැවැත්වීමට නියමිත අතර ඉඩම අත්කර ගන්නා ලද ආයතන විසින් මෙම අත්කර ගැනීමට අදාලව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුම් දෙන තුරු එම ඉදිරි කටයුතු අඩාල වී ඇත. තවද මේ වන විට ඉඩම් අත්පත් පනතේ 9 වන වගන්ති පරික්ෂණ පවත්වා හිමිකම් තීරණය කර ඇති ඉඩම් සඳහා කත්සේරු කර ඇති රුපියල් 20,244,000.00 ක වන්දි මුදල් ද මෙතෙක් ලබා දී නොමැත. එවැනි වාතාවරණයක් පවතින අතරතුර ඉහත ඉල්ලුම්කාරිය නිරන්තරයෙන් මෙම කාර්යාලයට පැමිණ තමාට හිමි වන්දි මුදල් ලබා දෙන ලෙසට ඉල්ලුම් කරනු ලබයි. එබැවින් එම ඉල්ලුම්කාරියට අදාල වන මු.පී.ගා. 2361 හි කැබලි අංක 01 ට අදාලව පමණක් ඉඩම් අත්පත් පනතේ 9 වන වගන්ති යටතේ වූ පරීක්ෂණ පවත්වා හිමිකම් තීණය ලබා දීම සිදු කළ හැකිය. ඊට අදාලව ගෙවිය යුතු තක්සේරු කරනු ලබන වන්දි මුදල් සහ 38(අ) අතුරු විධානය නිකුත් කරනු ලැබූ 1988-09-23 දින සිට වන්දි මුදල් ගෙවනු ලබන දින දක්වා වූ පොළී මුදල් මා වෙත ලබාදීමේ හැකියාම පවතීද යන්න දන්වා එවන මෙන් කාරුණිකය ඉල්ලා ඇත. එසේ සිදු කරන්නේ නම් පමණක් ඉඩම් අත්පත් පනත යටතේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම ප්‍රායෝගික වන බවද වැඩිදුරටත් සඳහන් කර සිටි. එබැවින් ඒ සඳහා එකඟත්වය ලබාදෙන්නේ නම් පමණක් මෙම ඉල්ලුම්කාරියට වන්දි හා පොළි මුදල් ගෙවීම සඳහා ඉඩම් අත්පත් පනතේ 9වන වගන්තිය යටතේ වූ හිමිකම් පරික්ෂණ පැවැත්වීමේ හැකියාව පවතින බවද තවදුරටත් කාරුණිකව සඳහන් කර සිටින බවට ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් දන්වා ඇත.මේ පිළිබඳව සභාව තීරණය කරනු ලබන්නේ කුමක්ද ?

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි,මෙය ඉතා විශාල ප්‍රශ්නයක් වි තිබෙනවා මේ හල්වතුර ව්‍යාපෘතියට ඉඩම් අත්පත් කර ගැනීම. මේ සඳහා වන්දි ගෙවා නැහැ. මේ සංවර්ධන කටයුතු සිදු කිරිමට තිබෙන එකම ඉඩම මේයයි.අපි ඉල්ලිමක් කළා. ප්‍රාදේශිය ලේකම්තුමිය සමඟ මේ වන්දි ගෙවිමසම්බන්ධව සාකච්ජාවක් කරන්න. මොකද මෙය අවසන් විය යුතුයි.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

ගරු සභාව තින්දු කළා. මින් තබාගත යුතු මොනවාද ? අතහැරිය යුතු දේවල් මොනවාද කියා. එම රැස්වීම සඳහා ගරු මන්ත්‍රිවරුන්ට අපි දිනයක් කැඳෙව්වා. ඔබතුමන්ලා කිසිවෙක් එම රැස්විමට පැමිණියේ නැහැ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , අපි ඒ ලිපිය ආවේ නැහැ . අපිට කැදෙව්වේ නැහැ. නැහැ අපි එහෙම ලිපි අවානම් එනවා මෙය විශේෂ දෙයක් නිසා.මෙයට  අපි සහභාගි වෙනවා ඇත්තටම. මන් දන්නේ නැහැ කවදාද කියා දැනුම් දුනනේ.එයට ලිපි පැමිණියානම් විශේෂයෙන්ම එනවා. ඒ ලිපි ගොනුව බලා විස්තරය පොඩ්ඩක් දෙන්න.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

සභාවෙන් ගත් තීන්දුව අනුව මෙහි තබා ගත යුත්තේ මොනවාද? බැහැර කළ යුත්තේ මොනවාද කියා තින්දුවක් ගන්න.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අපිටත් අවශ්‍යා එයයි. අපිටත් සමහරු පැමිණ කියනවා. අපි රැස්වීමට කැඳෙව්වේ කොහොමද කියා බලන්න ඕන. මොන ප්‍රශ්න තිබුණත් මෙය හඳුනාගත යුතුයි. මෙහි වන්දි මුදල් ගෙවන්න ඕන කොහොමද කියා. නොගෙවන්න ඕන කොහොමද කියා ඒ විස්තර දැන ගත යුතුයි. අපේ නවක මන්ත්‍රිවරුත් ඉන්නවා. එම නිසා මොනවා හරි ඔබතුමා වැඩසටහනක් ක්‍රියාත්මක කර එය කළොත් හොඳයි යන එක තමයි අපගේ මතය. අපගේ ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතා පෙරත් කථා කළා මේ සම්බන්ධව.

මේ වන්දි මුදල් ගෙවන්න තිබෙන්නේ පොඩි මුදලක් බව තමයි එතුමා ප්‍රකාශ කළේ. අපිට විස්තර පොඩ්ඩක් දැන ගත යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට දන්වා තිබෙන විදියට ලක්ෂ 202ක් පමණ ගෙවන්න තිබෙනවා . 88 දි එම ගණන ගෙවිය යුතුයි. එම පොළිය ගෙවිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙයට මුදල් සොයා ගත යුතුයි. මේ කර්තව්‍යය සිදු කරන්න. සංවර්ධනය කරන්න තිබෙන එකම තැන ඔතනයි. එම නිසා මෙය අතහරින්නේ නැතිව මෙය සිදු කරන්න. අපගේ සහායෝගය අපි ලබා දෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ වගේම මෙය දැන් වනජීවි ප්‍රදේශයක් වශයෙන් නම්කර තිබෙන්නේ. එකත් අපිට ගැටළුවකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ කරුණු කරණා හඳුනා ගන්න. මේ සඳහා අදාල අමාත්‍යාංශ වලට යොමු කරන්න. මෙහි තින්දුවක් ගත යුතුයි. ඒ අය සිතල කාමරවල සිට තින්දු තීරණ ගන්නවා. මෙහි කලින් ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් යෝජනා වී තිබුණා. ඔබතුමා කාණු පද්ධතිය හරා ක්‍රමවේදයක් සකස් කර තිබුණා. මේ ගැන එහේ අමාත්‍යාවරු දන්නේ නැහැ. අපි ගිහින් හරි කරුණු පැහැදිලි කර නිදහස් කිරිමට කටයුතු කරන්න. ඒක තමයි අපගේ ඉල්ලිම. පරිසරයත් ආරක්ෂා කර ගත යුතුයි. ඉදිරියේදි අපේ කර්තව්‍යයන් සංවර්ධනය සඳහා යොමුවිය යුතුයි. අම්බලන්ගොඩ නගර සභාව ගත් කළ දැන් ඉස්සරහා යන්න පුළුවන්ද කියා.අතන ගල් දමා. ට්‍රැක්ටර් කෑලි හැමතැනම .පිටින් කවුරුහරි ඔබතුමා මුණ ගැසෙන්න පැමිණි විට අශෝභන තත්වයක් තිබෙන්නේ. මෙය හොඳ තත්ත්වයකට පත්කර සංවර්ධන කටයුතු සිදු කරන්න. රජයේ මේ සියළු ගොඩනැඟිලි ආදිය වුණත් ඔතනට ගෙනයාමේ හැකියාව තිබෙනවා.දැන් පාර්ලිමේන්තුව ඉදිකරනු ලැබුවේ වෙලක වුණත් මෙවාගේත් පුළුවනි සංවර්ධන කටයුතු සිදු කරන්න. අපි ඉල්ලා සිටිනවා ඔබතුමා මෙයට විශේෂ අවධානය යොමු කරන්න. අපගේ සහායෝගය ඕනෑම අවස්ථාවක ලබා දෙන්නම්. ප්‍රාදේශිය ලේකම්තුමිය සමඟ සම්බන්ධ වෙලා මේ ඉඩම් නිදහස් කර සංවර්ධන කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ පරිදි කොළඹ සිටින ඒ නිලධාරින් ඒ ප්‍රදේශවල ඒ නගර වල තිබෙන දේවල් පුද්ගලිකව ප්‍රායෝගිකව සැලැකිල්ලට ගන්නේ නැතිව මෙය වනජීවි කලාපයක් ලෙස බලපිටිය ආසනයේ සිට රත්ගම දක්වා එක යායක් නම්කර තිබෙනවා. මෙහි බරපතලම ප්‍රශ්නය වි තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභා සිමාව තුළ .එයට හේතුව අපි තල්ගස්ගොඩ පාර ගතහොත් තල්ගස්ගොඩ පාලම අසළ වම් පැත්තෙත් දකුණු පැත්තේත් පාරවල් වල පොඩි පොඩි ගස්වර්ගයක් තිබෙනවා. හැබැයි එතනින් එහා දකුණු පැත්තේ සිට මානාන දක්වා තනිකරම ඇත්තේ වෙල්යායයි.අපි කුඩා කාලයේ එහි බෝට්ටු ඕනෑතරම් පැද තිබෙනවා. සෙල්ලම් කර තිබෙනවා. සරුංගල් යවා තිබෙනවා. මෙහි ඇත්තේ වෙල් යායකි. වනජීවි කලාපයක් නෙමේ.සත්තු නැත. කුරුල්ලෝ ඉඳලා ඇවිත් යනවා. මෙය ඉතා වැරදියි. මෙයට අපේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ පරිදි අපි ඔබතුමාට සම්පුර්ණ සහායෝගය ලබා දෙනවා. මෙයට ගරු සභාව සමුහිකව තින්දුවක් ගන්න. මා අද යෝජනා කර සිටිනවා ඒ තින්දුව අද අපි ගතයුතු බවට.මේ වනජීවි කලාපයෙන් අම්බලන්ගොඩ නගරය ඉවත් කර ගැසට් පත්‍රයකින් සංශෝධනය කරන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.එය අපි ඒකමතිකව අනුමත කර සිටිනවා. කුමන කාලයේ කුමන පාලනයක් තුල වේවා අම්බලන්ගොඩ සංවර්ධනයට තිබෙන භුමි ප්‍රමාණය තමයි මේ. ඉතිං මෙය තමයි අපි අහිමි කර ගන්නේ.එම නිසා මෙයට අපි සියළු දෙනා වගකිව යුතුයි.මේ සඳහා අප ඔබතුමාට සම්පුර්න සහායෝගය ලබා දෙනවා. මෙයට අප සියළු දෙනාම අතිගරු

ජනාධිපතිතුමාගෙනුත් අදාල වගකිවයුතු නිලධාරින්ගෙනුත් මෙයට ඉල්ලීමක් කළ යුතුයි.මේ අම්බලන්ගොඩ නගර සභා ඉඩම් කොටස සම්පූර්ණ ගැටළු පැහැදිලි කර මේ කොටස සම්පූර්ණ වනජීවී කලාපයෙන් ඉවත් කර නගර සභාවට අත්පත් කරගෙන මෙය නගර සංවර්ධන වැඩසටහනට මෙය මුදා හරින ලෙස.අපි ඔබතුමාට සම්පූර්ණ සහායෝගය ලබා දෙනවා. මේ පිළිබඳව වගකිව යුතු අය මුණගැසීමට යාමට අවශ්‍ය කරන සියළුම සහායෝගය ඔබතුමාට ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ජීවත්වන ප්‍රදේශය මහ අම්බලන්ගොඩ දූව ප්‍රදේශයේ ජනතාව වසර 30 ක පමණ කාලයක් ඒ නිවාස සාදාගෙන ජීවත් වෙනවා.ඔය හල්වතුර යෝජනා ක්‍රමයට අයිති ඉඩම් වල අද නගර සභාවට වරිපණම් ගෙවනවා. නමුත් මේ වන තෙක් ඔප්පු ලබාදීමේ කටයුතු සිදු වෙලා නැහැ. ඇත්තටම මගේ සහෝදර මන්ත්‍රීන් වන ගරු රාහුල මහතා , ඩෙනට් මහතා ප්‍රකාශ කළ ආකාරයට අප සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ වගකීමක් වෙලා තිබෙනවා. යුතුකමක් වී තිබෙනවා මේ අවස්ථාවේ වසර 20-30ක් පමණ ජීවත්වන අයට ඔප්පු ලබා දිය යුතුයි. මේ හල්වතුර යෝජනා ක්‍රමය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බව. ඇත්තටම අපි ඒ ගැන දන්නේ නැහැ.ඒ ගැන අපි දැනුවත් වුයේ නැහැ. නැතිනම් ප්‍රධානම ප්‍රශ්නය අද මහ අම්බලන්ගොඩ දූව , තුඩුවමුල්ල ප්‍රදේශවල ජනතාවට කිසිදු හිමිකමක් ලැබීමක් නැහැ.ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතාට ප්‍රකාශ කර සිටින්නේ ගරු ඉඩම් පිළිබඳ ගරු අමාත්‍ය ගයාන්ත කරුණාතිලක මහතා සමඟ සාකච්ජා කර එකතුවෙලා මේ ඉඩම් වලට ඔප්පු ලබා දීමට කටයුතු කරන ලෙස. මොකද විශාල ප්‍රශ්නයකට මැදි වී තිබෙන්නේ ඒ ජනතාව.ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා දන්නවා. ඒ අයට පාසල් වලට දරුවන් ඇතුළත් කර ගැනිමට ගියවිට විශාල ගැටළුවක් වී තිබෙනවා මේ ඔප්පු නොමැති වීම.අපේ නගරයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් මේ ගැන ඔබතුමා හොඳ දැනුවත් විමකින් සිටින්නේ. එමනිසා එයට ඉක්මනින් විසඳුම ලබා දිම ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා ප්‍රකාශ කළ අකාරයට අපේ යුතුකමක් හා වගකීමක් වශයෙන් විශ්වාස කරමින් සියළුදෙනාම මේ සඳහා සහායෝගය ලබාදිය යුතයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරය සම්බන්ධව ප්‍රධානතම මාතෘකාවක් පිළිබඳවයි අප මේ කතා කරනු ලබන්නේ. අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඒ අය නිරන්තරයෙන් සෑම නගරයක් හරහා සෑම ගමකටම සැලසුම් සකස් කරනවා.එතකොට ඒ සැලසුම් සෑම විටම දස අවුරුදු සැලසුම්.මේ දස අවුරුදු සැලසුම් සකස් කිරිමේදි කිහිප වතාවක්ම මේ දස අවුරුදු සැලසුම් සකස් කරනු ලැබුවා.මේ සභාව අනුමත කරනු ලැබුවා.පළාත් සභාවේ අනුමතියට යවනු ලැබුවා.මේ සියළු සැලසුම් වල අනුමතිය තිබෙන්නේ මේ හල්වතුර යෝජනා ක්‍රමයත් සමඟ යාබදව.එවිට අම්බලන්ගොඩ නගර සංවර්ධනය හල්වතුර යෝජනා ක්‍රමයේ අක්කර 230 නොමැතිව ගන්නවානම් ඉතාම කුඩා සීමිත අර ඔබතුමා දන්නා පරිදි හැටන් , දික්ඔය වගේ ඉතා කුඩාම පරිපාලන ඒකකයක් වෙනවා.එහිත් ප්‍රධාන පිඩනය අක්කර 400ක පමණ වපසරිය මනිනු ලබනවා මේ ගමේ ජීවත්වන ගෙවල් ගණන. ඕනෑම ජන සංඛ්‍යා ලේඛනයක් සැදිමේදි.මේ නගරයේ ප්‍රතිපාදන ලබා දීමේදි.ප්‍රතිලාභ ලබා දීමේදි.දේශීය හෝ විදේශීය හෝ වේවා මේ සංඛ්‍යා ලේඛණ ගනු ලබන්නේ.එතකොට අක්කර 240ක් වනජීවි එකේ තිබෙද්දි මේ අක්කර 200 හරි 150 ඇතුලේ නිවෙස් ගණනින් බෙදා ගත් විට විශාල අසාධාරණයක් ගැඹුරින්ම සොයා බැලුවත් මෙයට සිද්ධ වෙනවා.මා මෙසේ ප්‍රකාශ කරන්නේ මේ නගරයේ හදවත බඳු ඉඩම පිළිබඳවයි මා මේ කතා කරනු ලබන්නේ.මෙය නොමැතිව අම්බලන්ගොඩ නගරය ගැන කතා කරන්න අයිතියක් නැහැ.අපි ගරු මන්ත්‍රීවරු 21 මේ සඳහා අප පත්කර එවා තිබෙන්නේ මේවා ආරක්ෂා කරන්න.අපි මේ ප්‍රකාශ කරමින් සිටින්නේ අපේ නොහැකියාව.පිළිඹිඹු කරමින් සිටින්නේ අපගේ නොහැකියාව. ගරු ජී.එම්. ද සිල්වා මැතිතුමාගේ කාලයේ අක්කර 30ක් ගොඩ කරනු ලැබුවා. ඒ ව්‍යාපෘතිය සාර්ථකව ගියානම් මේ වන විට මේ ව්‍යාපෘතිය සංවර්ධනය වෙලා.අවාසනාවකට ද වාසනාවකට මන්දා අම්බලන්ගොඩ ජනතාවගේ ඒ ව්‍යාපෘතිය නැවතුනා.හැබැයි ඒ ගොඩකරනු ලැබූ අක්කර 30 ප්‍රතිලාභ ජනතාව භුක්ති විඳිනවා.එම නිසා මට කියන්න සිද්ධ වෙනවා මේ

ව්‍යාපෘතිය කවුරු කළත් අම්බලන්ගොඩට සාර්ථකත්වයක් ලබන්න තිබුණු බව.මොකද උසාවි නියෝග මත රජයේ අණ පණත් වලට තමයි මේ ඉඩම ගොඩකරන්න සිද්ධ වුණේ.උසාවි නියෝගත් ලැබුණා.ඒ ව්‍යාපෘතිය ගොඩ කළ යුතු තැන් ගොඩ කරලා තිබිය යුතු තැන් තිබෙන්න හැර ගියානම් අම්බලන්ගොඩ නගරයට තිබෙන පීඩනය අඩු කිරීමට තිබුණා.දැන් අම්බලන්ගොඩ නගරයේ පාසල් බස් රථයක්වත් නතර කිරීමට තැනක් අම්බලන්ගොඩ නගරයේ නැහැ.වනජීවි කලාපය පිළිබඳ මාතෘකාව වෙනමම එකකි.එක ඒ අය උස්සාගෙන යන්නේ නැහැනේ. එය කවදා හරි දවසක අපට ඇමතිතුමා මුණ ගැසී එය නිවැරදි කර ගැනීමට පුළුවන් කරුණාවකි. ඒ අයට තිබෙන කොටස් නිදහස් කරන්න. මොකද වනජීවි කලාපයට මෙය ගැසට් කිරීමට හේතුවූ කරුණු කරුණා ඔබතුමා දන්නවා. අපගේ පසුපෙළ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම දන්නවා. ජාත්‍යන්තර ක්‍රීඩාංගණය ඉදිකරන්න හදන විට ගරු ස්වාමින් වහන්සේලා කිහිප දෙනෙක් එකතු වී පෙත්සම් ගසා එවකට ජනතා විමුක්ති පෙරමුණේ ගරු අමාත්‍යවරයෙක් සිටින කාලයේ තමයි ඔය වනජීවි කලාපය ගැසට් කරනු ලැබුවේ. දැන් මෙතුමාලාට ඊයේ දිනයේම තේරුම් කර දුන්නා පළාත් පාලන අමාත්‍යවරුන්ට ගැසට් පත්‍රයක් කියන්නේ මොකක්ද කියා.එය පණතක් නෙමේ.ගැසට් එකට අපි නගර සභාව භිය විය යුතු නැහැ.මුදල් හෝ වේවා ඕනැම දෙයක්. ගැසට් එක කියන්නේ ගැසට් එකක්. පණතකින් සම්මත වුණානම් තමයි එය බලවත් වෙන්නේ. එතකොට වනජීවි එකෙන් ගැසට් එකක් තමයි සිදු කර තිබෙන්නේ.අනෙක් කරුණ නිතිඥයෙකු ලෙස ඔබතුමා දන්නවා ගැසට් එකක වලංගු කාලය මාස 6කි. තවත් ගැසට් පත්‍රයක් නිකුත් කරන තුරු. ගරු අමාත්‍යවරයාට ඕනැම වේලාවක ගැසට් පත්‍රයක් නිකුත් කළ හැකියි.එම මාතෘකාව පැත්තකින් තබන්න. මෙයට එය පටලවා ගැනීමට අවශ්‍ය නැහැ. අපට වැදගත් වන්නේ ඒ භූමි ප්‍රමාණය ඒ අප සතුකොට ඒ අයට වන්දි ප්‍රදානය කිරීමයි.මා මේ සභාවේම මේ පිළිබඳව කතා කර අංග සම්පූර්ණ වර්තාවක් මා ලබා ගත්තා.ලිපිගොණු 18ක් මා ළඟ තිබෙනවා.එම ලිපි ගොණු 18 ම තිබෙනවා ගරු නිලානි මන්ත්‍රීතුමිය සඳහන් කළ ආකාරයට මේ ඉඩම් වල පදිංචි වී සිටින්නේ කවුද ? ඒවා භුක්ති විඳින්නේ කවුද ? යන විස්තර. අපි වන්දි ගෙවිය යුත්තේ කාටද ?වන්දි ගෙවිය යුතු ප්‍රමාණය කොපමණද ? සියළු දේ මෙහි අන්තර්ගත වෙනවා.ඒ සියළුදේම අන්තර්ගතය තමයි මේ ඔබතුමා ලක්ෂ 202ක් කියන්නේ.එය හරි මා පිළිගන්නවා.හැබැයි ඔබතුමා නිතිය පිළිබඳ දන්නා නිතිඥ මහතෙකු ලෙස දන්නවා මේ ඉල්ලන පලියට වන්දි මුදල් ගෙවිය යුතු නැහැ කියා.මේ අක්කර 200 ගණනින් අක්කර 05ක් වත් නැහැ වන්දි ගෙවිය යුතු මට්ටමේ.අනෙක් සියළු දේවල් රජයේ ඉඩම්.අල්ලා ගනු ලැබූ ඉඩම් වලට ඒ අයට නිත්‍යානුකූල ඔප්පු නැහැ.නිත්‍යානුකූල ඔප්පුවක් නැති ඒවාට රජයෙන් වන්දි මුදල් ලබා දෙන්න ඉඩක් නැහැ.එතකොට ඒ අයට තිබෙන්නේ උසාවි යන්න.අපි කියන්නේ මේ සභාවෙ මේ සඳහා කමිටුවක් හරි පත්කර ශක්තිමත්ව මුහුණ දෙන්න.ඒ ශක්තිමත්ව මුහුණ දීමේදී නිතිඥ සහාය අවශ්‍ය වෙනවා.එතකොට මේ අත්පත් කර ගත් ඒවාට ප්‍රාදේශිය ලේකම්තුමිය සමඟ අප පවසන්නේ අප අත්පත් කර ගත් ඉඩම් මේවා. අපි ඉතාම නිවැරදි අයට මේ සඳහා වන්දි ගෙවන්න සූදානම්.මොකද අපට පළාත් සභාවෙන් මුද්දර මුදල් වශයෙන් මුදල් ලැබීමට තිබෙනවා.අපි ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ජා කර එම මුදල් නැවත මෙහෙට ගෙන්වා ගන්න.මෙය අත්‍යවශ්‍ය කරුණක්. ගම විකිණේන්න යන්නේ , නගරය විකිණේන්න යන්නේ . මේ මුදල් ටික අපට ලබා දෙන්න. අපි ගරු මන්ත්‍රීවරු 21ම වුණත් පැමිණේන්නම් ආණ්ඩුකාර කාර්යාලය වටලන්න.මේ කටයුත්ත වෙනුවෙන්. නමුත් මෙය නිදහස් කිරීමට අපි අත ඔසවන්නේ නැහැ.එය අපට කරන්න පුළුවන් දෙයක් නෙමේ. එය හරියට අපි අම්බලන්ගොඩ නගරය විකුණන වගේ වැඩකි. එයට අපට ජනතාව බලය දී නැත.මේගැන මා කතා කරන 6වෙනි වතාව මේ ගරු සභාවේ.එම නිසා මෙය බේරගැනීමටයි අප උත්සාහ කළ යුත්තේ.මෙය දෙන්න නෙමේ. මා එක තැනකදි එකඟවෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය ගත්තාත් මෙය පිටරටකට දෙන්නේ නැහැනේ.මෙහි සංවර්ධන සැලසුම් සඳහා තමයි මෙහි සැලසුම් හදනු ලබන්නේ.අපිට අවශ්‍යනම් නාගරික සංවර්ධන අධිකාරිය එකඟ වෙනවා නම් මේ දස අවුරුදු සැලැස්ම අනුව මේ භූමිය සංවර්ධන කටයුතු සිදු කරනවා කියා. අන්න අපි දුන්නාට කමක් නැහැ. ඒ අය වගකීමක් අරගන්නවානේ. දැන් අපි කළත් කරන්නේ දස අවුරුදු සැලැස්මට අනුව මෙය සංවර්ධනය කරන එකනේ.ඔබතුමාම දන්නවානේ කුලරත්න විද්‍යාලයට අක්කර 05 ½ ක භූමි භාගයක් වෙන්කර දී තිබෙනවා.ඊළඟට ධර්මාශෝක විද්‍යාලයට අක්කර 10ක ක්‍රීඩා පිටියක් වෙන්කර තිබෙනවා.මේවා නාගරික සංවර්ධන අධිකාරියට යවා තිබනවා . මේ දස අවුරුදු සැලැස්මේ තිබෙන දේවල්.සිංහ ක්‍රීඩාංගණයට අක්කර 14ක් වෙන්කර තිබෙනවා ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය සඳහා. මේ පොදු කටයුතු.දස අවුරුදු සැලැස්ම

සොයාගෙන බලන්න. නගර සභාවේ තිබෙනවා දස අවුරුදු සැලැස්ම.එහි තිබෙනවා මේ සියල්ලම.මේවා නාගරික සංවර්ධන අධිකාරියට යවා තිබෙන්නේ.එම නිසා අපේ පැත්තෙන් නගර සභාව පැත්තෙන් ඉතිහාසයේ මේ කරුණාව සිදු වෙලා තිබෙනවා.මේ වන්දි ඉල්ලන නිත්‍යානුකූලව සියයට සියයක්ම මේ වන්දි මුදල් හිමි. ඒ අයටවත් වන්දි ගෙවීම අපගේ යුතුකමක් හා වගකීමකි.ඒක තමයි ප්‍රාදේශිය ලේකම්තුමියට තිබෙන ප්‍රශ්නය.එය හරි එයට අපි මුහුණ දිය යුතුයි. ඒ සංවර්ධනය සඳහා දෙනු ලබන මුදල් එහේට යෙදවීම ඉතාම කලෝචිතයි.නැතිනම් මේ දේපල බේරගන්න බැරි වෙනවා.අපිට තිබෙන එකම භූමිය. බලපිටිය ප්‍රාදේශිය සභාවෙන් හෝ රත්ගම ප්‍රාදේශිය සභාවෙන් වත් අපට භූමි ලැබෙන්නේ නැහැ.එතකොට මොන නගර සභාවද තමන්ට දෙන භූමිය දෙනු ලබන්නේ.බිම් අඟලක් ගන්න පුළුවන්ද ?බලපිටිය ප්‍රාදේශිය සභාවේ මායිමට ප්‍රශ්නයක් වී ගරු බලපිටිය ප්‍රාදේශිය සභාවේ එවකට සිටි සභාපති සරත් සමරජීව මහතා පිස්තෝලයක් රැගෙන ගරු ජී.එම්.එස්. සිල්වා මහතාගේ කාලයේ පැමිණියා එය විසඳා ගැනිමට.එහෙමයි ඒවා විසදෙන්න ගියේ.ඊළඟට රත්ගම ආසනයට තිබෙන දෙල්දූව . අම්බලන්ගොඩ ආසනයට දෙනවාද ? නැහැ.ඌරවත්තේ ජනතාව පළාත් සභා නිර්න කමිටුවේදී මගෙන් දහවතාවකට වඩා ඉල්ලා සිටියා ඌරවත්ත අම්බලන්ගොඩට ගන්න කියා.එහෙම දෙන්නේ නැහැ. ජනතාවට අවශ්‍යතාවය තිබුණට සභාවක් විදියට ඒ මන්ත්‍රිවරු කැමති වෙන්නේ නැහැ. එහෙමනම් ඇයි අපේ භූමි ප්‍රමාණය නොසලකා හරින්නේ.මෙය හදවත.මෙය අත්‍යවශ්‍යයන්ම තබා ගත යුතුයි.මා ගරු මන්ත්‍රිවරුනගෙන් ඉල්ලා සිටින්නේ අපි එකා වගේ මෙය ආරක්ෂා කර ගැනිමට පෙළ ගැසෙන්න. ඒ වගේම ඔබතුමාට යුතුකමක් තිබෙනවා පළාත් සභාවෙන් අපට ලැබිය යුතු මුදල් ටික ගරු ආණ්ඩුකාරතුමාට කියා දැනට අඩු වශයෙන් මින් 25% ක්වත් ප්‍රාදේශිය ලේකම් තුමියට නිදහස් කිරිම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>.

ගරු සභාපතිතුමනි, මා මිට කලින් කථා කළ අපගේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනා සමඟ එකඟ වෙනවා.විශේෂයෙන්ම ගරු රාහුල මහතා ප්‍රකාශ කළ ආකරයට මේ වනජීවි කලාපයට නම්කිරිම අපට වඩා නගරයේ සිටින ජනතාව දුක්වෙනවා. කනගාටු වෙනවා මේ සම්බන්ධව. මොකද මෙය ඉතාම අසාධාරණ විදියට ගැසට් නියෝගයක් දුන් ගැසට් එකක්. අම්බලන්ගොඩ කලාපය තුල වනජීවි කලාපයක් ලෙස නම්කර තිබෙන්නේ.ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා ප්‍රකාශ කළ ආකරයට මෙහි කුරුලු වර්ග 87ක් සිටින බවට තමයි නම්කර තිබෙන්නේ.මට මතක විදියට . මමත් ඔය මාර්ගයේ දිනකට තුන් හතර වතාවක් එහාට මෙහාට යනවා. මානම් දැක නැහැ කබරගොයෙකු , දිය නයෙකු හැර වෙනත් සත්වයෙකු දැක නැහැ. එය වනජීවි කලාපයක් කිරිමට.මේ ප්‍රදේශයේ වෙන දෙයක් සිදු කළත් වනජීවි එකෙන් දුවවිත් තමයි බලන්නේ. අද දුම්රිය ස්ථානය, බස්නැවතුම්පොළ ආදිය අයිතිවී තිබෙන්නේ වනජීවි කලාපයට.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>.

ගරු උපසභාපතිතුමනි මට බාධා කිරිමක් කරන්න සිදු වෙනවා. හල්වතුර සම්බන්ධයෙන් සාකච්ඡාවක් කර තිබෙනවා 2018.09.11 වන දින පස්වරු 2.30 ට නගර සභාවේදි.ගරු රාහුල මහතා ප්‍රකාශ කළ ආකාරයට. එයට සහභාගි වි තිබෙනවා මා, ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා ,තුෂාරි දිසානායක නාගරික සංවර්ධන අධ්‍යක්ෂක, ශිරෝමා රංජනි සැලසුම් නිලධාරි ( නාගරික සංවර්ධන අධිකාරිය )මල්කාන්ති නගර සභා සංවර්ධන නිලධාරි , රසිකා පෙරේරා ( ඉඩම් අත්පත් කර ගැනිමේ නිලධාරි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය , අම්බලන්ගොඩ) ඉනෝකා ඉඩම් නිලධාරි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය , අම්බලන්ගොඩ) අබේකොන් ( නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ) බි.ඒ ධම්මිකා( ලේකම් නගර සභාව අම්බලන්ගොඩ ) ඩී. කොඩිකාර ( නාගරික මන්ත්‍රි )එම්.ඩබ්. රාහුල ලලිත වික්‍රම ( නාගරික මන්ත්‍රි )යන අය පමණයි සහභාගි වි ඇත්තේ මේ සාකච්ඡාව සඳහා. ඒ සියළුම නිලධාරින් සමඟ තින්දුවක් ගැනිමට අපගේ ගරු මන්ත්‍රිවරු සිටියේ නැහැ.එම නිසා ඒ අය සාකච්ඡා කර ගියා.ඒ කියන්නේ නාගරික සංවර්ධන අධිකාරයේ අධ්‍යක්ෂක පවා සිටියා. අපි මේ සඳහා සියළුම ගරු මන්ත්‍රිවරුන්ට ආරධනා කළා.මෙහිදි යෝජනා වුයේ එය නෙමෙයි. බස්නාහිර පළාත් අමාත්‍යාංශය මඟින් යෝජනා වි තිබෙනවා මෙය ගොල්ෆ්

ක්‍රීඩාංගණයක් සඳහා බදු දීමට. අපි මෙයට මුදල් ගෙවන්නේ නැතිනම් ඒ අය කැමතියි මුදල් ගෙවා ගොල්ෆ් ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට බදු දීමට . ඒ යෝජනාව තමයි මෙහිදි සාකච්ඡා වුයේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ ආකාරයට කොළඹ සීතල කාමරවල සිට හඳනු ලැබු ගැසට් පත්‍රයක් තමයි අම්බලන්ගොඩ නගර සභාව තුළ ක්‍රියාත්මක වන්නේ.ඒ අයට මේ ඉඩම් වල පරම්පාරිකව සිටි අය මේ ඉඩම් අයිති පුද්ගලයන් ගැන වැඩක් නැහැ. විශේෂයෙන්ම තල්ගස්ගොඩ ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් කිහිපයක් මේ වනජීවි කලාපයට අයිති බව පවසා ඇත. මේ වන විට ඔවුන් නඩු දෙකක් විතර දමා නඩු දෙකම වනජීවි දෙපාර්තමේන්තුව පරාදයි. තවත් නඩු දෙකක් විතර යනවා දැන්.දැන් විශාල ගැටළුවකට මුහුණ දී තිබෙනවා. එතුමා ප්‍රකාශ කළ ආකාරයට එක්තරා කාලයක හිටපු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් කිව්වට නැහැ. හිටපු ගරු අමාත්‍ය පාඨලි චම්පික මැතිතුමා තමයි මෙය ගැසට් කරනු ලැබුවේ. මා දන්නා විදියට එතුමා තමයි ගැසට් කරනු ලැබුවේ වනජීවි කලාපයක් කියා. මෙයට මේ ප්‍රදේශයේ එක්තරා එන්ජීඕ කණ්ඩායමක් හා ගරු ස්වාමීන් වහන්සේ නමක් සම්බන්ධවෙලා තමයි මේ කටයුත්ත සිදු කරනු ලැබුවේ. මේක ලොකු අසාධාරණයක්. මේ සඳහා අප සියළු දෙනාම එකතු විය යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය හංගන්න ඕන නැහැ. මෙය කරනු ලැබුවේ විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේ විසින්. උන් වහන්සේ තමයි මේ ගැසට් නිවේදනය ගෙනවිත් මෙය නතර කිරිමට මුල් වුණේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙයට ඉඩදෙන්න හොඳ නැහැ. මට අද හරි සතුටු දිනයක්. විශේෂයෙන්ම මේ ගරු මන්ත්‍රීවරු සියළුදෙනාම මෙයට එකඟ වි සිටින්නේ. මෙහි විශාලම අසාධාරණය සිදු වි තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාවට . අර පැත්තෙන් රත්ගම මේ පැත්තෙන් බලපිටිය , කරන්දෙණියත් හසු වෙලා තිබෙන්නේ. කරන්දෙණියෙත් කොටසක් හසුවි තිබෙන්නේ. ඒ සියළු කොටස්වලට අසාධාරණය සිදු වි තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාව. මේ නගරය සංවර්ධනය වෙන්නේ ඇතුළට. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි ටික දුරයි මේ නගරය තිබෙන්නේ. කිලෝමීටරයක් වැනි. මෙය සංවර්ධනය වෙන්නේ ඇතුළට. එය වනජීවි කලාපයක් ලෙස නම්කර තිබෙනවා.එම කලාපයට අපගේ බස්නැවතුම්පොළ හා දුම්රිය දෙපාර්තමේන්තුව ඇතුළත් වෙලා තිබෙනවා.මේ සඳහා මිනුම් කටයුතු කොහේ සිට ගෙන අත්ද කියා එයින්ම පෙනෙනවා. ගරු සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි අපි මෙයට කතා කර ඉඳලා වැඩක් නැහැ. අපි මේ සඳහා නැගිටිය යුතුයි. මෙයට එකට එකතුවෙලා කැරලි ගැසුවේ නැතිනම් මින් ඉදිරියට අපිට මීටවඩා ගැටළුවකට මුහුණ දෙන්න වෙනවා. අප සියළු දෙනාම එකතුවෙලා මේ අසාධාරණ ගැසට් එකට ක්‍රියාත්මක විය යුතු බව ප්‍රකාශ කර සිටිනවා.මේ සඳහා අපගේ රජයක් නෙමේ තිබෙන්නේ. මෙතුමාලාගේ රජයක් තිබෙන්නේ. ඔහු ප්‍රකාශ කළා මේ සඳහා සම්පුර්ණ සහායෝගය ලබා දෙනවා කියා. අප සියළු දෙනාම එකතු වි ගොස් මේ පිළිබඳ සත්‍ය තත්ත්වය ගරු ඇමතිතුමාට පහදා දෙන්න. මේ සඳහා අපි හැමදෙනාම සහභාගි වෙන්න. එහෙම නොවුණොත් අප සියළු දෙනාට වන්නේ මේ පොඩි ඉඩකඩ ප්‍රමාණයේ මේ ගැටළුවට මුහුණ දිමට සිදු විමයි. මා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා සමඟ එකඟ වෙනවා. සමහර වේලාවට ගරු සභාපතිතුමාගේ ආසනයේ වාඩි වු විට ඉදිරියෙන් පෙනෙනු ලබන්නේ කුණු ගොඩකි. මා දින ගණනාවක් ප්‍රකාශ කර සිටියා. එයට පිළියමක් නැතිබව තමයි පෙනෙන්නේ. එම නිස තමයි අප මේ භූමියෙන් යා යුතුයි. හැම දෙනම ගෙනවිත් දමන්නේ මෙතැන. නිලධාරින්ට දොස් කියා වැඩක් නැහැ. ඒ අයගේ වගකිමක් වි තිබෙනවා මොනවා හරි කැඩිච්ච කැල්ලක් හරි මෙතැනට ගෙනවිත් දැම්ම.රජයේ සේවකයන් නිසා මොනවාහරි තත්ත්වයක් ඇතිවුවහොත් ඉන් මිදෙන්න බැරි නිසා තමයි ඔවුන එසේ කරනු ලබන්නේ. අප සියළු දෙනාම එකතුවෙලා මීට පිළියමක් යෙදිය යුතුයි. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අප මෙය හැම සභාවකම කතා වෙනවා. ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අප සියළු දෙනාම

එකතුවෙලා ගොස් විෂයභාර ගරු අමාත්‍යතුමා මුණ ගැසී කතා කළ යුතුයි. මා හිතන්නේ ගරු ජනාධිපතිතුමා තමයි සිටින්නේ විෂය භාර අමාත්‍යතුමා ලෙස. අප සියළුදෙනාම එකතුවී මෙය නිදහස් කර ගැනීමට පෙළ ගැසෙන ලෙස ඉල්ලා සිටිනවා.

- පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි මෙය හැමදාම කතාවට තබා ගන්නේ නැතිව අද අපි මුළු සභාවම මෙය ඒකමතිකව සම්මත කරන්න.මෙය යෝජනාවක් විදියට මා යෝජනා කරනවා මේ සභාවට . දෙවැනි කරුණ නම් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ , දුම්රිය ස්ථානය ඔය කලාපයට අයිති නම් කුමන කතාද ? මේ සඳහා සිතියමක සලකුණු කළ යුතුයි මෙන්න අම්බලන්ගොඩ වනජීවි කලාපය. ඉන් රතුපැනකින් සලකුණු කරන්න අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ හා දුම්රිය ස්ථානය. එතකොට අම්බලන්ගොඩ සිටින්නේ සත්තු නෙමේ. හොඳ බුද්ධිමත් ජනතාවක්. මේ බුද්ධිමතුන් සිටින මේ නගරය හැල්ලුවට ලක් කිරිම ගැන බලවත් අප්‍රසාදය පළ කරන්න.මෙය සිතියමක ලකුණු කර ඒකමතිකව සම්මත කර හරියට ලිඛිතව මේ කරුණු ලියා මේ අම්බලන්ගොඩ නගරයේ සංවර්ධන කටයුත්ත සඳහා මේ භූමියේ තිබෙන වැදගත්කම , මේ සීමිත භූමි ප්‍රමාණයේ අම්බලන්ගොඩ බල ප්‍රදේශය පවත්වාගෙන යාමට තිබෙන නොහැකියාව යන මේ සියළු කරුණු එකතු කර ලිපියක් හදන්න. ඔබතුමා ඔය ටික සුදානම් කරන්න. ජනාධිපතිතුමා ලංකාවේ සිටින කාලය තුළ ඔබතුමා මෙය සඳුදා හැදුවොත් ජනාධිපති කාර්යාලයේ සිටින අධ්‍යක්ෂක මගේ මිත්‍රයක් මා එතුමාට කතා කරන ගරු ජනාධිපතිතුමාට කතා කර මේ සඳහා දිනයක් වේලාවක් වෙන්කර ගන්නම්.ඔබතුමා, ගරු උප සභාපතිතුමා,ගරු නගර සභා මන්ත්රි රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා, මා හා අපි කොටසක් සියළුම පක්ෂ නියෝජනය වන පරිදි කොටසක් ගිහින් ජනාධිපතිතුමා මුණ ගැසී එතුමාට ප්‍රකාශ කර සිටිය යුතුයි මේ භූමිය නිදහස් කර අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනිමට කටයුතු කළ යුතු කර දෙන ලෙස. පලමු පියවර ගත යුතුයි. දෙවැනි පියවර ගරු චම්පික රණවක මැතිතුමා මුණ ගැසී නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙය සම්පූර්ණයෙන් නිදහස් කිරිමට ඔබතුමාට සහායෝගය ලබා දෙන්නම්. මේ භූමි ප්‍රමාණය අපි ලබා ගත යුතුයි. පළාත් සභාවෙන් ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසී මුදල් ගෙවා මෙය නිවැරදි කර ගන්න.මේ වසර තුල අපි එක අරමුණක් ඇති ව වැඩ කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ සඳහා අපි කතාව නොමැතිව ක්‍රියාවෙන් වැඩ කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

ගරු ඩෙනට් පනියන්දුවගේ මහතා කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මේ කාරණය ගැන අපි කලිනුත් කතා කළා.මා එදා එයට විරුද්ධව කතා කළා.වෙල් ගොඩ කිරිමට මා එකඟ නැහැ.බස්නැවතුම්පොළ , දුම්රිය ස්ථානය වනජීවි කලාපයට ලකුණු කර තිබෙන එක නොගැලපෙන කාරණයකි. මා එදත් පැවසුවේ හදිසි ජල පහාරයක් වර්ෂාපතනයකදි ධාරා ගැනිමේ ටැංකිය ලෙස තමයි මේ වෙල්යාය තිබෙන්නේ.ස්භාව ධර්මයෙන් සැදුනු දේවල්. අපි ඒවා වෙනස් කරනවා නම් ඒවා නගර නිර්මාණ ශිල්පින් හරි ඒ පිළිබඳව දැනුවත්ව කළ යුතු දෙයකි.සැලසුම් සහගතව කරන්න ඕන දෙයකි.මේවා පැවතුනේ වගා භූමි හැටියට. මොකක් හෝ කරුමයක් නිසා මේවා අතහැර දමා තිබෙනවා. අද රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ කාර්මික හා කෘෂි කර්මික දියුණු කිරිමේ වැඩපිළිවෙළකි. මේ සභාවේ බහුතරයගේ කාරණය වෙනත් කටයුත්තක් බව තමයි මට පෙනෙන්නේ. මා ඔවුන් හා ගැටෙනවා ම නෙමේ. නමුත් මාගේ ස්වාධින අදහස මා මේ අවස්ථාවේදි ඉදිරිපත් කරනවා.පක්ෂයේ අදහසත් සමඟ. මේවා අපි ගොඩකරත් එක පැත්තකින් බලන විට සාධාරණයි. අනෙක් පසින් බැලූ විට මේ ගොල්ෆ් ක්‍රීඩාංගණ ඉදිකරන එක අපට ගැලපෙන ඒවා නෙමේ.ඒවා මානසික අබාධ ඇති පුද්ගලයින් ඉදිරිපත් කරන අදහස් ලෙස තමයි මට පෙනෙන්නේ.මා ප්‍රකාශ කරනවා ක්‍රිකට් ක්‍රීඩාංගණ වුණත් අපට තිබෙන පලමු ප්‍රශ්නයද ජාත්‍යාන්තර ක්‍රිකට්

ක්‍රිඩාංගණ ඉදිකිරිමද ? අපගේ බහුතර ජනතාවට ජීවත් වීම සඳහා සටනක් කරන්න වෙච්ච වේලාව.එම නිසා මේ යෝජනා කොයිතරම් දුරට සාධාරණ කියන එක පිළිබඳ මට ගැටළුවක් තිබෙනවා.යම් වෙනසක් සිදු කරනවා නම් පරිසර හානියක් සිදු නොවි ඒ අකාරයට සිදු කරයි කියා බලාපොරෝත්තු වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>.

ඔබතුමලාගේ කරුණු කෙසේ වෙතත් මා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාගේ කතාව සමඟ යම් එකඟතාවයකුත් තිබෙනවා. අම්බලන්ගොඩ නගරය අක්කර 248 ක් මේ ව්‍යාපෘතියට පවරා ගැනිමේදි නගර සැලසුම් කරන විදාඥයන් තමයි මේ සැලුම සාදා තිබෙන්නේ.අපේ නගර සභාවේ සැලසුම තිබෙනවා. කියවන්න පුළුවන්.ඒ සැලසුම සාදා ඒ සැලසුමෙන් ජලය යටවන ප්‍රමාණය යටවන ප්‍රමාණය කොපමණද කියා සංඛ්‍යා ලේඛණ ගත කර එයට ජලය රැස්කරන ස්ථාන හතරක භූමියක් වෙන්කර තිබෙනවා වැව් වශයෙන්. ඒවා කර තිබෙන්නේ පිළිවෙළින් . මේ පවරා ගැනිම කරනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂයේ කාලයේදි.එහිදි වරිමාර්ග පද්ධතිය සකස් නොකර තමයි මේ වෙල්ටික ගොඩ කිරිම ආරම්භ කළේ. එම නිසා අක්කර 30ක් විතර ගොඩකරන විට අම්බලන්ගොඩ නගරයට ගංවතුර තර්ජනය පැමිණිමේ කාරණයක් වුවා. හැබැයි මේය සැදු විශේෂඥ කණ්ඩායම ගංවතුර වැලැක්වීමේ යම් පියවර රාශියක් මෙහි තිබෙනවා. ඔබතුමලාට බලන්න පුළුවනි. ඒ පියවර අනුගමනය කරන්නේ නැතිව මෙහි ලාභ ලැබෙන මුදල් ලැබෙන පැත්ත විතරක් අනුගමනය කරනු ලැබුවේ. එහිදි ජනතාවට වන අවහිරතාව බැලුවේ නැහැ.මෙහිදි මා දකින කරුණ නම් අම්බලන්ගොඩට ඉඩපහසුකම් සලසා ගැනිමට අත්‍යවශ්‍ය කරුණක් අවශ්‍ය වෙනවා.මේ අම්බලන්ගොඩ මුළු නගර සීමාව තිබෙන්නේ වර්ග කිලෝමීටර් 1.74ක් තිබෙන්නේ. එම 1.74නුත් 40% ක් 45% ක් තිබෙන්නේ වගුරු බිම්. අපි නගර සභාව යම් දියුණු මට්ටමකට ගන්නවානම් මේ යම් කොටසකට ගත යුතුයි.මේ සියළු ඉඩම් පිරවිම කියන අදහසට මා එකඟ නැහැ.මා පෞද්ගලිකව එකඟ නැහැ. ගරු සභාවක් විදයට දරනවානම් කමක් නැහැ.විද්‍යාඥ ක්‍රමයක් යටතේ කරන වානම් එයත් ගැටළුවක් නැහැ. අපි මේ පිළිබඳව සාකච්ඡා කර මෙය අද ඊයේ ගත් තීන්දුවක් නෙමේ. ගරු හිටපු සභාපති ජී.එම්. ද සිල්වා මහතාට වත් එක්සත් ජාතික පක්ෂයටවත් උවමනාවකටවත් ගත් තින්දුවක් නෙමේ. එම පොත බැලු විට අපට පැහැදිලි වෙනවා.මෙය සාදා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ. මෙය හදන විට මේ සාදා විශේෂඥ දැනුම තිබෙන පුද්ගලයින් ගොඩක් එකතු වෙලා තමයි මේ පරික්ෂණය සිදු කර තිබෙන්නේ.ඒ අනුව තමයි මේ අත්පත් කර ගැනිම කර තිබෙන්නේ.එම නිසා මේ අත්පත් කර ගැනීමේ යම් යම් කොටස් තිබෙනවා. ඇත්තටම ඉෂ්ඨ කළ යුතු දේවල් තිබෙනවා නගරය වෙනුවෙන්. සමහර කොටස් අපට නිදහස් කරන්න පුළුවනි.අපි අක්කර 14ක ප්‍රමාණයක් වෙන්කරනු ලැබුවා ක්‍රිකට් ක්‍රීඩාංගණයක් සඳහා අක්කර 14ක් වෙන්කරනු ලැබු වේලාවේ අපි පස් පුරවන්න හැදුවේ අක්කර 09ක් පමණි.අක්කර 05ක වැවක් අපි හැදුවා.පොල්වත්ත ප්‍රදේශයේ දැනට අක්කර 05ක වැවක් නිර්මාණය කර තිබෙනවා.එම වැව හැදුවාට පසු පොල්වත්ත ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය මග හැරුනා. නැතිනම් සමාන්‍ය වර්ෂාපතනයකදි යටවන එක නැවතුනා.එම නිසා අපට අවශ්‍ය පරිදි මෙය විද්‍යාඥයින් එදා දක්වපු පරිදි නෙමේ අද අපට ගමට අවශ්‍ය පරිදි සකස් කළ යුතුයි. මා පොල්වත්ත ප්‍ර දේශයේ තිබෙන පොඩි පාලමේ සිට මහ පාලම දක්ව ඇති අක්කර 50ක පමණ කොටසක් . එයට මා දැනට සැලසුමක් නිර්මාණය කරගෙන යනවා කඩෝලාන උද්‍යානයක් වශයෙන් සංවර්ධනය කිරිමට. ඒ කියන්නේ ගොඩ කිරිමට නෙමේ. මේ තියෙන ප්‍රදේශයම ජනතාවට ගිහින් රස විදින්න. වැහි වතුර ටික එතනට ගිහින් ගොඩ වෙන්න. පිරෙන්න. ජනතාවට උද්‍යානයක් වශයෙන් භාවිතා කරන්න. මේ දිනවල යෝජනාවක් සකස් කරගෙන යනවා. ඒ වගේ අලුතින් අප සිතිය යුතුයි.සියළු දේවල් ගොඩකරනවාට වඩා යම් යම් දේවල් කොටස් පරිසරයට ඉතිරි කළ යුතුයි.ඇත්තටම අවශ්‍යයි. මෙහි ගොඩනැඟිලි ඉදිකළ නගරයක් නෙමේ අවශ්‍ය වන්නේ. හරිත නගරයක්.වනාන්තර පිරුණු නගරයක් බවට පත් කළ හැකි නම් ඇත්තටම අපිට හොඳයි.ඒ ඉඩමේ ප්‍රමාණය තිබෙන්නේ ඔය ඉඩමේ ප්‍රමාණයමයි. ඇත්තටම වෙන ගස් කොළන් තිබෙන තැන් නැහැ.මේ පිළිබඳව සාකච්ජා කර මේ වනජීවි කලාපයේ ගැසට් පත්‍රයත් වෙනස් කර ගනිමු. මේ සම්බන්ධව දැනට තිබෙන ප්‍රශ්නය ගැන ප්‍රාදේශිය ලේකම්තුමියත් , නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමාත් සමඟ සාකච්ජා කර යම් තින්දුවකට එළඹීම සුදුසුයි.මුලින්ම මා යෝජනා කරනවා මා සමඟ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා , නගර සභා මන්ත්‍රී රාහුල මහතා, නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා ගරු උප

සභාපතිතුමා ඇතුළු ඉහත නිලධාරින් සමඟ යම් එකඟතාවයකට පැමිණිය යුතුයි.මේ ඉඩම් තුළ අපි අනවශ්‍ය කොටසතුත් ඇතුළත් කර තිබෙනවා.සමහර ඒවා සභාවටත් අවශ්‍ය නැහැ. ඒ වා ඇත්තටම හිසරද වු කොටස්. උදාහරණයක් ලෙස මහ අම්බලන්ගොඩ ඔය හගත් සමඟ ඇති කොටස් ටික කිසි වැදගත්කමක් ඇති බව පෙනේනනේ නැහැ. එහි දැන් බලෙන් පදිංචි වෙලා පදිංචි වි නගර සභා මන්ත්‍රි නිලානි මෙනවිය කියන පරිදි ඔප්පු ටික පමණයි. ඒ අයට අපි වන්දි ගෙවා ඔප්පු දෙනවාද ? මොකක්ද කරන්නේ කියන එක අප තින්දු කළ යුතුයි.ලේකම්තුමියණනි මේ සම්බන්ධව ප්‍රාදේශිය ලේකම්තුමිය , නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමා.මේ සම්බන්ධව සියළුම ගරු මන්ත්‍රිවරු පැමිණිමට කැමති නම් ඔවුන් සියළු දෙනාමත් සමඟ සාකච්ඡාවක් සුදානම් කරන්න. පසුගිය වතවේ සහභාගි වුයේ ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා හා ගරු නගර සභා මන්ත්‍රි පේෂලා මහත්මිය පමණයි සහභාගි වුයේ. මේ වාර්තාවේ තිබෙනවා. ඔබලා හැමදෙනාම පැමිණිය යුතුයි.පැමිණ තමන්ගේ මතය ප්‍රකාශ කරන්න.එහෙනම් සියළුම ගරු නගර සභා මන්ත්‍රිවරු සහභාගි කරවන්න.

**තීරණය**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් යොමුකරන ලද අම්බලන්ගොඩ , හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්පත් කරගන්නා ලද ඉඩම්වලට ගෙවිය යුතු වන්දි මුදල් නිදහස් කිරිම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමා , ප්‍රාදේශිය ලේකම්තුමිය , සියළුම ගරු මන්ත්‍රිවරුන් සමඟ සාකච්ජාවක් පවත්වා එකඟතාවයකට පැමිණිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.03 පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ග්‍රාම නාමකරණය හා විථි නාමකරණය කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

- ✓ **පෙරවරු 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මි හේමන්තා මෙනවිය සභාවට පැමිණිම**
- ✓ **පෙරවරු 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා සභාවෙන් නික්ම ගියහ.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් යොමුකරන ලද ග්‍රාම නාමකරණය හා විථි නාමකරණය පිළිබඳවයි. උක්ත කරුණ සම්බන්ධයෙන් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ විසින් මා වෙත යොමු කරන ලද අංක PL/7/10/4/2 හා 2019.05.27 දිනැති ලිපිය හා බැදේ.ඔබ දන්නා පරිදි දැනට පවතින විධිවාධාන යටතේ ග්‍රාම නාමකරණය පිළිබඳ කටයුතු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ද විථි නාමකරණය පිළිබඳ කටයුතු ඒ ඒ පළාත් පාලන ආයතන විසින් ද සිදු කරයි. ගමක නමක් වෙනස් කර අලුතින් නමක් යෙදීමේ දි මෙන්ම විථියක නමක් වෙනස් කිරීම හෝ අලුතින් නමක් යෙදීමේ දි ඒ ඒ ප්‍රදේශවල ශ්‍රී සංස්කෘතික පදනම හා ඓතිහාසික පුරා වෘත්ත සැලකිල්ලට ගෙන එම නම් යෝජනා කිරිම කෙරෙහි අවධානය යොමු කිරිම අත්‍යාවශ්‍ය සාධකයක් බවත් , ඇතැම් පළාත් පාලන ආයතන විථි නාමකරණයේදී ශ්‍රී ලාංකීක සංස්කෘතික පසුබිමට කිසිසේත් අදාළ නොවන පරිදි නම් යෙදිම සිදු කර ඇති බවත් , නිසි අනුමැතිය ලබා නොගෙන ග්‍රාම නාම ප්‍රසිද්ධ කර ඇති බවත්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/7/10/4/2 හා 2019.05.27 දිනෙන් සියලුම ප්‍රධාන ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් අමතන ලද ලිපියෙහි සඳහන් කර ඇත. එසේම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති රාජ්‍ය භාෂාව හා ජාතික භාෂාවෙන් පමණක් සෑම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවල ගොඩනැගිලි හඳුන්වන නාම පුවරු , ග්‍රාම පුවරු . විථි නාම පුවරු සඳහා භාවිතා කළ යුතු බවත් , රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති උපදෙස් අනුව සිංහල , දෙමළ හා ඉංග්‍රිසි භාෂා හැරුණු විට වෙනත් විදේශිය භාෂාවන් මේ සඳහා යොදා ගෙන තිබේ නම් ඒවා නිත්‍යානුකුල නොවන බවත් දැනට ක්‍රියාත්මක රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අනුමත

භාෂාවෙන් හැරුණු විට වෙනත් භාෂාවෙන් භාවිතා කර ගොඩනැඟිලි නම් කිරීම , ග්‍රාම නාම පුවරු ප්‍රසිද්ධ කර ඇත්නම් ඒවා නොපමාව ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ග්‍රාම නාමකරණය පිළිබඳ ප්‍රශ්නයක් නිසා තමයි අසන්නේ. අපගේ කෙරමිණිය - පින්නදූව පුස්තකාලය ඒ නම්කිරීමට ලක්වුණා. විරෝධතා කැඳවනු ලැබුවා.ඉදිරි පියවර ගැන ලේකම්තුමිය පැවසුවා ප්‍රකාශ කරන්නම් කියා. දැන් කොතනද ඒ නාමකරණය පිළිබඳ ගැටළුව හිර වී තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ලේකම්තුමියගෙන් විමසන්න. මා නම් ඒ ලිපි ගොණුව ගැන දන්නේ නැහැ.

- ✓ **පෙරවරු 10.15ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සභාවට නැවත පැමිණීම.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

කෙරමිණිය - පින්නදූව පුස්තකාලය ඒ ඉඩම් පරිත්‍යාගශීලියා නමින් නම් කරන ලෙසයි යෝජනා කරනු ලැබුවේ.දැන්වීම් පළ කළා. විරෝධතා කැඳෙව්වා. ඒවා අවසන් වුවා. නමුත් දැන් ඒ ගැන හාවක් හුවක් නැහැ. අපේ ඊළඟ ධූර කාලයට යයිද දන්නේ නැහැ . මෙහෙම යනවිට.

**තීරණය**

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් යොමු කරන ලද ග්‍රාම නාමකරණය හා වීථි නාමකරණය පිළිබඳ ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.04 දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනය මගින් අනාගාරික තිලකසේකර හිටපු මන්ත්‍රීතුමා නමින් පොදු ස්ථානයකට හෝ නගර සීමාව තුල මාවතක් නම් කරන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනය. අනාගාරික තිලකසේකර තිලකසේකර හිටපු මන්ත්‍රීතුමා නමින් පොදු ස්ථානයකට හෝ නගර සීමාව තුල මාවතක් නම් කරන ලෙස ඉල්ලා සිටීම. අම්බලන්ගොඩ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු පළාත් සභා අමාත්‍ය ගරු අනගාරික රයිටර් තිලකසේකර මැතිතුමා වසර 11ක් පුරාවට අම්බලන්ගොඩ පුරවරයට කරන ලද අමිල මෙහෙවර සුළු කොට තැකිය නොහැකි බව ඔබ තුමාද හොඳින් දන්නා කරුණකි. නගරාධිපති තුමනි, එතුමාගේ දේශපාලන ගමන් මහ පාට , පක්ෂ , කුල , මල බේද කිසිවක් තදින් අල්ලා ගෙන පලි ගැනීම් සහ තම මඩිය තර කරගෙන සැප සම්පත් විඳි දේශපාලකයෙක් නොවන බව අප හොඳින් දන්නා කරුණකි . මෙතුමාගෙන් සිදු වූ සුවිශේෂී මෙහෙවර වලින් ප්‍රධාන කිහිපයක් නම්, බද්දේගම සිට අම්බලන්ගොඩ , බලපිටිය පානීය ජලය ව්‍යාපෘතියද , අම්බලන්ගොඩ , කුලරත්න විද්‍යාලය, ගොඩහේන බස් ඩිපෝව ද , අඩු ආදායම් ලාභීන්ට නිවාස යෝජනා ක්‍රමයන්ද කිහිපයක් ක්‍රියාත්මක කර අම්බලන්ගොඩ නගර සීමාව තුළ , විශේෂ වැඩ පිළිවෙළක් වශයෙන් සමූපකාර මන්දිරය ආදී ව්‍යාපෘති ද රැකී රක්ෂා රාශියක් සපයා දීම ධීවර කාර්මිකයින්ට විශාල බෝට්ටු ප්‍රමාණයක් ලබා දී ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම ආදිය මෙතුමා විසින් සිදුකරන ලද යෝධ වැඩ පිළිවෙළ වේ. එබැවින් නාගාරාධිපතිතුමනි මෙවැනි සමාජ මෙහෙවරක් සිදු කළ නාගරික මන්ත්‍රීවරයෙකුගෙන් පටන් ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම අනගාරික ලෙස සඳහන් වන්නේ අම්බලන්ගොඩ ආසනය නියෝජනය කළ අනගාරික රයිටර් තිලකසේකර ශ්‍රී මතානන්ය. තවද මෙතුමා වෙනුවෙන් සිදුවිය යුතු , යුතුකමක් තාම අම්බලන්ගොඩ ආසනය තුල සිදු වුයේ නැත. මෙතුමාගේ ගුණ සුවඳ එසේ කාලයේ වැලිතලාවෙන් වැසී යාමට ඉඩ නොදී අප ඔබතුමාගෙන් ගෞරව පූර්වකව ඉල්ලා සිටින්නේ මේ කෘතහස්ථ දේශපාලඥයාගේ නම අම්බලන්ගොඩ නගර සීමාව තුල පොදු ස්ථානයක හෝ මාවතක් හෝ

නම්කරන ලෙසය. එබැවින් මෙම පුණ්‍ය කටයුත්ත අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස සලකා ඔබතුමා විසින් කඩිනමින් අවශ්‍ය පියවර ගෙන ඉටු කර දෙනු ඇතැයි අප සම්මේලනය හුදෙක්ම බලාපොරෝත්තු වන බව පවසා ඩී.ඩී. ද සිල්වා දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනයේ ලේකම් විසින් ලිපියක් එවා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු රයිටර් තිලකසේකර මැතිතුමා වැඩිපුර මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ දේශපාලන කටයුතු සිදු කරනු ලැබූ නිසා දොළොස්මහ ඉදලා ඒ මහ අම්බලන්ගොඩ පාර එතුමා නමින් නම් කරන ලෙස ඉල්ලීමක් කර සිටිනවා.මොකද එතුමා වැඩිපුර ජීවත් වුයේ මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ.සමහර ප්‍රධාන නගර වල ඒ ගමේ නමත් සමඟ පාරවල් නම්කර තිබෙනවා. ඒ ඒ නගරවල සිටි විද්වතුන් ඒ ඒ නගර වලට, ගම්වලට, සමාජයට කරන ලද මෙහෙවර අනුව පුද්ගලයින් නමින් ලංකාවේ ඕනතරම් පාරවල් නම් කර තිබෙනවා.සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය ඉල්ලා සිටින්නේත් එතුමාට යමක් කිරිම සඳහා . අම්බලන්ගොඩ සද්ධාසේන මාවත තිබෙනවා. එතුමාගේ නිවස ඉදිරිපිට පාර. අම්බලන්ගොඩ නියෝජනය කරන ලද පරණ අපේ මන්ත්‍රීවරුන්ගේ භේදයකින් තොරව එසේ තිබෙනවා.එම නිසා මා යෝජනා කර සිටිනවා මහ අම්බලන්ගොඩ පාර එතුමා නමින් නම් කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එහෙම අවශ්‍ය නම් යෝජනා වාරයේ යෝජනාව ගෙන එන්න.

- ✓ පෙරවරු 10.20 ට ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා සභා ගර්භයෙන් නික්ම ගියහ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මටත් වෙනත් යෝජනාවකුත් තිබෙනවා කරන්න. ගරු ටයිටර් තිලකසේකර මැතිතුමා ඇත්තටම අපි දේශපාලන මොන මතිමතාන්තර දැරුවත්, මොන පක්ෂයක සිටියත් එතුමා අගය කළ යුතු පෞද්ගලිකව මා අගය කරන චරිතයකි. හේතුව ඔය තිලකපුර ග්‍රාමය එතුමා විසින් තමයි නිර්මාණය කරනු ලැබුවේ. අපි කුඩා කාලයේ මට මතකයි බස්රථයක් යන්නෙත් ඉතාම කලාතුරකිනි.එහෙම තිබූ ඒ ප්‍රදේශය, අම්බලන්ගොඩ නගරයට ජලය සැපයිමට මුල් වුණේ, කුලරත්න විද්‍යාලය ඇතිකිරිම විශාල පිරිසකට රැකි රක්ෂා කටයුතු දීම ආදි කටයුතු වලට මුල් වුයේ එතුමායි. එතුමා පැමිණ අපේ සරත් ශ්‍රී ලාල් මහතාගේ බිරිඳගේ නිවසේ තමයි රැස්විම් පවත්වනු ලබන්නේ. අපේ නිවසේ තිබෙනවා වාමාංශික දේශපාලනය. කරුණාරත්න මහතා පැමිණ රැස්වීම් පවත්වන.එහෙම දේශපාලන අතිතයක් සමඟ හිටපු එතුමා අපේ විපක්ෂයේ හිටියත් අපට වඩා වෙනස් අදහස් හා මතිමන්තර දරන එතුමා මා පෞද්ගලිකවත් බොහොම අගය කරන පුද්ගලයෙකි. මොකද එතුමා හම්බකරගත් දෙයක් නැහැ. එතුමා රැකපු දෙයක් නැහැ. එම නිසා එතුමාව අගය කළ යුතුයි. එතුමා නිසා අද කුලරත්න විද්‍යාලය ජාත්‍යාන්තරය දක්වා ගිහිපු විද්‍යාලයක් බවට අද පත්වෙලා තිවෙනවා. අපේ ජනතාව අද වතුර ටික භිය නැතුව බොනවා. එය අපි අගය කළ යුතුයි. තිලකපුර ග්‍රාමයේ නිවාස නොමැති ඉඩම් නොමැතිව සිටි ජනතාව බොහොම වැදගත් විදියට අද ජීවත් වෙනවා. අම්බලන්ගොඩ ඩිපෝ එක කැලෑවක් වගේ තිබුණ ස්ථානය එතුමා තමයි පිළිසකර කර සකස් කරනු ලැබුවේ.1977 වර්ෂයේ එතුමා බලයට පත් වූ විට බොහෝ රැකියා ලබා දුන්නා.එම නිසා එතුමාට ගෞරවයක් ලෙස දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනය ගෙන එනු ලැබූ මේ යෝජනාවට මා ඉතා අගය කොට සලකනවා. මා යෝජනා කරනු ලබනවා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ගෙන එනු ලැබූ යෝජනාවට අමතරව අම්බලන්ගොඩ කුලරත්න විද්‍යාලය පිහිටි මාර්ගය එතුමා නමින් නම් කරන ලෙස. මහ අම්බලන්ගොඩ පාරේ ප්‍රශ්නයක් තිබෙන්න පුළුවනි. මොකද ඒ කාලයේ සිටම මහ අම්බලන්ගොඩ පාර කියා තමයි තිබෙන්නේ. 1948 සැලැස්ම මා නගර සභාවෙන් ගනු ලැබුවා . එතකොටත් තිබෙන්නේ මෙම මාර්ගය මහ

අම්බලන්ගොඩ කියා නම්කර.එය වෙනස් කරන එක හරි නැහැ .එතුමා විසින් කුලරත්න විද්‍යාලය බිහිකළ නිසා එම පාර නම්කිරීම සුදුසු බවට මා ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මට පොඩි කරුණක් මතක් කරනවා. මීට ඉස්සරහ ගරු සිරිනාවතී ද සිල්වා මැතිතුමිය නමින් නම්කරන ලෙස යෝජනාවක් පැමිණියා. මහ අම්බලන්ගොඩ කියන නම වෙනස් කිරීම පිළිබඳ විරෝධතාවයක් පැමිණියා. එතුමිය ඒ කාලයේ ප්‍රථම නගරාධිපතිතුමියයි. එතුමියත් මේ සභාවේ සිටියා. එතුමිය මිය යාමෙන් පසු තමයි එම යෝජනාව පැමිණියේ. ඒ යෝජනාවත් විරෝධතා මඟින් ප්‍රතික්ෂේප වුණා.මා හිතන්නේ මෙවැනි යෝජනාවක් විරෝධතා මඟින් ප්‍රතික්ෂේප කිරීමට ගෙන එම එතුමාට කරන අපහාසයකි. පෞද්ගලිකව අප එතුමා සමඟ එකතු නොවුණත් දේශපාලනික වශයෙන් එතුමා හොඳ මහත්මයෙක් හා ගමට වැඩක් කරන ලද මහත්මයෙක් වශයෙන් හඳුනා ගෙන තිබේ. එතුමා යම් ප්‍රතිපත්තියක් වශයෙන් තමයි යම්කිසි වැඩ කොටසක් කරනු ලැබුවේ. එතුමා සමඟ අපි අන්තිම කාලයේ බොහෝ සම්පව වැඩ කළා.1997 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයා වශයෙන් සිට මගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කළා. එම නිසා එතුමා කෙරෙහි ඇති ලෙන්ගතුකම , හිතවත්කම අදටත් තිබෙනවා.එතුමා ඒ කාලයේ ගෙයින් ගෙට ගිහින් එතුමාට විරුද්ධ පාර්ශිකයෙකුට වුණත් මට ඡන්දය දෙන්න කියා කිවුවා. එම නිසා අපි එම ගරුකිරීම හැමදාම පල කළ යුතුයි.එම නිසා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහත්මයාණෙනි , මෙය විවාදයකට නොගෙන තැනකට ගෙන යාම සුදුසුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා එකඟයි. ඇත්තටම හොඳයි කුලරත්න විද්‍යාලය පාර එතුමා නමින් නම් කිරීම. මොකද එතුමා ගොඩනගන ලද විද්‍යාලයෙකි එය.මා එකඟයි මෙතුමියගේ යෝජනාවට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ තිබෙන්නේ ලිපි ඉදිරිපත් කිරීමක්. මෙය යෝජනා යටතේ ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගෙනිය නොහැකි මිය නොහැකි වැඩ කළ මහ පුරුෂකයෙකුගේ නමක් අපට අමතක වෙලා. නමුත් මේ දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනය අප අවදි කළ මේ වේලාවේ සාර්ථක ලෙස එතුමාගේ නාමයට අවමානයක් නොවන පරිදි සුදුසු පරිදි නාමකරණයට ලක්කිරීමයි සුදුසු වන්නේ.එමනිසා අපි එක තීරණයකට පැමිණ එතුමාට ගෞරව කිරීමයි කළ යුතු බවයි ප්‍රකාශ කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙය යෝජනා වාරයේදි ඉදිරිපත් කරන්න.

**තීරණය**

දක්ෂිණ ලංකා බෞද්ධ සම්මේලනය විසින් හිටපු ගරු මන්ත්‍රී අනාගාරික තිලකසේකර මැතිතුමා නමින් මහ අම්බලන්ගොඩ පාර නම් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කළ අතර එතුමා නමින් කුලරත්න විද්‍යාල මාවත නම් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ඉදිරිපත් කළ අතර , ඒ සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා එකඟවූ අතර ,එය ජනා වාරයේදි ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.05 ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් සමෘද්ධි සහනාධාර ප්‍රධානෝත්සවය සඳහා පුටු 600ක් සහා අනුමතියට යටත්ව නොමිලේ හා ධර්මාශෝක විද්‍යාලයේ ශ්‍රවණාගාරයට ප්‍රවාහනය කර දෙන ලෙසත් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් සමෘද්ධි සහනාධාර ප්‍රධානෝත්සවය සඳහා පුටු 600ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එම පුටු ධර්මාශෝක විද්‍යාලීයිය තොමස් සිල්වා ශ්‍රවණාගාරයට ප්‍රවාහනය කරන ලෙසද ඉල්ලීමක් කර ඇත. මෙම ඉල්ලීම සහා අනුමතියට යටත්ව ලබාදීමට හැකි වුණා. එහිදි පුටු 300ක් පමණයි තිබුණේ.එම පුටු 300 ප්‍රවාහනය කර ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පුටු අඩුවක් අපට තිබෙනවා නේද? ඒ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කරන්නද දැන් ඉදිරිපත් කරන්නද ? දැන් මේ පුටු සම්බන්ධව බොහොම ලොකු ප්‍රශ්නයක් මතු වුණා. මේ ළඟදි දිනයක අප සේවකයෙකු මිය ගියා. ඒ අවස්ථාවේ මහ අම්බලන්ගොඩත් අවමංල්‍යයක් තිබුණා.තව පොල්වත්තෙත් මළ ගෙදරක් තිබුණා. එතකොට අපේ නගර සභා මන්ත්‍රි ජගත් කුමාර මහතා එක පුටු වගයක් දි තිබුණා. ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා තව පුටු වගයක් දි තිබුණා.අර අපේ වැඩකළ අහිංසක කම්කරුවෙකුගේ අවමංගල්‍යය උත්සවයට. මට ඇවිත් කිවු විට පුටු නැහැ. දෙන්න.බොහොම අසිරුතාවයකට පත් වුවා. මා ඔවුන්ට ප්‍රකාශ කර සිටියා බැනර් ගිහින් ගහන්න. පොල්වත්තේ මළගෙදර ඉවර වූ පසු පුටු 100ක් ලබා දෙන්නම් කියා එය තුලනය කළා.මා මේ අවස්ථාවේ මේ තිබෙන ප්‍රශ්නය අනුව යෝජනා කරනවා අපේ සභාවට පුටු 500ක් ලබා ගැනීම.මා යෝජනා කර සිටිනවා. ගරු ඩෙනට් පනියන්දූව මන්ත්‍රිතුමාගෙන් ඉල්ලා සිටිනවා අපට පුටු 500ක් ලබා දෙන ලෙස.මේ සම්බන්ධව සිටින නිලධාරින් කියා සිටින්න අපේ නගර සභාවට ප්‍රමුඛතාවය දි මේ කටයුත්ත සිදු කරන්න කියා. නැතිනම් හරි අසාධාරණයක් වෙනවා මහජනතාවට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි කටවත් පුටු දෙන්නේ නැහැ.කවුරුහරි ඇවිල්ලා තමයි පුටු ගෙන යන්නේ.කොඩ ගෙනියන්නෙත් ඔබලාමයි. එම නිසා අපි අතර විනය හදා ගත යුතයි. ඔබතුමිය පැමිණ පුටු 100ක් ලබා දෙන්න කිව්වාම මට දන්වන්නෙත් නැහැ. ඔවුන් ලබා දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් පුටු මදිනේ.එක මළගෙවල් 8ක් සිදුවුවහොත් අපට දෙන්න පුටු නැහැනේ.එකයි මා කියා සිටින්නේ පුටු 500ක් ලබා ගන්නා ලෙස. ගරු ඩෙනට් පනියන්දූව මන්ත්‍රිතුමාගෙන් ඉල්ලා සිටිනවා අපට පුටු 500ක් ලබා දෙන ලෙස . ඔබතුමාගේ ප්‍රතිපාදන වලින්.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

මා පාර්ලිමේන්තු මන්ත්‍රි කෙනෙක් නොවන නිසා කොපමණ මුදල් ලැබුණත් මට බැහැ පුටු වගේ දේවල් ලබා දෙන්න.නගරයේ සංවර්ධන කටයුතු සඳහා හැරෙන්න වෙන දෙයකට යොමුකළ නොහැක.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>

එසේ මා යෝජනා කර සිටිනවා අපට පුටු 500ක් ලබා ගන්නා ලෙස.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි එකවර නැතිව ක්‍රමයෙන් පුටු 500 ලබා ගන්න.මෙය සැරින් සැරේ.පුටු සියය, සියය ලබා ගන්න.ඇත්තටම මේ පුටු අනෙක් ප්‍රාදේශීය සභා ගෙන තිබෙනවා නම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. එය විසදෙනවා. හුඟාක් වෙලාවට අපිට වෙන ප්‍රශ්නයක් වන්නේ කොඩි කණු ඉල්ලන එක.බලපිටියේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඉල්ලා සිටිනවා ඔවුන්ට කොඩි ටික්ක ලබා දෙන ලෙස.ඇත්තටම ඒ වගේ වේලාවට නොදී බැහැ.ඉතිං අපට දෙන්න වෙනවා.ඒ සඳහා අදාල පළාත් පාලන ආයතනය යොමු වෙලා තිබිය යුතුයි.ඇත්තටම අපේ නගර සභාවේ මෙම වැඩ සටහන තිබුණට වෙනත් ප්‍රාදේශීය සභාවල මෙම වැඩසටහන එහෙම ලොකුවට නැහැ.අපි පුටු අරගෙන දෙන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මාත් ඔය ප්‍රශ්නයට මුහුණ පැවා.කරිත්ත කන්ද ප්‍ර දේශයේ මල ගෙදරක් තිබුණා. නමුත් එක පුටුවක්වත් දෙන්න බැරිවුණා.එක කොඩියක්වත් දෙන්න බැරි වුණා.මා නැගී සිටියේ කියන්න පොදුවේ ගරු මන්ත්‍රීවරු 21ටම පොදුවේ මල ගෙවල් සිද්ධ වෙනවා.මරණය අපට නවත්වන්න බැහැ.නිරන්තරයෙන් මරණයක් දෙකක් සිද්ධ වෙනවා.මේ කියන විදියට මේ අඩුවත් තිබෙනවා.අනෙක් කරුණ මා දකින අපගේ සේවකයන් මෙයට යොදවන විට අර කරගෙන යන වැඩ කොටස අතර මග නතර කර තමයි සිදු කරනු ලබන්නේ.එතකොට මෙය සුමානයකට මාසයකට දිනයක් සිදු වෙනවා නම් මෙය සභාවට ඔරෝත්තු දෙනවා.හැබැයි පරිපාලනය කර ගැනිමේදි මෙය විශාල ප්‍රශ්නයක් වි තිබෙනවා.මොකද වරුවක් හෝ දිනයක් මේ වෙනුවෙන්ම කැපකරන්න සිදු වෙනවා.පුටු ටික ගෙනියන්න ඕන . කොඩි කණුටික හිටවන්න ඕන.මා යෝජනා කරනු ලබන්නේ අපට තවකාලික සේවකයින් දෙතුන් දෙනෙක් අරගෙන ඇති අයගෙන් කැමති නම් අපි කොඩි කණු ලබා දෙනවා . කොඩිත් දෙනවා, පුටුත් දෙනවා. ඒ අයට තිබෙන්නේ අරගෙන යන්න විතරයි.එම කරණාව කරගන්න බැරි නම් කම්කරුවන් 3කුට කියා මෙය සිදු කරගන්න කියන යෝජනාව මා කරනු ලබන්නේ.සභාවේ වැඩ කටයුතු කරගෙන යාමේදි බරපතල තත්ත්වයක් මා දකිනවා . අපි කොයි වේලේ විමසුවත් අපි ඒ කාර්යේ නිරත වෙලා. ඒ කාගේ හරි මන්ත්‍රී කෙනෙකුගේ හරි මන්ත්‍රීතුමියකුගේ උවමනාවට තමයි මෙය සිදු කරනු ලබන්නේ. මෙය මේ වන විට අපි නිරන්තරයෙන් කරනු ලබන කරණාවකි.අනෙක් පැත්තෙන් මේ මන්ත්‍රීවරු ගරු සභාවේ කෑගසනවා මේ වැඩය වෙන්නේ නැහැ කියා.මේ සිටින සේවක පිරිසගෙන් තමයි මේ සියල්ල සිද්ධ වෙන්නේ.ඔබතුමා කල්පනා කර බලා මෙයටත් ප්‍රායෝගික විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මේ පොඩි ප්‍රශ්නයක්නේ තිබෙන්නේ . කොඩි කණු 20 ගසන එකනේ . මා නම් මගේ කොට්ඨාශයේ මැදිහත්වෙලා ඔය දෙන්නෙක් තුන්දෙනෙක් එකතු කරගෙන මා හරි එය ගසා ගන්නවා. සේවකයන් යොදවන්න දෙයක් නැහැ මෙයට. අපි කරනවා මෙය. අපි වළ කපන්නේ නැතිනම් අපි හරි වළ කපනවා.ඒ වගේ තත්ත්වයට යන්න වෙනවා. දැන් මහජන නියෝජිතයන් විදියට ජනතාවට සේවය කරන විට එය වෙනවා.එක නිසා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගරු මන්ත්‍රීතුමා , සභාව විසින් කොඩි ගෙනහින් සෙනසුරදා ගිහින් ගැසුවාම සඳුදා අපි ගිහින් ගලවන් එනතුරුම කොඩිටික එහෙමම තිබෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ඊයේ එකක් එක්ක මා කියන්නේ. දැන් මෙතැන ප්‍රශ්නයක් ආවා. එක්කෙනෙකුට ගහලා දෙනවා . අනෙක් කෙනාට ගහලා දෙන්නේ නැහැ.එහෙම ගියාම එතැන ගැටළුත් ඇති වෙනවා. මේ සඳහා නගර සභාව තමයි මුහුණ දිය යුත්තේ.සේවකයත් අසිරු තත්ත්වයට පත් වෙනවා. ගරු මන්ත්‍රීවරයාගේ වැඩේ කළේ නැති වුණාම

බනින්නේ සේවකයාට. ගරු සභාපතිතුමාට. නමුත් මෙතැන ගැටළු තිබෙනවා. අපිත් මේවාට මැදිහත් වෙලා තිබෙනවා. අනෙක් කරුණ ගරු සභාපතිතුමනි , මා ඉල්ලා සිටිනවා. මේ ප්‍රදේශයෙන් බැහැර මේ කටයුත්ත කරන්න යන්න එපා. ඒ කොඩි කණු, කොඩි , පුටු දෙනවා නම් මේ ප්‍රදේශයේ ඒවාට පමණක් ලබා දෙන්න.මොකද ඔය ගැටළු කාරණා එන්නේ ඔවගේ තත්වයන් තුළ. පිටට යන්න ගියාම. දැන් ගරු මන්ත්‍රිවරුත් ඉල්ලනවා ඕවා පිටට යන්න ගියාම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිවරු හරහාම මිස නිකං එන්නේ නැහැ ඕවා. ඔබලා 21 ම කරනු ලබන ඉල්ලීම් තමයි තිබෙන්නේ මා ගාව. වෙන ඒවා නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සේවකයෙක් පිට ඉන්නවානම් සේවකයාට ගෙනහින් ගැසුවාට කමක් නැහැ. එක සාධාරණයි. ගැටළුවක් නැහැ. සේවකයන්ගේ මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්. අපි වුණත් එය කල්පනා කර බලා ඉල්ලා සිටින්න. මොකද සේවකයෝ ගැනිම , මුදල් ගෙවීම මේ නගර සභාවෙන් තමයි දිය යුත්තේ. ඒ නිසා තව මොනවා හරි වැඩ කටයුත්තක් කරන්න තිබෙන මුදල් වැය කරන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම කොඩි ටික ගෙනහින් දෙනඑක සහ පුටු ටික දෙනඑක ප්‍රශ්නයක් නෙමේ. නමුත් මෙය ගැසීමට සේවකයන් දෙන එක ප්‍රශ්නයක්. මොකද  මෙය විශාල ගැටළුවක්. මේ සඳහා කොඩි ටික ප්‍රවාහනය සමඟ අපි ගෙනහින් දෙන්න. පුටු ටික දෙනඑක ප්‍රශ්නයක් නැහැ.මේ නිසා අපේ සේවකයන් තිදෙනෙකු දවසෙම එයට යෙදවිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැනට අපි මේ සේවාව කර තිබෙනවා. එකපාරටම නතර කරනවා කියා ඔබතුමාලාට තෙරෙන්නේ නැද්ද මෙය ප්‍රශ්නයක් කියා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහි වෙලා තිබෙන්නේ අදාළ කොට්ඨාශයේ ගරු මන්ත්‍රිවරයා හරහා පැමිණියා නම් හරි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම තමයි. අදාළ ගරු මන්ත්‍රිවරයා පැමිණ වැඩ පරික්ෂක මහතාට පවසා මන්ත්‍රිවරයාම පුටු ටික කොඩිටික ගෙනහින් එය ගසා දී එනවා. එය තමයි සිදු වී තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ එහෙම වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රිවරයා එහෙම නැති වූ වේලාවල් තිබෙනවා.මා ප්‍රකාශ කර සිටින්නේ මෙය නතර කරන්න. මෙය නතර නොකළහොත් අපට මේ අපේ තිබෙන කර්මාන්ත කරගෙන යන්න බැරි වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. මේ කටයුත්ත කාලයක් තිස්සේ කරගෙන එනු ලැබුවා. දැන් අපේ නගරය තුළ මෙයට පුරුදු වෙලා. දැන් අපි මේ කටයුත්ත නතර කළහොත්  ගරු උප සභාතිතුමා , ගරු සභාපති ඇතුළු සියළු මන්ත්‍රිවරුන්ටත් මෙයට පිළිතුරු දෙන්න වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

දැන් චෝදනා කරනු ලැබුවේ ගරු විපක්ෂ නායකතුමනි, දැන් මෙහෙමයි. මෙය මෑතකදී පටන් ගනු ලැබුවේ. මේ ගරු මන්ත්‍රීවරුන්ට තමයි දොස් කියනු ලබන්නේ. මෙතැන තිබෙන ගැටළු අපි දන්නවානේ. හිමාල් මහතාට තිබෙන පීඩනය අපි දන්නවානේ. , තාක්ෂණසේවා නිළධාරින්ට මේ වැඩ කරගන්න බැහැ.මළගෙදරක කොඩි ටික ගෙනහින් දුන්නාම ගහන්න කෙනෙක් නැහැ. මේ කොඩිටික ගැසීමට කෙනෙක් නැතිනම් යස පාඩුව. මේ ගරු මන්ත්‍රීවරුන්ටම තමයි පාඩුව . ඔබතුමලාම තමයි ප්‍රකාශ කරන්නේ මෙතැන වැඩ කරන්නේ නැහැ කියා. මේ සඳහා රියදුරු මහතා හා ගෝලයින් සමඟ පස්දෙනෙක් අනිවාර්යෙන්ම යනවා. එහෙම ගියාට පසු අනිත් වැඩ කරගන්න බැහැ. මේ කොඩි ගලවන්නෙත් නැහැ. සෙනසුරදා ඉරිදා නම් ගලවන්නේත් නැහැ.මේවා දමා නිහඳස් කරන්න ඕන. අපි සේවකයන්ට දොස් කියා වැඩක් නැහැ. මේ සේවකයන්ට පුළුවන් විදියට ඕන වැඩ කරන්න. මෙහි ගරු විපක්ෂ නායකතුමනි, සුමානයට මරණ තුන හතරක් එනවා. එම නිසා හැමදාම යොදවා තිබෙන්න ඕන මේ සේවකයන් ටික.මෙය ගැටළුවක් ඇත්තටම.මේය නිදහස් කරන්න. අපි ඒ ටික ගෙනහින් දෙන්න. එතකොට ඒ අය මේ ටික බා ගන්නවා. අපි එය ගෙනහින් දෙනවාමෙ. ය ගහන්න ගියොත් විශාල ගැටළුවකි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනෙක් ගරු මන්ත්‍රීවරුන්කේ අදහස කුමක්ද ?

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, වෙනදාට වඩා නගර සභාව , ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුනුත් ජනතාව මේ කටයුත්ත අභය කළා. මළගෙදරට කොඩිටික , පුටු ටික දීම සම්බන්ධව. ප්‍රායෝගික ගැටළුවක් තිබෙනවා. පාරවල් වල වැඩ කරන්න ගියාම නිලධාරිනුත් අපහසුතාවයට පත්වෙනවා සේවකයන් යොදවන්න ගියාම. නිලධාරිනුත් අපහසුතාවයට පත්වෙනවා. දැන් මේ වේලාවේ මෙය නතර කරනවා කියන්නේ අප පොඩ්ඩත් පසුබෑමකට ලක්වෙනවා. අපගේ මේ වැඩ සටහන නතර කිරිමෙන් දැඩි අපහසුතාවයකට පත්වෙනවා නගර සභාව. මේ කාර්ය දිගටම සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

මේ කාර්ය ඉටු කිරිමේදී ජනතාව අතර විශාල ප්‍රසිද්ධියක් ලැබුවා නගර සභාව. බලපිටිය හික්කඩුව ප්‍රදේශයටත් මෙය ගොඩක් ප්‍රසිද්ධ වි තිබෙනවා. අම්බලන්ගොඩ නගර සභාව . පසුගිය දිනයක ගරු හිටපු අමාත්‍යතුමාගේ රමේෂ් පතිරණ මැතිතුමාගේ මෑණියන්ගේ අභාවය සිදු වූ අවස්ථාවේදි අම්බලන්ගොඩ කොඩි පමණයි එතැන තිබුණේ. මා හිතන්නේ එය ලොකු ප්‍රසිද්ධියක් අපේ නගර සභාවට.මේ විදියට මේ විදියට මේ කොඩි දෙන නතර කිරිමට ගියහොත් ලොකු අපහසුතාවයකට පත්වෙනවා.කොඩි ටික ගෙනහින් ඒ නිවසේ පුද්ගලයින් නැවත එම කොඩි ටික නගර සභාවට ගෙනවිත් දිමට කටයුතු කරන්නේ නැහැ.මේ නගර සභාවෙන් මේ කටයුත්ත කරන නිසා තමයි මෙසේ සිදුවන්නේ. නගර සභාවෙන් ඉක්මනින් ගිහින් මේ කොඩි ටික ගහනවා. ඊට පසු හදිස්සියක් වුණාම ඊට පසුදින හෝ සවසම ගිහින් රැගෙන ආ හැකි තත්ත්වයකට දැන් තිබෙනවා.මේ සඳහා සේවයන් දෙදෙනෙකු හරි යොදවා මේ කටයුත්ත ඒ ආකාරයෙන් සිදු කරන ලෙස තමයි මගේ අදහස.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මාත් අදහස් ප්‍රකාශ කළ යුතුයි.පසුගිය වකවානුවේ කළුවඩුමුල්ල ප්‍රදේශයේත් මළ ගෙදරවල් තුන හතරක් වුණා.මළ ගෙදර වෙන අවස්ථාවේ ඒ ගෙදර අය ඉතාම අසරණ වන අවස්ථාවක්.ඒ අවස්ථාවේ ඔවුන්ට කොඩි සිටුවීමට කම්කරුවන් සොයා ගැනිමට අමාරුයි. මුදල් තිබුණත් කම්කරුවන් සොයා ගැනිම අසිරු කරුණකි. අඩුම තරමේ මේ සේවකයන් දෙදෙනෙකු හරි මේ සඳහා යොදවා මේ කටයුත්ත දිගටම සිදු කිරිම සුදුසු බව තමයි මගේ අදහස.ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා ප්‍රකාශ කළ පරිදි

ඇත්තටම මෙම සේවය ලබා දිම නිසා නගර සභාව ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කිරිමට හේතුවක් වි ඇත.එම නිසා මේ කාර්ය ඉතා අපහසු තා මැද හෝ කරන්න. මා පිළිගන්නවා ගරු උප සභාපති තුමා ප්‍රකාශ කළ ආකාරයට සේවකයින් යෙදවීම අපහසුයි. අඩුම තරමේ මේ දෙදෙනෙක් හරි යොදවන්න. මට ඒ අත්දැකිම තිබෙනවා. පසුගිය මාස දෙක තුනේ. එක මළ ගෙදරක කොස්ගොඩ පිරිසක් ඇවිත් හිටියා. ඒ අවස්ථාවේ චන්න සාලිය මැතිතුමා පැමිණ සිටියා. චන්න සාලිය මැතිතුමාට දොස් කිවුවා. මෙන්න වැඩ කරන විදිය . මෙන්න අම්බලන්ගොඩ නගර සභාවෙන් වැඩ කරන විදිය. මෙන්න මේ විදියට වැඩ කරන්න කියා.කොස්ගොඩ අය. චන්න සාලිය මැතිතුමාගේ මිතුරන්.මා ප්‍රකාශ කරන්නේ මෙය නතර කරන්න එපා. අමාරුවෙන් හරි මේ සේවය ලබා දෙන්න. මිට වඩා වැඩි වැඩ කරනවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ අපිත් අදහසක් දැක්විය යුතුයි.තමන්ගේ අම්මාගේ අප්පාගේ මරණේ වෙලාවේ මේ දුවට පුතාට මැදිහත් වෙලා කොඩියක් ගසා ගැනීමට බැරි නම් ගමේ සමාජ සේවකයෝ කම්මැලියෝ බවට පත් කරනවා මා සිතන පරිදි.ඔවුන් අත් බැඳගෙන බලා ගෙන සිටිනවා. නගර සභාවේ සේවකයන් කොඩි ගසන කම් මෙය වැරදි ප්‍රවිණතාවයක්.අපගේ මේ පුංචි සභාව අපේ අවම සම්පත් වලින් මේ කාර්ය ඉටු කරනු ලබන්නේ. මේ සඳහා විශාල කැප කිරිමක් සිදු කරනු ලබන්නේ . මේ කැප කිරිම කොතරම් දුරට ඇහයිමට ලක් කරනවාද කියා මට නොපෙනේ.අපි වෙහෙසට පත් විම පමණයි සිද්ධ වෙන්නේ.එම නිසා හැකිනම් අප ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ පරිදි එම භාණ්ඩ ප්‍රවාහනය කර තම තමන්ගේ ගම්වල අසල් වැසියන්ටත් කරන්න දෙයක් තිබෙනවා.මොවුන් කම්මැලි කරන්නේ ඇයි ගරු සභාව. ගරු උපසභාපති තුමාගේ මතයට අපි ගරුකරමින් අපි නවතිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවෙන් මේ කරනු ලබන සේවාව මා ඉතා අඟය කොට සලකනවා.මා දැක නැහැ වෙනත් සභාවකින් මේ කටයුත්ත සිදු කරන්නේ නැහැ. ඇත්තටම මෙය අපගේ යුතුකමක් වෙනවා . අම්බලන්ගොඩ නගර සභාවේ වරිපණම් ගෙවන පුද්ගලයන්ට තමයි මේ යුතුකම කරනු ලබන්නේ.මොකද එම පුද්ගලයා මේ නගර සභාවට වරිපණම් ගෙවනවා.ඔවුන්ට අපෙනුත් සේවාවක් කෙරෙන්න ඕන.අනික අපි මේ කොඩි ගෙනියන්න දිලා ඔවුන්ට ගැසිමට කිවු විට වර්ෂා කාලයේදි ඒවා කිසි පරිස්සමක් නැහැ. ඔහේ බිම දනවා, ඒවා මත කනවා , බොනවා, බිම දමා පගනවා. මේවා අපි ඇස්දෙකෙන් දුටු දේවල්.ඇත්තටම මෙතුමන්ලාටත් අමාරුයි අපි කියන කියන වේලාවට සේවකයන් ලබා දෙන්න.මේ සඳහා රියදුරු මහතෙකු හා සේවකයන් දෙදෙනෙකු වෙනම ගෙන එම කර්තව්‍ය සඳහා වෙනමම තබා ගන්න. නැතිනම් මෙතුමන්ලාටත් අපිට කරදර කරන්න වෙනවා. පසුගිය කාලයේ එහෙම සිද්ධ වුණා. මළ ගෙදර අවසන් කටයුතු සිදු කළේ සිකුරාදා දින හවස . සෙනසුරදා දිනයේත් ඉරිදා දිනයේත් මේ කොඩි ගලවන්න බැරි වුණා. සඳුදා තමයි ගලවනු ලැබුවේ.එහෙම සිද්ධ වෙනවා. එම නිසා මගේ අදහස අලුතින් සේවකයින් දෙදෙනෙකු හා රියදුරු මහතෙකු ගෙන මේ කාර්ය සිදු කරන්න.ගමේ ජනතාවට මේ කොඩි ගැසිමට දුන්නොත් අපට ඒවා වැඩිකල් පාවිච්චි කරන්න වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා ප්‍රකාශ කළ ආකාරයට අම්මා තාත්තා මැරි ඇති මොහොතක කොඩි උසවන එක නෙමේ කිරිමට ඇත්තේ.නගර සභාවෙන් යම්කිසි සේවයක් කරනවා කියන මතය හැමදෙනාම ළඟ තිබෙනවා.මෙය ඉතාමත්ම වැදගත් දෙයකි.සේකකයෝ යෙදවීම මෙතැන අඩුපාඩු වුවත් යොදවන්නේ නැතිව ඉන්න එපා.මෙතෙක් කරගෙන ආපු වැඩපිළිවෙළ ඒ විදියටම කරන්න.ගමේ මලගෙදරක් සිදු වුණාම පිටස්තර අයත් ප්‍රකාශ කර තිබෙනවා අපගේ නගර සභාවේ නම් හරියට ඒ වැඩටික සිදු කරනවා. කොඩි ටික වේලාවට ගැසිම ආදිය.මේ නිසා මෙය වැදගත්. කාන්තා මන්ත්‍රිවරුන්ට ගිහින් කොඩි හිටවනවාට වඩා වෙනත් කටයුතු තිබෙනවා මළ ගෙදර සිදු කරන්න.කොඩි හිටවන එක විතරක් නෙමේ මල ගෙදර තිබෙන්නේ. ගමේ ජනතාව කම්මැලි නැහැ.ගමේ ජනතාව තමයි

පාවඩ ටික දමන්නේ ඔක්කොම ටික කරන්නේ.කොඩි හිටවන එක නගර සභවේ සේවකයන් දෙදෙනෙකු දමා සිදු කරන්න. අම්මලා අප්පලා මැරි අඳෝනා ගසන වේලාවක කොඩි සිටුවීම ඒ අයට කරන්න බැහැ.එයට අපි උදවු කරන්න. මෙය නතර කරන්න එපා. අනිවාර්යෙන්ම මෙය සිදු කරන්න.මෙය කරගෙන ගිය විදියට සිදු කරන්න. සේවකයන් දෙදෙනෙකු හරි යොදවා මෙය කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි,ගරු නගර සභා මන්ත්‍රී අයිරාංගනී මහත්මිය ප්‍රකාශ කළ දෙයට මාත් එකඟ වෙනවා.ඇත්තටම කාන්තාවන් වුණු අපි ඉතා අසිරුතාවයකට පත්වෙනවා . මටනම් බැහැ ගිහින් කොඩි හිටවන්න. මෙය මා මේ ප්‍රසිද්ධියෙම කියනවා. මොකද ඡන්දය ගත් ඡන්ද දායකයෝ දොස් කියාවි. ඇත්තටම මෙය කෙරෙන්නේ නැති වැඩක්.අනික ගෙදර කෙනෙකු මියගිය විට ගෙදර අයට මෙය කරන්න වේලාවක් නැහැ.ගමේ මන්ත්‍රීවරයා විදියට අපි තමයි නගර සභාවට දැනුම් දී කොඩිටික ලබා ගන්නේ.එය කිරීම අපගේ කාර්යකි. ඒ නිසා තමයි ජනතාව ඡන්දය දී අපි මෙතනට එවා තිබෙන්නේ.අර ගෙදර ජනතාවට කොඩි ටික දී ඔන්න කොඩි ටික ගහනවානම් ගහ ගන්න කියන එක නෙමේ යුතුකම.ඒ අය තමයි අපිට වරිපණම් ගෙවන අපට  බඳු දෙන ජනතාව. අපේ ජනතාවට සේවයක් කරන්න තමයි නගර සභාව තිබෙන්නේ . නගරයේ ජනතාවගේ ආරක්ෂාව සහ සුභ සාධනය කිරීමට තමයි නගර සභාව තිබෙන්නේ.ජනතාවගේ සුභ සාධනයට තමයි නගර සභාවක් තිබෙන්නේ.මෙය සුභ සාධන කටයුත්තක් ලෙස තමයි මා දකින්නේ.එය කිරීම මේ කරගෙන යන ක්‍රමයටම කරන්න. මේ සඳහා සේවකයන් දෙදෙනෙකු යොදවන්න.අර ගරු නගර සභා මන්ත්‍රී ජගත් මහතා ප්‍රකාශ කළ ආකාරයට කොඩිය කොහේ හරි තිබේවි. මත්පැන් පානය කර එයත් ඔතාගෙන නිදියා ගනියි.ඒක උඩ තියාගෙන බත් කයි. අන්තිමට කොඩියත් නැහැ. බටය කවුරුහරි අරගෙන යයි.එකත් අවාසියක් වෙනවා . එම නිසා මේ යන ක්‍රමයට යනලෙස තමයි මා ප්‍රකාශ කරන්නේ.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මගේ පෞද්ගලික මතය වී ඇත්තෙත් එයයි. මේ කරන ක්‍රමය ඉතාමත් හොඳ චාරිත්‍රයකි.එය ඇත්තටම කළ යුතුයි. මගේ මීට අමතරව තව මතයක් තිබෙනවා.මළ ගෙයක් වුණාම උයන්න අවශ්‍ය භාණ්ඩ ටික කෑම බෙදා තබන භාජන ආදිය ගෙනහින් දුන්නාම හොඳයි. මේ කටයුත්ත මා සිදු කරනු ලැබුවේ මාගේ පියා මිය ගියේ 1991 වර්ෂයේ . මා මේ  දේවල් වලට කුලියට ගෙන රුපියල් 31000/= ක මුදලක් ගෙවනු ලැබුවා එදා.ඒ කාලයේ මෙහෙම වැඩ පිළිවළක් අපේ තිබුණේ නැහැ. දැන් අපි පුටු 100ක් නොමිලේ ලබා දෙනවා. කැනපි ලබා දෙනවා. දුප්පත් කෙනෙකුට මේ කටයුත්ත දරා ගත නොහැකියි.අපි ඒ අය දුකට පත් වූ අවස්ථාවක ඒ අයට හැල්ලුවක් විය යුතුයි. එම නිසා මෙය කරගෙන යන විදියට කර ගෙන යා යුතුයි.යම්කිසි අඩුපාඩුවක් තිබුණොත් එය හදා ගන්නා ලෙසත් ඉවසීමෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.මෙය අපි හැමදෙනාටම පොදුයි.

**තීරණය**

ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය විසින් කොට්ඨාශයේ සමෘද්ධි සහනාධාර ප්‍රදානෝත්සවය 2019.06.12 දින පැවැත්වීම සඳහා අවශ්‍ය පුටු 600ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සම්බන්ධව අනුමැතිය ලබා දීම සුදුසු බවත් , ගරු සභාවට සහා අරමුදලින් තවත් පුටු 500ක් ලබා ගැනිම සිදු කළ යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මී හේමන්තා මෙනවිය ඉදිරිපත් කළ අතර ,ඒ සඳහා වරින් වර පුටු 100 බැගින් ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මී හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.06 ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් සමෘද්ධි සහනාධාර ප්‍රධානෝත්සවය සඳහා කැනපි 03ක් සහා අනුමතියට යටත්ව නොමිලේ හා ධර්මාශෝක විද්‍යාලයේ ශ්‍රවණාගාරයට ප්‍රවාහනය කර දෙන ලෙසත් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් සමෘද්ධි සහනාධාර ප්‍රධානෝත්සවය සඳහා කැනපි 03ක් ලබා දිම. මෙය සභා අනුමතියට යටත්ව ලබා දි තිබෙනවා.

**තීරණය**

ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය විසින් කොට්ඨාශයේ සමෘද්ධි සහනාධාර ප්‍රදානෝත්සවය 2019.06.12 දින පැවැත්විම සඳහා කැනපි 03 ක් හා එම කැනපි 03 ධර්මාශෝක විද්‍යාලයේ තෝමස් ද සිල්වා අනුස්මරණ ශ්‍රවණාගාරය අසළට ප්‍රවාහනයත් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධව අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.07 පටබැඳිමුල්ල මිතුරු කැල විසින් පොසොන් උත්සවයට සමගාමිව 2019 ජුනි 16වන දින ඔරෙන්කෝ හෝටලය ඉදිරිපිට පැවැත්වීමට නියමිත දන්සැල සඳහා 2019 ජුනි 05 දින කුඩාරම් 06 ක් හා පුටු 200ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පටබැඳිමුල්ල මිතුරු කැල විසින් පොසොන් උත්සවයට සමගාමිව 2019 ජුනි 16වන දින ඔරෙන්කෝ හෝටලය ඉදිරිපිට පැවැත්වීමට නියමිත දන්සැල සඳහා 2019 ජුනි 05 දින කුඩාරම් 06 ක් හා පුටු 200ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දි තිබෙනවා. ඒ සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල මිතුරු කැල විසින් පොසොන් උත්සවය නිමිති කොටගෙන පවත්වනු ලැබූ දන්සැල සඳහා 2019.06.15 දින කුඩාරම් 06 ක් හා පුටු 200ක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධව අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.08 ධර්මාශෝක විද්‍යාලිය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය මඟින් 2019.10.06 වන දින පැවැත්වීමට නියමිත ප්‍රසංගයේ විනෝද බදු නිදහස් කර ගැනීම සම්බන්ධ ලිපිය සභාගතකරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ධර්මාශෝක විද්‍යාලීය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය මඟින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. 2019.10.06 වන දින පැවැත්වීමට නියමිත ප්‍රසංගයේ විනෝද බදු නිදහස් කර ගැනීම සම්බන්ධවයි. උක්ත කරුණ සම්බන්ධව අම්බලන්ගොඩ නගර සභාවෙන් එවන ලද ලිපිය හා බැඳේ. විද්‍යාලයේ භෞතික ශිෂ්‍ය සංවර්ධනය උදෙසා අරමුදල් ලබා ගැනීම උදෙසා පැවැත්වීමට නියමිත උක්ත ප්‍රසංගය විනෝද බදු මුදලින් නිදහස් කිරිම සඳහා අප විසින් කරන ලද ඉල්ලිමට අනුමැතිය ලබා දිම සම්බන්ධයෙන් නගරාධිපතිතුමන් ඇතුලු අනෙකුත් සභිකයින් වෙත සංගමයේ ස්තූතිය පලකරනු ලබනවා.තවද ඔබ විසින් ඉදිරිපත් කරන ලද ලිපියේ 03 සහ 04 වන වගන්තිවල සඳහන් කර ඇති පරිදි තැන්පත් කිරිමක් සිදු නොකොට පෙර වර්ෂ වලදි මෙන් අප වෙත මේ සම්බන්ධයෙන් සහයෝගය දක්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.මන්දයත් එතරම් විශාල මුදලක් තැන්පත් කිරිමට හෝ රඳවා තැබිමට තරම් අව සංවිධානය සතුව ආර්ථික ශක්තියක් නොමැති අතර , මෙම ප්‍රසංගය ලාභ ලැබිමේ අපේක්ෂාවකින් තොරව පාසල් සංවර්ධන කාර්යයන් සඳහා ස්වේච්ඡාවෙන් සාමාජිකයන් ඉදිරිපත්ව සංවිධානය කරනු ලබන ව්‍යාපෘතින් වේ. මෙම සියලු කරුණු සලකා බලා පෙර වර්ෂවල මෙන් අප සංවිධානයේ මෙම ව්‍යාපෘතිය ලිපියේ 03 හා 04 වගන්ති වල සඳහන් කොන්දේසි වලින් නිදහස් කරන මෙන් ඉල්ලා සිටි.ඕලු ජයතිලක ලේකම් , අමිල මාදුවගේ සභාපති , හසිත කේසර වෙත්තිමුණි විදුහල්පති විසින් ඉල්ලිමක් කර සිටිනවා. මෙය විනෝද බදු අඥා පණතේ විධිවිධාන ප්‍රකාරව නිදහස් කිරිම කරන්න.

**තීරණය**

ධර්මාශෝක විද්‍යාලයීය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය මඟින් 2019.10.06 වන දින පැවැත්වීමට නියමිත ප්‍රසංගයේ විනෝද බදු නිදහස් කිරීම විනෝද බදු අඥා පණතේ විධිවිධාන ප්‍රකාරව නිදහස් කිරීම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.09 2019.06.04 දින මහ සභා රැස්වීම සඳහා කුලී පදනම ජේනරේටරයක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.06.04 දින මහ සභා රැස්වීම සඳහා කුලී පදනම ජේනරේටරයක් ලබා ගැනීම සම්බන්ධයෙන් රු.10000/= ක මුදලක් හේමන්ත ඉලොක්ට්‍රිකලස් වෙත ගෙවීම සඳහා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මා මේ සමඟ යෝජනා කරනු ලබනවා නගර සභාවට ජේනරේටරයක් ලබා දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019.06.04 දින විදුලි බලය ඇණහිටීම නිසා මහ රැස්වීමේ වැඩකටයුතු සිදු කර ගැනීම සඳහා හේමන්ත ඉලේක්ට්‍රිකල් වෙතින් කුලී පදනම මත රු.10000/= ක මුදලකට ජේනරේටරයක් ලබා ගැනීම සිදු කරන ලදි . ඒ සඳහා අනුමතිය ලබා දීම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.10 වැසිජල අපවහන වැඩිදියුණු කිරීමේ පද්ධති (SWDI) ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැසිජල අපවහන වැඩිදියුණු කිරීමේ පද්ධති (SWDI) ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධවයි. ඉහත ණය මුදල සඳහා 2019.05.21 දින ලිපිය හා බැදේ.එම ණය මුදලට අදාල ව්‍යාපෘතියේ ශක්‍යතා ඇගයීම් කිරීම ඉංජිනේරු කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරියේ අඩු ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද්දක් බව ඔබද අපද දන්නා කරුණකි.මෙම අරමුදල් යෙදවීමේදී කිසිදු වැරදීමක් සිදු නොවූ අතර එම කටයුතු ව්‍යාපෘතියේ නිලධාරීන් හා ඔබ සභාවේ නිලධාරීන් විසින් සිදු කර ඇත.මෙම ණය මුදල් නාගරික සංවර්ධන අධිකාරියේ අඩු ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය මගින් මහ භාණ්ඩාගාරයේන් ලබා දුන් ණය මුදලක් බැවින් එම ණය මුදලේ ණය මුදල හා පොළී අයකර ගැනීම දේශීය ණය සංවර්ධන අරමුදල ක්‍රියා කරන අතර මේ සඳහා ණය අයකිරීමට ලියවිල්ලක් හා ණය ලේඛණයක් මඟින් අප වෙත පවරා ඇති බව සඳහන් කරයි. එම නිසා උක්ත ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති වැඩි විස්තර ලබා දීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව දැනුම් දෙන අතර ඒ නිසා කඩිනමින් අප සමඟ සාකච්ඡා කර ඔබට හැකි පරිදි ගෙවීමට කඩිනමින් ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා ඇත. දේශීය ණය සංවර්ධන අරමුදලේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් ලිපියක් එවා ඇත.මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කළ යුතුයි. වැසිජල අපවහන වැඩිදියුණු කිරීමේ පද්ධතිය වෙනුවෙන් නගර සභාව ණයක් ලබා ගෙන තිබෙනවා.එම ණය ලබා ගැනීමේදී එවකට සිටි නගර සභාව එම ණය මුදල නිසිලෙස භාර දී නැහැ කියන ප්‍රතිපත්තිය මත ණය දීම ප්‍රතික්ෂේප කර තිබෙනවා.නමුත් මෙම ණය අයකර ගැනීම නාගරික සංවර්ධන අධිකාරිය සිදු කළත් මෙය භාර දී තිබෙන්නේ දේශීය ණය සංවර්ධන අරමුදලට.එතුමාලාට කලින් ලිපියක් යැව්වා මේවා භාරදීම පිළිබඳ

ඉංජිනේරු වාර්තා අප වෙත එවන්න කියා.මෙච්චර කොන්ක්‍රීට් ප්‍රමාණයක් දැම්මා , ආදි විස්තර . එතකොට අපිට මැනලා අද භෞතික පොළොවේ තිබෙන වා නම් ගෙවීම් කරන්න පුළුවනි.එම න්සා ඔවුන් දන්වා සිටිනවා එවැනි ලේඛණ ඔවුන් ළඟ නැහැ කියා.අපට කියා තිබෙන්නේ ණය අයකර ගැනිම පමණයි. එය ගෙවන්න කියා.මේ අවස්ථාවේ සභාව කියන්නේ මොකක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙවැනි ව්‍යාපෘතියක් කළ විට එහි වියදම් විස්තර හා බිල්පත් අපට එවිය යුතුයි.එහෙම නැතිව නගර සභාවට ඒ අයට ගෙවන්න  බැහැ ඇත්තටම.අපේ ජල සම්පාදනේ මොකක් කළත් එය නගර සභාවට ලිඛිතව භාර දිය යුතුයි මෙන්න මේ දේවල් කර තිබෙනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ  ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එවැනි භාරදිමක් කර නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එහෙම නැතිව කොහොමද කියන්නේ මේවා කළා කියා.එය අනුමත කළොත් ගරු මන්ත්‍රිවරුන්ටත් ප්‍රශ්නයක් වෙයි.එම නිසා එය ඉල්ලාගෙන තමයි අනුමත කරන්න වෙන්නේ.එහෙම නැතිව අපට ගෙවන්න බැහැ.නිතිමය බාධාවකුත් තිබෙයි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ  ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ගත් මුදල් ගෙවනවා.අනෙක් කාරුණා නිසා නෙමේ මෙය නිසා අපි බ්ලැක් ලිස්ට් වි තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය වැසිජල අපවහන වැඩිදියුණු කිරිමේ පද්ධතිය ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදලයි.අසියානු සංවර්ධන ප්‍රතිපාදන යටතේ තමයි මෙය ලැබුණේ.ඇත්ත වශයෙන්ම අම්බලන්ගොඩ නගර සභාවට ලැබුණු ව්‍යාපෘතියක්.කරිත්ත කන්දේ රේල් පාරේ සිට දෙපැත්තේ දමා ඇළක් හදා තිබෙන්නේ බැමි දමා. හල්වතුර ඇළේ දෙපැත්තේ බැම්ම බැඳ තිබෙන්නේ මේ ව්‍යාපෘතියේ. ඊළඟට මහ අම්බලන්ගොඩ මහ පන්සල අපාය ලඟ සිට මානාන පිට්ටනිය දක්වා එම ව්‍යාපෘතිය යටතේ හැදුනු  කාණු මෙම ණය මුදල නොගෙව විමෙන් අර ණය මුදලට බ්ලැක් ලිස්ට් වන එක වලක්වා ගන්නත් ඕන එම නිසා අපට කියන්න බැහැනේ අපට මෙය නැති නිසා දෙන්නේ නැහැ කියා.මෙය තාවකාලිකව කිව හැකියි. හැබැයි ඊට වඩා හොඳ නැද්ද ගරු සභාපතිතුමනි මෙහි 50% වඩා ගියේ ගෙබියම දැම්ම සඳහා.එය දැම්ම අපිට අයිති රාජකාරියක් නෙමේ.මා ඒ කාලයේත් එයට විරුද්ධ වුණා සභාවේ.ගරු සභාපතිතුමාලා ගත් තින්දුව නිසා එය ක්‍රියාත්මක වුණා.එය අයිති වාරිමාර්ගයට . ඒ හල්වතුර ඇළ අයිති වාරිමාර්ගයට.අවංකවම අපට මුකුත් අයිතියක් නැහැ.හිටපු ගරු සභාපතිතුමා මෙය සිදු කරනු ලැබුවේ හල්වතුර ගොඩකිරිම සමඟ පරිසරය අලංකාර කිරිම සඳහා හල්වතුර ඇළේ තාවකාලිකව දමන්නේ . අවශ්‍ය වුණොත් අයින් කිරිමට.එයට හේතුව වුයේ උසාවි තින්දුව මත ඇළ සංවර්ධනය කිරිමේ තින්දුව හම්බ වුණා.ඒ වගේම අඩි 30ට සංවර්ධනය කරන්න කියා උසාවියෙන් තින්දුවකුත් ලබා දුන්නා.හල්වතුර ඇළ . ඒ ගොඩකිරිමේදි.එය තමයි මෙය සිදු කිරිමට හේතුව.ඒ වගේම උසාවියෙන් තින්දුවකුත් ලබා දුන්නා ඇළ අඩි 30ට සංවර්ධනය කරන්න කියා.ඔය හරහා අපට නිදහසට කරුණක් තිබෙනවා අම්බලන්ගොඩ සංවර්ධනය සඳහා නගර සභාව විදියට මෙයින් වැය වි ඇත්තේ 50%ක මුදලකි.රජයේ භාණ්ඩාගාරයට මෙය පුළුවන් විදියට කපා හරින්න කියා . මේ නිසා ගරු මන්ත්‍රිවරුන් කොහොමද මෙයට අත ඔසවන්නේ.මෙය අපේ සභාවට අයිති නැති එහෙම නැතිනම් පැහැදිලි නැති දෙයකට. මෙය අනෙක් පැත්තෙන් අයවැයේ පෙන්වා තිබෙනවාද කියන එකයි.එහි පෙන්වා තිබෙනවාද මෙය ගෙවිය යුතු ණය විදියට.මෙය පෙන්වා ඇති අයවැය ලේඛණයේ. නැතිනම් අපට කොහොමත් ගෙවන්න

බැහැනේ.එම නිසා හැම පැත්තම බලා මේ කාරණාවත් සාධාරණීකරණය කර බලා මෙහි වියදම 50% කට වඩා වියදම වාරිමාර්ගයට නිසා අයිති නිසා මේයත් සලකා බලා මේ ණය මුදල නිදහස් කරන ලෙස ඉල්ලීම් කරන ලෙස ඉල්ලා සිටිනවා.එහිදි යම් ප්‍රතිශතයක් අපට ගෙවන්න කියයි. එවිට ඒ මුදල පිළිබඳව සලකා බලන්න මොකක්ද කරන්න පුළුවන් කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව එහෙනම් සාකච්ඡාවකට යොමු විය යුතුයි.

**තීරණය**

වැසිජල අපවාහන වැඩි දියුණු කිරිමේ පද්ධතිය (SWDI) ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක , දේශිය ණය සහ සංවර්ධන අරමුදලේ සංවර්ධන නිලධාරි , ගරු සභාපති එම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා ,ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා යන පිරිස සමඟ සාකච්ජාවක් පැවැත්විම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## 03.11 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව 2019 . මෙම පාඨමාලාව සඳහා පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයන් වන මන්ත්‍රිවරුන් . පරිපාලන නිලධාරින් සඳහා පරිඝණක දැනුම ලබා දිම සඳහා යාවත්කාලින කිරිමේ අරමුණින් පළාත් පාලනය පිළිබඳ යාවත්කාලින කිරිමේ අරමුණින් පළාත් පාලනය පිළිබඳ යාවත්කාලින කිරිමේ අරමුණින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය 2019 වර්ෂයේ පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්විමට සැලසුම් කර තිබේ. මේ පාඨමාලාවේ දෙවන කණ්ඩායම සඳහා විස්තර එවා ඇත. 2019 ජුලි 08 වන දින අගහරුවාදා දින. ස්ථානය පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.පරිගණක විද්‍යාගාරය , කොළඹ 07. වේලාව උදේ 9.00 සිට 4.00 දක්වා. පාඨමාලා ගාස්තු රු30000/= ක් ලෙස ගරු සභාවේ මන්ත්‍රිවරුන්ට දන්වා එවා ඇත.

**තීරණය**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් තොරුතුරු තාක්ෂණ සහතිපත්‍ර පාඨමාලා - 2019 කණ්ඩායම සහා ජුනි මස 25 දින පැවැත්විම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 03.12 අම්බලන්ගොඩ ආසන සංවිධායක ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාගේ අනු දැනුම මත ඉල්ලීම් කරන ලද සමෘද්ධිලාභින්ගේ උත්සවය සඳහා ගරු නගර සභා මන්ත්‍රි ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් 2019.06.07 – 2019.06.12 වන දින දක්වා කොඩි කණු 25 කු සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කොඩි කණු 25ක් ලබා ගැනිම සඳහා අම්බලන්ගොඩ ආසන සංවිධායක ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාගේ අනුදැනුම මත ඉල්ලීම් කරන ලද සමෘද්ධිලාභින්ගේ උත්සවය සඳහා ගරු නගර සභා මන්ත්‍රි ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් 2019.06.07 – 2019.06.12 වන දින දක්වා කොඩි කණු 25 ක් සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබා දි ඇත . එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

සමෘද්ධි ලාභීන්ගේ උත්සවය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ( ගරු අම්බලන්ගොඩ ආසන සංවිධායක නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගේ අනුදැනුම ඇතිව ) කොඩි කණු 40ක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධව අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

## 03.13 ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ . සෝභිත රංජිත් මහතා ප්‍රංශයේ විදේශ සංචාරයක් සඳහා නිවාඩු අනුමත කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ . සෝභිත රංජිත් මහතා ප්‍රංශයේ විදේශ සංචාරයක් සඳහා නිවාඩු අනුමත කරන ලෙස දන්වා එතුමා විසින් ලිපියක් යොමුකර තිබෙනවා. ඩබ්. ඒ . සෝභිත රංජිත් වන මා ප්‍රංශයේ විදේශ සංචාරයක් සඳහා යාමට බලාපොරෝත්තු වන බැවින් ඒ සඳහා අගොස්තු ( පළවෙනි ) 01 දින සිට අගොස්තු මස විසිවන දින දක්වා මා හට නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.මා එය යෝජනා කර සිටිනවා. කවුරුහරි එය ස්ථිර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කරනවා.

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා 2019.08.01 දින සිට 2019.0820 දින දක්වා ප්‍රංශයේ විදේශ සංචාරයක් සඳහා සහභාගි විම සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා ඇති ලිපියට අනුව නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

## 03.14 තැලිගල කන්ද නැමති අනුමත ඉඩමේ අනුබෙදිම කර ගැනීම සඳහා ජී.එච්.ඒ. ශ්‍යාමලි මහත්මිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉහත ඉඩම වාචික උපදෙස් මත ගරු මහඇමති තුමගේ මූලිකත්වයෙන් සහ අම්බලන්ගොඩ හිටපු ප්‍රාදේශිය ලේකම්තුමාගේ දායකත්වයෙන් නගර සභාව සතු මාගේ මවට ලැබුණු පර්චස් 06ක පමණ භූමි ප්‍රමාණයක නිවසක් තනා වසර 10ක් පමණ ජීවත්ව සිටින ලදී. ඉන් අනතරුව මෙම ඉඩමට ඔප්පුව ලබාදිමට ගරු මහ ඇමතිතුමාගේ අනුමැතිය සහ පෙත්සම්කාරක සභාවේ අනුමැතිය ද නගර සභාවේ ගරු සභාපති ඇතුලු සියලු මන්ත්‍රිවරුන්ගේ අනුමැතිය ඇතිව මාගේ මවට අංක 787 යටතේ සින්නක්කර ඔප්පුවක් ලබාදීමට කටයුතු කළ ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රිවරුන්ට ගෞරව පූර්වක ස්තුතිය පුදකරනවා. මෙම ඉඩමට අනුබෙදුමක් දමා තිබෙනවා. මෙය දිගු ලිපියක්. මේ අනුබෙදුම ප්‍රතික්ෂේප කර තිබෙනවා. එම නිසා මේ අනුබෙදුම අනුමත කිරිමට සියළුම ගරු මන්ත්‍රිවරුන්ගේ අනුමතිය ඉල්ලා සිටිනවා.මෙය ප්‍රතික්ෂේප කර ඇත්තේ පොදු කටයුතු සිදු කිරිමට දෙනු ලැබූ ඉඩමක වෙනත් පොදු කටයුතු සිදු කරන්න බැහැ කියා.මේ සියළු කරුණු සලකා බලා තමයි මෙය පෙත්සම්කාරක සභාව තින්දු කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මේ ඉඩම් සඳහා තව කිදෙනෙක් මුදල් ගෙවිමට සිටිනවාද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මුදල් ගෙවනු ලැබූ දෙදෙනෙක් සිටිනවා. තව දෙදෙනෙක් මුදල් ගෙවීමට සිටිනවා. ඒ අයට බදු ක්‍රමය යටතේ දිය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මේ මව සහ පියා දෙදෙනා අපගේ නිවසටත් එක දහා දොළොස් වතාවක් පැමිණියා. මට ලිපියක් ද දී තිබෙනවා.බොහොම අනුකම්පා සහගත තත්ත්වයක් තමයි ඇති වෙන්නේ. මෙහි නීත්‍යානුකූල තත්ත්වය සභාවට හා ගරු මන්ත්‍රීවරුන්ට අගතියක් නොවෙනවා නම් අපේ වරදක් නැහැ.වරින් වර පාලකයින් තමන්ට කැමති ආකාරයට මේවා පරිත්‍යාග කරනවා. අවසානයේදී ඒ ජනතාව අපගේ නිවෙස් කරා පැමිණෙනවා අනේ මෙය අත්සන් කර දෙන්න . මෙය අනුමත කර දෙන ලෙස ඉල්ලමින්.එය එච්චර ලස්සන දෙයක් නෙමේ.කොහොම වුණත් මාගේ පුද්ගලික විරෝධතාවයක් නැහැ. මේ අයට මෙය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , පෙත්සම් කාරක සභාවෙන් තමයි මෙය අපට යොමු කළේ මෙය මේ අයට ලබා දෙන්න කියා.ඒ අනුව පෙත්සම් කාරක සභාවෙන් එවන ලද තීන්දුව තමයි අපි මෙතැන ක්‍රියාත්මක කරනු ලැබුවේ. අනුමතිය දුන්නේ.එහෙමනම් පෙත්සම් කාරක සභාවෙන් හෝ ගරු ආමාත්‍යතුමාගෙන් හෝ පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙසක් ලබා ගෙන මෙය ලබා දෙන ලෙස තමයි ප්‍රකාශ කිරිමට හැක්කේ.එක කොටසක් ලබා දී අනෙක් කොටස ලබා නොදිමට අපට බැහැ.අනික් එක මෙය ලබා දෙන්නේ නාගරික සංවර්ධන අධිකාරයෙන්. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියට අපට බල කිරිමක් කරන්න බැහැ.මේ සඳහා අපට දැනුම් දිමක් කළ හැකියි . මෙන්න මේ ආකාරයට පෙත්සම් කාරක සභවෙන් මෙය ලබා දී ඇති බව

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය දැනුම් දී තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එසේ නම් ඒ අනුව සභවේ තීන්දුව අනුව මෙය ලබා දෙන ලෙස ඉල්ලිමක් කළ යුතුයි . අපි සභාවේ එක කොටසක් ඒ අයට දිලා මෙය කරගන්න කියා කටයුතු කරන්නත් බැහැ.එහෙම නැත්නම් අපි නොදිම ඉන්න.එ අය නීත්‍යානුකූල ක්‍රමයට කරගත යුතුයි.මේ අයට නාගරික සංවර්ධන අධිකාරියෙන්නේ ඒ කොටස ලබා දී තිබෙන්නේ. අපි නෙමෙයි. අපි නාගරික සංවර්ධන අධිකාරියටයි ඉල්ලිම කරනු ලබන්නේ මේ අයට මෙය මේ අනුව තමයි ලබා දි තිබෙන්නේ . ඒ අනුව කටයුතු කරන්න කියා. සභාවේ විරුද්ධත්වයක් නැහැ කියන විස්තරය දිය හැකියි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහෙම කරන්න. දැන් මෙය නියෝගයක් ලෙස නේ පෙත්සම් කාරක සභාවෙන් යොමු කළේ. ඒ අනුව තමයි සභාව දුන්නේ. මේ තත්ත්වය අපි පෙත්සම් කාරක සභාවට දැනුම් දෙන්න.තීන්දුවකට දෙන්න කියා.අපිට වඩා ඉහළින් දෙන තීන්දුවකට තමයි මෙය බැදෙන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් පෙත්සම් කාරක සභාවනේ අපට එව්වේ. අපි දැන් එහෙටම යවන්නේ ඒ කාරණාව සම්බන්ධයෙන්.දැන් ඔජ්පු මනිනකන් , ගන්නකම් අපිට හරි කරදරයක් තිබ්බා මේ සභාව තුළ.පුදුම

අසිරුතාවයකට පත් වුණා ගරු මන්ත්‍රිවරු .මෙය කඩලා දුන්නාට පසු ඔප්පු ගන්නේ නැති අයට මොකද කරන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

පෙත්සම් කාරක සභාවෙන් තීන්දුවක් දී තිබෙනවා මේ විදියට.මේ පසුගිය 31 ට පෙර තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවට මිලදී ගන්න. නැතිනම් තක්සේරුවට විකුණන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්__

ගරු සභාපතිතුමනි ,දැන් ඒ දිනය පැනලා නේද.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

දැන් බදු දිය යුතුයි.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්__

දැන් බදු දෙන්න බැහැනේ 30 පහුවෙලානේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

බදු දෙන්න පුළුවනි . 30වෙනිදා පහුවුණාට.ඒ අයට මුදල් ගෙවන්න දෙසැම්බර් 31 වනතුරු කාලයක් ලබා දුන්නා.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්__

ගරු සභාපතිතුමනි ,එතකොට එය මිලදී ගත් පුද්ගලයාට ලොකු අසාධාරණයක් වෙනවා.එතකොට එකම අයිතිවාසිකම වගේනේ තිබෙන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

නැහැ. බදුකරුගේ අයිතිවාසිකමයි අයිතිකරුගේ අයිතිවාසිකමයි දෙකක්.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්__

ඒ වුණාට ගරු සභාපතිතුමනි , මෙය මුදල් ගෙවා ගත් පුද්ගලයාටත් සුගතියක් වෙලා නැහැනේ.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, එය බේරා දිය යුතුයි.මේ නාගරික සංවර්ධන අධිකාරියේ ලිපියේ තිබෙනවා . මෙය ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නේවාසික පදිංචියට අවසර දිය නොහැකි බව. එම නිසා අපි මේ පිළිබඳ සභාව ඉදිරිපත් කළා කියා පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතුයි. ඔවුන් විසින් තමයි මෙයට නියෝගය ලබා දුන්නේ. එම නිසා ඔබතුමාලා මැදිහත් වෙලා මෙය සිදු කරන්න කියා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

දැන් පළාත් සභාව ක්‍රියාත්මක නැති නිසා පෙත්සම් කාරක සභාව ක්‍රියාත්මක නැහැ. එම නිසා මෙය ගරු ආණ්ඩුකාරතුමාටම ලියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

එතකොට ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ ආකාරයට අනික් පැත්තෙන් ගැටළුවක් තිබෙනවා. දැන් මේ කොටස් 4ම කොටස් 2ක් දෙදෙනෙකු මුදල් ගෙවා ලබා ගත්තා. අපට බැරිද මේ අනෙක් දෙදෙනාටත් මුදල් ගෙවා ගන්න කියන්න. එවිට මේ ප්‍රශ්න හතරම එකට විසඳා දමන්න පුළුවනි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔවුන් මෙම ගෙවීම සිදු නොකළේ මුදල් නොමැතිකම නිසා වෙන්නැති. අපිට පුළුවනි බදු ක්‍රමයට යන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , එසේ නම් අනික් අයටත් අගතියක් නොවන පරිදි හරි බදු ක්‍රමයකට යන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බදුක්‍රමයට යාමේදි අපි තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව තමයි යන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අනික් කරුණ දැන් මෙහි තාක්ෂණසේවා නිලධාරින්ගේ වාර්තාව හරියට ඇවිත් තිබෙනවාද? මොනවාද තාක්ෂණසේවා නිලධාරින් ලියා ඇත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉල්ලීමක් තිබෙනවා. එය තිබෙන්නේ වෙනම ගොණුවක.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ. නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙය ප්‍රතික්ෂේප කරන්නේ නැහැනේ තාක්ෂණසේවා නිලධාරින් හරියට නිර්දේශයක් ලබා දුන්නානම්.හේතු කාරණාවක් දැමුවානම් සමහර විට මෙය නොකර ඉන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා මේ වෙනුවෙන් සැලසුම් කමිටුවේ ප්‍රකාශ කළා. මෙය අපේ එකක් නෙමේ . මෙය පෙත්සම් කාරක සභාවෙන් ලබා දුන් එකත් මෙය ලබා දෙන්න. එම මහත්මිය ප්‍රකාශ කර සිටියා මෙය නාගරික සංවර්ධන අධිකාරියට යවන්න කියා. එය තමයි. මා මෙතනින්ම අවසන් කරන්න බැලුවේ.ඒ යැවීමෙන් පසු ලැබුණු තීන්දුව තමයි මේ.මෙහි වාර්තාවට ලියන්න. දකුණු පළාත් සභාවේ පෙත්සම් කාරක සභාව අනුමත කර සභාව විසින් මෙම ඉඩම ලබා දි ඇති බැවින් මෙය අනුමත කිරිම සඳහා ගරු සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් විසින් ඒකමතිකව අනුමත කරන ලද නිසා මේ සඳහා අනුමතිය ලබා ගැනිමට ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලිම කරන්න.

**තීරණය**

ජී.එච්.ඒ.ශ්‍යාමලි මහත්මිය විසින් තිලිගලකන්ද නැමැති ඉඩමේ අනුබෙදිම සකස් කිරිම සම්බන්ධව කරන ලද ඉල්ලිමට අනුව , එය දකුණු පළාත් සභාවේ පෙත්සම් කාරක සභාවෙන් අනුමත කර මෙම ඉඩම ලබා දී ඇති බැවින් , මෙය අනුමත කිරිම සාධාරණ බව ගරු සභාවේ සියළුම මන්ත්‍රීවරුන් ඒකමතිකව අනුමත කර ඇති බැවින් ඒ බව දන්වා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලිමක් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.15 ගා/පී ද. එස්. කුලරත්න විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා විසින් විද්‍යාලය අවට පාසල් බස්රථ නතර කර තැබීම සම්බන්ධව ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගා/පී.ද . එස් . කුලරත්න විද්‍යාලය විසින් යොමු කරන ලද ලිපිය. විද්‍යාලය අවට පාසල් බස් රථ නතර කර තැබීම. පසුගිය දින වල රටේ ඇති වූ තත්වයන් සමඟ අප විද්‍යාලයේ තාප්පයට අදාල සීමාවේ පාර දෙපස සම්පූර්ණයෙන්ම වාහන නතර කර ගැනීම සිදු නොකරන ලද අතර එය ඉතාම හොඳ තත්වයකි. රටේ කලබලකාරි තත්වයන් නොතිබුණ ද විද්‍යාලයේ තාප්පය සීමාවේ පාරේ ප්‍රතිවිරුද්ධ පැතතේ හෝ වාහන නතර කර තැබීම අනාරක්ෂිත තත්වයකි. වාහන වලට මුවාවී හෝ ඒ අසල ඇති වන රොද තුළ විවිධ අකටයුතු සඳහා භාවිතා කිරිමේ අවකාශය අපරාධකරුවන්ට නිතැතින්ම ලැබි ඇත. අද දිනයේ තාප්පය සීමාවේ ඇති හිස් බිම් තුළ වාහන කිහිපයක් ගාල්කර තිබෙන දක්නට ලැබුණි. ටික වේලාවකට පසුව මාර්ගය අයිනේද වාහන නතර කිරිම සිදුකර තිබුණි. දැනට වාහන කිහිපයක් නතර කර තැබිමෙන් ආරම්භවන මෙම තත්ත්වය ඉදිරියේදි අනිවාර්යෙන් වර්ධනය වී තව තවත් වාහන ගාල්කර තැබීම වැලැක්විය නොහැකි වනු ඇත.අම්බලන්ගොඩ ධර්මාශෝක දේවානන්ද ප්‍රජාපති විද්‍යාලයන්හි තාප්ප සිමාවන්හි කිසිදු වාහනයක් නතර කර තැබිමට අවකාශ ලබා නොදෙන්නාසේම , අප විද්‍යාලයේ ද තාප්පයට අදාළ සිමාවේ බස් රථ සහ වෑන් රථ නතර කර තැබිමෙන් වලක්වා දෙන ලෙස කරුණිකව ඉල්ලා සිටි කියා විදුහල්පතිතුමා විසින් ලිපියක් එවා තිබෙනවා.මෙය එවා තිබෙන්නේ මුලස්ථාන පොලිස් පරික්ෂකතුමාට . අපට පිටපතක් එවා තිබෙනවා.මා මෙය ඉදිරිපත් කරනු ලැබුවේ වාහන නතර කර තැබිම සම්බන්ධයෙන් තහනම් කිරිමේ නිත්‍යානුකූල පසුබිම තිබෙන්නේ නගර සභාවටයි. සභාව විසින් එහෙම තින්දුවක් ගතහොත් ගැසට් කරන්න පුළුවනි.

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මාත් දිනපතාම කුලරත්න විද්‍යාලයට යනවා පාසල් දරුවෙකු රැගෙන එම සඳහා . මෙහි උඩ වාහන් නතර කර තබනවා. එක් දිනයකදි එම උඩ ඇති එක් වාහනයක තිරිංග නොමැතිව තවත් වාහන තුනක් පල්ලමට තල්ලු කර ගෙන පහළට එම වාහනය පැමිණියා. ඒ අවස්ථාවේ පාසලේ දරුවෙකු හරි හිටියානම් අනතුරට ලක්වෙනවා.මේ කටයුත්ත සිදු කිරිමට මේ තාප්පය ඉදිරිපිට ඇති වාහන ඉවත් කිරිම හොඳයි .එයට තිබෙන ඉඩකඩ මදි.එම නිසා මේ කටයුත්ත සිදු කිරිම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, එදා ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළා පස් සම්බන්ධව. මගේ ව්‍යාපෘතිවල පස් කැපෙනවා.දැන් නවගමවේ පස් කැපෙනවා. මා විදුහල්පතිතුමාට කතා කළා.බටපොළ නවගම ක්‍රීඩා පිටිය හදන තැන. මා විදුහල්පතිතුමාට ඒ වෙලවේම කිවුවා.නමුත් විදුහල්පතිතුමා අද වෙනකම් ක්‍රියාත්මක නැහැ.මට මගේ ව්‍යාපෘතිය අවසන් කරන්න ඕන.අද දිනයේ අම්බලන්ගොඩ පොලිසියේ මුලස්ථාන පොලිස් පරික්ෂක කතා කළා. මා ඔවුන්ටත් පස් අවශ්‍ය බව ප්‍රකාශ කළා.මා කැමති නැහැ පිටස්තර අයට දෙන්න. මෙය රජයේ ව්‍යාපෘතියක් නිසා.එම නිසා එතුමා මගෙන් ඉල්ලා සිටියා. කුලරත්න විද්‍යාලයට දෙන්න තිබුණා පස් කියුබ් 150ක් පමණ.පොලිසියේ පහල තිබෙනවා කැල්ලක් . එය ගොඩකිරිමට. ඔවුන් අලුතින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබෙනවා. මා ඔවුන්ට කිවුවා ඇඳ ගන්න කියා. මොකද ව්‍යාපෘතිය අවසන් කරන්න එපායි.විදුහල්පතිතුමා කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, රණසුරිය පාරේ පැති කාණු පද්ධතිය සැදුවානේ . එහි තිබු පස් කියුබ් 15ක් පමණ කුලරත්න විද්‍යාලයට දැමුවා.මුල්හරිය ගොඩකර ගනු ලැබුවා. මෙය හරියටම සැදිමට නම් පස් කියුබ් 250ක්වත් අවශ්‍යයි.එතැන ළඟත් නිසා . එම පස්ටික එතැනට දැමුවා.ඔබතුමාගේ අවධානය යොමුකරන්න. පුළුවන්තරම් ඉක්මනින් මෙය සාදා ගැනීමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් වෙලා තිබෙන්නේ මෙය සභාව විසින් ගොඩකරනු ලැබුවහොත් වනජීවි එකෙන් සභාවට විරුද්ධව නඩු දැම්මට පුළුවනි.අන්න එයයි තිබෙන ගැටළුව . ඔබතුමාට ඔහොම හොරෙන් ගිහින් දැමිය හැකියි. අපට නිත්‍යානුකූලව මෙය සිදු කළ නොහැකියි. මෙය වාහන නතර කිරිම තහනම් කළ හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය වාහන නතර කිරිම තහනම් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය තහනම් කළාට ඔවුන්ට විකල්පයක් ලබා දිය යුතුයි. මේ වාහන නතර කිරිමට තැනක් දිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ධර්මාශෝක විද්‍යාලයේ අයින් කළානම් , දේවානන්ද විද්‍යාලයේ අයින් කළානම් , ප්‍රජාපති විද්‍යාලයේත් අයින් කළානම් ඇයිද බැරි කුලරත්න විද්‍යාලයේ අයින් කරන්න.මේවා අයින් කළේ විකල්ප ලබා දි නෙමේ.අපි විකල්ප ලබා දි තිබෙනවා. ඒ තැන්වලට මිනිසුන් එන්න කැමති නැහැ.එකයි සිදුවෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

අපිට ඇත්තටම අවශ්‍ය නැහැ. විකල්ප ලබා දීම. අපි පසුගිය දිනවල රටේ ඇති වූ තත්ත්වය අනුව අපි හල්වතුර ක්‍රීඩා පිටියේ වාහන නතර කිරිමට ඉඩ ලබා දුන්නා. නමුත් වර්ෂා කාලයේදි නතර කර ක්‍රීඩාංගණය සම්පූර්ණ මඩවෙලා තිබෙන්නේ. පස් කණ්ඩි තිබෙනවා. ළමුන් වැටි වැටි සෙල්ලම් කරන්නේ.මෙය ගල්රෝල දමා තලා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ගල්රෝල දමා තලා දෙන්න.මෙය හදලා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කුලරත්න විද්‍යාලයට, ධර්මාශෝක විද්‍යාලය, දේවානන්ද විද්‍යාලයට දරුවන් ඇතුළත් කළ යුත්තේ මේ ප්‍රදේශවලිනි. නමුත් අපි ඈත ප්‍රදේශ වලින් ළමුන් ගන්නවා.ඒ පිළිබඳ ගැටළු තිබෙනවා.ඒ කිසිවක් නොසලකා ඈත. ප්‍රදේශයේ දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනිමට හැකියාව නැහැ මේ පාසල්වලින් . ඈත පළාත් වලින් පැමිණෙනවා. එයට අතුරු ප්‍රශ්නයක් ලෙස පැන නැගෙනවා බස්රථ නතර කිරිමේ ප්‍රශ්නය මතුවෙනවා.බස්රථයකින් දරුවන් පාසල් එනවා නම් පාසල ළඟම බස්රථය නතර කරගෙන සිටිම අවශ්‍ය නැහැ.බස්රථයෙන් දරුවා පැමිණියා නම් ළමයා බැස්සුවා ඔවුන් ඈත කොහේ හරි ගිහින් බස්රථය ගාල් කරගත යුතුයි.මේ කියන ස්ථානවල බස්රථ ගාල් කිරිමට ඉඩකඩ අපි ලබාදිය යුතු නැහැ.හැම දෙයක්ම අපි ඔලුවට දමාගන්න ඕන නැහැ.නගර සභාවට මළගෙවල් වල කොඩි ගසන්න ඕන, කාණු සුද්ද කරන්න ඕන , කුණු කසළ අයින් කරන්න ඕන, මාර්ග නඩත්තුව කරන්න ඕන . මේ හැම දෙයක්ම සිදු කළ යුතුයි.මේ හැම දෙයම අපි ඔලුවට දමා ගන්න ඕන නැහැ.බස්රථයකින් දරුවා ගෙනවිත් බැස්සුවා නම් බස්රථය නැවත යායුතුයි . අපි මොකටද එය ගාල් කිරිමට ඉඩක් ලබා දෙන්නේ. මොකටද අපි ඒ බර ඔලුවට දමාගන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙහි වාහන නතර කිරිම තහනම් කරන්න.

**තීරණය**

ගා/ පී.ද.එස්. කුලරත්න මහා විද්‍යාලය අසළ පාසල් බස් රථ නතර කර තැබිය නොහැකි බවට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.16 Chamber of Commerce & Imdustry – Ambalangoda ආයතනය මඟින් වෙළඳ හා කර්මාන්ත මණ්ඩලයේ මහා සභා රැස්වීම 2019.06.29 දින පැවැත්වීමට පුටු 100ක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පුටු 100 ක් ලබා ගැනීම. අප වෙළඳ හා කර්මාන්ත මණ්ඩලයේ මහා සභා රැස්වීම 2019.06.29 දින අම්බලන්ගොඩ අලුත් පාර අංක 23ප ස්ථානයේ පැවැත්වීමට නියමිතය. ඒ අවස්ථාවේ ප්‍රයෝජනයට ගැනීමට පුටු 100ක් නොමිලේ ලබා දෙන ලෙස අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය විසින් ඉල්ලීමක් කර ඇත. එය ලබා දි තිබෙනවා.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

වෙළඳ හා කර්මාන්ත මණ්ඩලයේ (Chamber of Commerce & Industry) මහ සභා රැස්වීම සඳහා සභා අනුමතියට යටත්ව පුටු 100ක් නොමිලේ ලබා දිම පිළිබඳව සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.17 ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් අබලි ද්‍රව්‍ය නොමිලේ ඉවත් කර ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් අබලි ද්‍රව්‍ය නොමිලේ ඉවත් කර ගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩාව අසළ අබලි ද්‍රව්‍ය ගොඩදමා ඇති අතර එම අබලි ද්‍රව්‍ය ඉවත් කර දෙනමෙන් ගොවිජන සේවා නිලධාරි විසින් ඉල්ලීමක් කර අත. එය ඉෂ්ඨ කර දි ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩාව අසළ ගෙඩ ගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත්කරදෙන ලෙස ඉල්ලා ඇති ඉල්ලීම සභා අනුමතියට යටත්ව ලබා දිම පිළිබඳව සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.18 ගා/ සිරි අභයතිස්ස කනිෂ්ඨ විද්‍යාලයට නොමිලේ තණකොළ කපන යන්ත්‍රය ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සිරි අභයතිස්ස කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ තණකොළ වැවී ඇති බැවින් එය ඉවත් කර ගැනීම සඳහා ඔබතුමාගේ සහාය අපේක්ෂා කර සිටි.එමෙන්ම සිසුන්ට ක්‍රීඩා කිරිමට අපහසු බැවන් පිටියෝ තණකොළ කපා ඉවත්කිරිමට ඔබ ආයතනයේ තණකොළ කපන යන්ත්‍රය නොමිලේ ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ සිරි අභයතිස්ස විද්‍යාලය අයිති වන්නේ අම්බලන්ගොඩ නගර සභාවට නෙමේ. ඊට කලින් කරන්න අර ධම්මකුසල විද්‍යාලය සුද්ද කරන එක.මොකද අම්බලන්ගොඩ නගර සීමාවටනේ අයිති. අපේ ප්‍රදේශයේ තිබෙන තණකොළ කපා ගන්න බැරිව අපි මේ සිටින්නේ. එම නිසා වෙනත් ආසන වල තිබෙන දෙවල්වලට ප්‍රමුඛස්ථානය දී කටයුතු කරන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහේ තිබෙන ක්‍රිඩා පිටිවල තණකොළ කපා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ ධම්මකුසල විද්‍යාලය අසළ යන්න බැහැ දැන්. අපි හැමදාම කියනවා. මා නම් මෙයට විරුද්ධයි.පිටට මේ කටයුත්ත සිදු කිරිමට ප්‍රථම අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඕනතරම් මේ කටයුත්ත සිදු කිරිමට තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතුමියගේ අදහසත් යම් ආකාරයට අගය කරන අතර මේ සිරි අභයතිස්ස කනිටු විදුහල දකුණු පළාතේ විශිෂ්ඨම විද්‍යාලය බවට පත්වුණා. පසුගිය දිනවල සාමාන්‍ය පෙළ විභාගය අනුව.හොඳම විදුහල්පතිවරයා බවට පත්වු එම විදුහල්පතිවරයා ආසන්නම තම සභාවේ එවැනි යන්ත්‍රයක් නොමැති නිසා තමයි මෙම ඉල්ලීම කර ඇත්තේ.අපේ කෙරමිණියේ ආසනයේ ගම්වැසියන්ගේ දරුවන් මේ පාසලට යනවා. අම්බලනේගාඩින් ප්‍රතික්ෂේප වන නිසා.එම නිසා යම් ආකාරයකින් හැකියාවක් තිබෙනවා නම් මෙය ලබා දෙන්න. මොකද මේ උපකරණ නැහැ ඒ සභාවේ.එම නිසා හැකියාවක් තිබේනම් මෙය දෙන එක තමයි අපි කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ඉතා කුඩා පාසලකි.මා දන්නවා කෙරමිණිය ප්‍රදේශයේ මේ කොනේ සිටින දරුවන් ධර්මාශෝක විද්‍යාලයට , දේවානන්ද විද්‍යාලයට, ප්‍රජාපතියට, කුලරත්න විද්‍යාලය යන මේ කිසිදු පාසලකට අයත් වන්නේ නැහැ.යන්නේ මේ පාසලට.එම නිසා අපි මෙය සිදු කර දෙන්න.වතුගෙදර පැත්තේ ජනතාව ප්‍රකාශ කර සිටිනවා . ඔවුන් අම්බල්නගොඩට එකතු කර ගන්න කියා.

**තීරණය**

ගා/ සිරි අභයතිස්ස කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ තණකොළ කපා ඉවත්කර ගැනිම සඳහා තණකොළ කපන යන්ත්‍රය නොමිලේ ලබා දීම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.19 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් මුහුදු ආශ්‍රිත කලාපයේ ස්වභාව සම්පත් ආරක්ෂාව පිළිබඳ වැඩසටහන සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මුහුදු ආශ්‍රිත කලාපයේ ස්වභාව සම්පත් ආරක්ෂා කිරිම පිළිබඳ වැඩසටහන. චීනයේ මින්ජියැන් විශ්ව විද්‍යාලය විසින් පළාත් පාලන ආයතන සඳහා උක්ත වැඩසටහන 2019 අගොස්තු මස 26-30 දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම

වැඩසටහන සඳහා පාඨමාලාව , නවාතැන්, ආහාරපාන සහ අභ්‍යන්තර ගමන් වියදම් ෆෝෂූ නගර සභාව විසින් දරණ අතර ගුවන් ටිකට්පත් වියදම් සහභාගීවන්නන් දැරිය යුතුවේ. මේ සඳහා අම්බලන්ගොඩ නගරසභාව නියෝජනය කරමින් සුදුසු කෙනෙකු නම් කරන මෙන් කරුණිකව ඉල්ලා සිටි.මේ සඳහා මා ඉල්ලීමක් කර සිටිනවා ගරු මන්ත්‍රිවරුනගෙන් මෙයට සහභාගී වීමට මට අවසර ලබා දෙන්න කියා.එසේම මා ඉල්ලීමක් කර සිටිනවා මෙහි ගුවන් ටිකට්පත් වියදම දරන ලෙස.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙහි නිත්‍යානුකුල තත්ත්වය කොහොමද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය නිත්‍යානුකුලයි

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එහෙම දෙන්න පුළුවන්ද

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දෙන්න පුළුවනි. මීට කලිනුත් අපි සහභාගි වී තිබෙනවා. සංසදය මඟින් මේ සඳහා යන නවාතැන් , ආහාරපාන සහ අභ්‍යන්තර ගමන් වියදම් සඳහා යන වියදම් දෙනවා. ඒ සියල්ලම නගර සභාව විසින් සපයනවා.අපට ගුවන් ටිකට්පත අරගෙන යන්න විතරයි තිබෙන්නේ.මා ඉල්ලීමක් කර සිටිනවා මට යන්න අවසර හා ටිකට්පතක් ලබා දෙන ලෙස.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,ඔබතුමාට නිත්‍යානුකුලව සභාවට ලැබුණු ආරධනවක් නේ ඒ නිසා ඔබතුමාට ගුවන් ටිකට් පත ලබා ගැනිමට සභාව විරුද්ධ වෙන්න හොඳ නැහැ.ගරු සභාපතිවරයා වශයෙන් ඔබතුමාට අයිතියක් තිබෙනවා.ඒ සමඟම ඉල්ලා සිටිනවා ගරු මන්ත්‍රිවරුන්ට මේ සඳහා යන්න කැමති කෙනෙකු සිටි නම් තමන්ගේ වියදමින් යන්න අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ සඳහා මා ඉල්ලිමක් කරන්නම්.ඒ යන අය සිටිනම් මට කියන්න.මාගේ මෙය ස්ථිර කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

මා ඔබතුමා මේ ගමන යාම පිළිබඳව ස්ථිර කරනවා. ඔබතුමාගේ යන ගමනට සුභ පතන ගමන්ම ඒ සඳහා යන වියදම සභාවෙන් දැරිම පිළිබඳ කිසිදු විරුද්ධත්වයක් නැති බවත් එය අනුමත කරනවා. අප ඉල්ලා සිටිනවා අපෙත් යාමට කැමති අයට විසා බලපත්‍රය ලබා දෙන්න . අපි ගුවන් ටිකට්පත සඳහා යන වියදම දරා ගන්නම්.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා එය විසඳා දෙන්නම්. කැමති අය සිටිනම් සභාවෙන් පසු මට විස්තර ටික දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මේ සඳහා යන වියදම සහ අනුමතිය ඔබතුමාට ලබා දෙනවා . ඒ පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් නැහැ. අපි මෙයට විරුද්ධ නැහැ. ප්‍රශ්නයක් නැහැ.

**තීරණය**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මඟින් මුහුදු ආශ්‍රිත කලාපයේ සම්පත් ආරක්ෂාව පිළිබඳ වැඩසටහන සඳහා චීනයේ මින්ජියැන් විශ්ව විද්‍යාලය විසින් පළාත් පාලන ආයතන සඳහා 2019 අගෝස්තු මස 26 දින සිට 2019 අගෝස්තු මස 30 දක්වා පැවැත්වෙන වැඩසටහන සඳහා අම්බලන්ගොඩ නගර සභාව නියෝජනය කරමින් , සභා අරමුදලින් ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා සහභාගී කර වීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**03.20 ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුම.මෙම සභාවේ ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා සි/ස එල්.ආර්.ඩී.සී. සේවා ( පුද්ගලික ) සමාගම ගිවිසුම් ගත වී ඇති කාල සීමාව 2019/07/31 දිනෙන් අවසන් වේ. ඉදිරි කටයුතු සඳහා කරුණිකව ඉදිරිපත් කරනවා.නැවත ටෙන්ඩර් කිරිමට සභාව තීන්දු කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඒ සමඟම ඉල්ලා සිටිනවා ටෙන්ඩර් කරනවාට වඩා සිවිල් ආරක්ෂක බලකාය බඳවා ගැනිම හොඳයි. රජයේ ආයතන බොහොමයක සිටින්නේ සිවිල් ආරකෂක සේවයයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ පිළිබඳව සොයා බලන්නම්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නැහැ ඒ පිළිබඳ ගැටළුවක් නැහැ. රජයේ ආයතන හැම තැනකම තිබෙන්නේ සිවිල් ආරක්ෂක බලකාය.මේ නගර සභාව හරියට කරන්න නම් මොවුන් බඳවා ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිලඇඳුම් තිබෙන කෙනෙක් සිටිය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කරන පරිදි ටෙන්ඩර් කරන්නේ නැතිව සභාව එකඟ නම් රජයේ ආයතන වල සිටින්නේ සිවිල් ආරක්ෂක බලකායට අනුයුක්ත අය.එම නිසා ඒ අයටම දෙන්න. අනෙක් එක ඒ අය අඳිනු ලබන්නේ වෙනම නිලඇඳුමකි.සිවිල් ආරක්ෂක නිලධාරීන් අඳිනු ලබන්නේ පොලිසියට සමාන නිල ඇඳුමකි.ඔවුන්ට තිබෙනවා පොඩි භයක් හා වැදගත්කමක්. එම නිසා මා හිතනවා මේ ආයතනයේම දිර්ඝ කළානම් හොඳයි කියා තව දික්කරන්නේ නැතිව.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සඳහා ඉල්ලා සිටිනවා බස්නැවතුම්පොළේ ආරක්ෂාව සපයනවා වගේම නගරයේ සංචාරය කිරිම සඳහා තව ස්ථිර දෙදෙනෙකු ඉල්ලා සිටින ලෙස මා යෝජනා කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු උප සභාපතිතුමා , මේය වෙළඳ සංගමයෙන් ඕන ක්‍රියාත්මක කරන්න.මේ සම්බන්ධව ගරු මන්ත්‍රිවරු දැනුවත් විය යුතුයි.වෙළඳ සංගමයට අපි කලින් අවසරය දුන්නා නගර 48 ක නියදියක් පරික්ෂණයක් කර තිබුණා.අපි හිටියේ 48න් 42වෙනි ස්ථානය.ඒ කියන්නේ ව්‍යාපාර කැඩීම පිළිබඳ පැමිණිලි ආපු අයගෙන් අපි සිටින්නේ 42වෙනි ස්ථානයට.එම නිසා අම්බලන්ගොඩ වෙළඳ සංගමය කැඳවා මා ප්‍රකාශ කර සිටියා. ඒ වන විට යුධ සමයයි. යුද්ධය පැවැතුන නිසා එතුමලාට අපි දුන්නා නගර ආරක්ෂක බලකායක් හදන්න කියා. අපි ඔවුන්ට දුන්නා අම්බලන්ගොඩ නගරයේ එකතු වන වාහන නැවතුම්පළවල් වලින් ලැබෙන මුදල් වලින් 50%ක් අපිට ලබා දෙන්න. ඉතිරි 50% ඒ සඳහා යොදවා ගන්න.නමුත් ඔවුන් එම කාර්ය සිද්ධ කළේ නැහැ.ඊටපසු ඒ අය පොළියට දිමේ බැංකුවක් පටන් ගත්තා.දැන් එහි ලක්ෂ 20ගණනක් තිබෙනවා.මීට වඩා මේ රාජකාරිය CCTVකැමරා සවිකර පොලිසියට භාර දුන්නානම් හොඳයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා එතනට එන්න තමයි පැමිණියේ දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමට ප්‍රථම. මෙහෙම දෙදෙනෙකු බඳවා ගැනිමට ප්‍රථම මේ වාහන නැවතිමේ රළුගාල් මුදල් අපිට අනිවාර්යෙන්ම ලබා ගැනිමට පුළුවනි.මේ සඳහා අපේ ආදායම් පරික්ෂක මහතුන් සමඟ ගියත් මේය සිදු කරන්නේ නැහැ. ඒ අයගේ තිබෙන ඇඟේ හයිය සහ කටේ හයිය නිසා.එම නිසා මේ සඳහා අපි දෙදෙනෙකු යොදවා ගනිමු.ඒ මුදල අපිට වාහන නතර කිරිමේ ගාස්තු ලෙස අය කරගන්න පුළුවනි.නගර සභාවේ හා බස්නැවතුම්පොළේ ආරක්ෂාවට අමතරව නගරයේ ආරක්ෂාවට දෙදෙනෙකු බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.එම නිසා මේ නගරය යම්තැනකට ගෙන එමට නොහැකි වෙනවා මේ තත්ත්වය යටතේ.වෙළඳ සංගමය වත් කවුරුවත් මෙයට මැදිහත් වෙන්නේ නැහැ.ඔබතුමා කිවු පරිදි ඔවුන් බැංකුවක් පටන් ගෙන තිබෙනවා.නගරයේ ආරක්ෂාව සහ නගරයේ වාහන නතර කිරිම පිළිබඳ වගකිම නගර සභාවක් වශයෙන් අපට තිබෙනවා.එම නිසා එය පැහැර හරින්න එපා. මේ දෙදෙනා වෙනුවෙන් යම්කිසි මුදලක් වැය වෙයි.මේ නගරය යම් තත්ත්වයකට ගෙන එමට පුළුවන් කියන අදහස මගේ තිබෙනවා. එම නිසා මේ කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

වෙළඳ සංගමය රැස්වීමක් ඉල්ලා සිටිනවා නගර සභාව සමඟ. එදාට කතා කළානම් හරි මේ ගැන.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ඔබතුමා කිවු පරිදි අපට වඩා ආර්ථික මට්ටමින් අඩු නගර වලත් CCTV කැමරා සවිකර පොලිසියට භාර දි තිබෙනවා. ඔවුන් තමයි අධික්ෂණ කටයුතු කරන්නේ.එමනිසා යම් සිදුවිමක් සිදු වි තිබෙනවා නම් එය සම්පිණ්ඩණය කර ගැනිමට හැකියාව පොලිසියට තිබෙනවා.ඒ තුලින් අපි ආරක්ෂක සේවකයෙකු යොදවන්න අවශ්‍ය නැහැ. ඒ තුලින් දන්නවා මෙහි මොකක්ද සිදු වන්නේ. එවිට නගරයේ සිටින කවුරුත් එයට ඇතුළත් වෙනවා.මෙතුමා කිවු පරිදි අම්බලන්ගොඩ හොඳ වෙළඳ සංගමයක් තිබෙනවා. වෙළඳ සංගමයක් තිබියදි ඇයි නගර සභාවෙන් වාර්ෂිකව මේ සඳහා මුදලක් දරනු ලබන්නේ.මේ ටික බැලුවිට ලොකු මුදලක් වෙනවා.අපි කළ යුත්තේ වෙළඳ සංගමය සමඟ සාකච්ඡාවක් ලබා දී වෙළඳ සංගමයේ දායකත්වයක් ගෙන CCTV කැමරා පද්ධතියක් අම්බලන්ගොඩ නගරයේ ආවරණය වන පරිදි සවිකරන එක තමයි කළ යුත්තේ.මෙයයි කළ යුත්තේ. මිට වසර 1 ½ කලිනුත් මෙය ආවා.පැමිණ මේ සඳහා මිළ ගණන් ගනු ලැබුවා.නැවත පස්සට ගියා.

**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

කැමරාව කඩෙන් ගෙනත් සවිකළත් ප්‍රශ්නයක් නැහැ.වෙළඳසැල ඉදිරිපිට කැමරාව වෙළඳසැල් අයිතිකරුට සවිකර ගැනිමට කියන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි වෙළඳ සංගමය සමඟ මුලින් සාකච්ඡා කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

රු.4000/= ක මුදලක් කැමරාවක් වෙන්නේ. එය කඩෙන් ගෙන සවිකර ගත හැකියි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ආරක්ෂක සේවාව සඳහා නැවත ටෙන්ඩර් කිරිම හෝ සිවිල් ආරක්ෂක සේවය ලබා ගැනිම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.21 අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ දෛනික රාජකාරි කටයුතු සිදුකර ගැනීම සඳහා යතුරු ලියන යන්ත්‍රයක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ දෛනික රාජකාරි කටයුතු සිදුකර ගැනීම සඳහා යතුරු ලියන යන්ත්‍රයක් ලබා ගැනීම සම්බන්ධව.දෛනික රාජකාරි කටයුතු බහුල වීම හේතුවෙන් වාර්තා හා උද්ධෘත පිටපත් ලබා ගැනීම නිතර නිතර සිදුවනු ඇත.එබැවින් යතුරුලියන යන්ත්‍රයක් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින බව අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරික්ෂකතුමා විසින් ලිපියක් එවා තිබෙනවා.මෙහිදි අප භාවිතා කරන්නේ නැති යතුරුලියනයක් ඉවත් කර තියෙනවා. සියළුම ගරු මන්ත්‍රිවරු එකඟතාවයක් තිබෙනවා නම් එය පොලිසියට ලබා දිම පිළිබඳ එය ලබා දිය හැකියි.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

එය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය අලුත්වැඩියා කටයුතු කර ලබා දෙන්න. මෙය පොදු තැනට ලබා දෙන්නේ එය අලුත්වැඩියා කර අපි පරිත්‍යාග කරන්න.කැඩුනු එකක් දෙනවාට වඩා. පොඩි මුදලක් යයි. එය අලුත්වැඩියා කටයුතු සිදු කර දුන්විට නගර සභාව පොලිසියට යතුරුලියනක් ලබා දුන්නා වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය අලුත්වැඩියා කටයුතු කර ගැනීම පොලිසිය මඟින් කරගන්නම් කිවුවා.යතුරු ලියනය ලබා දෙන්න. ගරු මන්ත්‍රිවරු එකඟද ?එකඟ නම් අපි ලබා දෙමු.පොලිසිය රාජකාරි කටයුතු කරන්නේ ගමේ ජනතාව වෙනුවෙනි.

**තීරණය**

පරිගණක යන්ත්‍ර භාවිතා කරන නිසා අම්බලන්ගොඩ නගර සභාව සතු භාවිතයට නොගන්නා ලද යතුරු ලියනය අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ දෛනික රාජකාරි කටයුතු සඳහා සහා අනුමතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**03.22 බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයට බදු දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයේ ඇති ගිවිසුම අවසන් වෙනවා 2019.04.30 දිනෙන්.මෙය අලුතින් දිර්ඝ කිරිමට සභාවේ අවසර ඉල්ලා සිටිනවා.තව වසරකින්

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

බදු දුන්නාට කමක් නැහැ. දැන් මෙහි බදු මුදල කියද දෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලිපි ගොණුව බලා කියන්නම්.මසකර රු.4200ක මුදලට තමයි මෙය බදු දෙනු ලබන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එම මුදලට ලබා දුන්නාට මෙය අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතුයි.සමහර තැන්වල උළු වැටි තිබෙනවා.මේවාත් පොඩ්ඩක් නඩත්තු කරන්න කියන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය කලින් බදු දී තිබුණේ රු250/= ක මුදලකට. මෙහි ඇත්තටම අපි බලාපොරෝත්තු වන්නේ මුදල් නොමැති අයට පුහුණු වීම් කටයුතු සිදු කිරිම සඳහා ලබා දිමටයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එය සිදුවන්නේ නැහැ. දැන් එතැන ඔබතුමා බලන්න එතැන දැන් කඩයක් දමාගෙන තිබෙනවා. පෙට්ටි කඩයක් දමා තිබෙනවා. එතැන ඉදිරිපිට.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

අපි ඒ අයට දැනුම් දෙන්න මේ බදු මුදල වැඩි කළා . එය රු.5000/= ක මාසික දීමනාවකට එකඟ වෙනවා නම්. මෙය ලබා දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙය ලබා දුන්නාට කමක් නැහැ. මෙම ගොඩනැඟිල්ල ආරක්ෂා විය යුතුයි. මෙය ආරක්ෂා වන විදියට කටයුතු කරන්න. අන්තිමට ගොඩනැඟිල්ල නැති වෙයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා අපි මුදලක් තින්දු කළ යුතු නැහැ. ආදායම් පරික්ෂක මහතුන්ගේ තින්දුවට යටත්ව මුදලක් තීරණයකර මෙය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ. ගොඩනැඟිල්ල ගැනත් කියන්න.උළු කැටයක් කැඩුනු විට එය දමා ගනනේ නැහැ.දැන් එතැන කඩයක් දමා තිබෙන්නේ කවුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අය පසුගිය වතාවේ මෙය ලබා ගන්නා විට 2018.02.28 දින සිට ආදායම් වියදම් වාර්තාවක් සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ සම්බන්ධව මේ අයට ලැබුණු ආදායම රු.352769.62 කි . වියදම ගිහින් තිබෙනවා 352769.62 ස්ථාවර තැන්පතු දමා තිබෙනවා රු.150000/= ක මුදලකි . 2017.03.28 සිට 2018.02.28 දක්වා .පසුගිය වසරේ මේ විදියට මුදල් අයකර ගෙන තිබෙනවා.දේවානන්ද විද්‍යාලයෙන් රු.22000/=, කුලරත්න විද්‍යාලයෙන් රු.15028කි.ප්‍රජාපති විද්‍යාලයෙන් රු.16868/= ක මුදලකි.වෙනත් ආදායම් 124000/= කි.ක්‍රීඩාංගණ පුහුණු සංචිත වලින් ගෙවා තිබෙනවා රු.35300/= ක මුදලකි.අමතර පුහුණු ගාස්තු 31910/=කි. යාවජීව සාමාජික මුදල් රු.24000/=කි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් එක ප්‍රශ්නයක් නැහැ. නිලධාරින් කවුද සිටින්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රෙට්ටන්, ධර්මසිරි ගිනිගේ, ජී.එම්. ද සිල්වා,ජගත් සේනාරත්න, ඉඳුමිණි ලියනගේ,ජානක පේදුරුහේවා,සභාපති ටී.චින්තා ද සිල්වා, ක්‍රිඩා ලේකම් ධම්මික ප්‍රියංජනි,ඔන්න ඔය තමයි ඉන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා කියා සිටින්නේ මෙය තාක්ෂණ සේවා නිලධාරි මහතා යවා පරික්ෂාකර මේ ගොඩනැගිල්ලේ තත්ත්වය බලා මෙය නඩත්තු කටයුතු සිදු කරන්න කියන්න.එවත් බලා මේ කටයුත්ත සිදු කරන්න.මේ කඩයක් දමා තිබෙනවා. ඒ ගැන බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කඩ කාමරයට වෙනම තිබෙනවානම් ඒ තත්ත්වයත් බලන්න.සංගමයෙන් කරනවා නම් ඒ සඳහා බදු අයකරන්න. පිට කෙනෙකු කරනවානම් අයින් කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව සතු බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය ( පැරණි ) අම්බලන්ගොඩ නගර බැඩ්මින්ටන් ක්‍රිඩාංගණයට වසරක කාලයක් සඳහා ආදායම් පරික්ෂක මහතා පරික්ෂාකර බදු මුදල තීරණය කිරිමත් එහි සංගමය මඟින් කඩකාමරය පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා වෙනම තක්සේරු කර මුදල් ගෙවිම සිදු කිරිමත්, පිටස්තර කෙනෙකු මෙය පවත්වාගෙන යන්නේ නම් එය ඉවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.23 2019 වර්ෂයේ අභ්‍යාන්තර විගණන සැලැස්ම සභාගත කිරිම.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 වර්ෂයේ අභ්‍යාන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර තිබෙනවා. මේ අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවකි.මෙය වැඩක් නැහැ. මේ කාලවලදී ඇය ක්‍රියාත්මක වන සැලැස්ම.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අභ්‍යන්තර විගණන නිලධාරි විසින් 2019.07. 01 සිට 2019.12.31 දින දක්වා ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන සැලැස්ම - ( අර්ධ වාර්ෂික ) සඳහා සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**03.24 පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ඩෙංගු මර්ධන කටයුතු සඳහා දෛනික ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවකයන් 10කු සේවයේ යෙදවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මිළඟට ඩෙංගු මර්ධන කටයුතු සඳහා දෛනික ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවකයින් 10කු සේවයේ යෙදවිම.උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක පපාසකො/ගා/ආ/5//03 හා 2019.06.26 දිනැති ලිපිය හා බැඳේ.එමඟින් දකුණු පළාත තුළ අධි වසංගතයක් ලෙස පැතිර යාමේ අවධානමක් ඇති ඩෙංගු රෝගය මැඩ පැවැත්විම සඳහා 2019.06.20 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ සාකච්ඡා වු බවත් , එහිදි දෛනික ගෙවිම් පදනම මත ලියාපදිංචි කර සේවකයින් 10 දෙනෙකු සේවයේ යෙදවිමට තීරණය කළ බව හා දෛනික ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවකයින් 10 දෙනෙකු මාස දෙකක කාලයක් සඳහා බඳවා ගෙන සේවයේ යෙදවීම නිර්දේශ කර යතෝක්ත ලිපිය මා වෙත යොමු කර ඇත. එ අනුව ඩෙංගු වසංගත තත්ත්වය හදිසි අවශ්‍යතාවයක් බැවින් සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවිමේ පදනම මත ප්‍රාදේශීය සභා පනතේ 19 (1) වගන්තිය ප්‍රකාරව දෛනික ගෙවීමේ පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරු 10ක් සඳහා මාස දෙකක කාලයක් සඳහා බඳවා ගැනිමට මෙයින් අනුමැතිය ලබා දෙනවා. එසේම ඉදිරියේදි මේ සම්බන්ධයෙන් විධිමත් සභා තීරණයක් ගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට පියවර ගන්නා ලෙසද කාරුණිකව දන්වා සිටි.අපි මාස දෙකක කාලයකට සභාවෙන් දෛනික වැටුප් ගෙවිමට බඳවා ගෙන දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිට භාර දෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.මේ සම්බන්ධව වැඩකිරිමට කැමති සේවකයින් සිටිනම් ගරු මන්ත්‍රිවරුන්ට ඉදිරිපත කරන ලෙස ඉල්ලා සිටිනවා. දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිටත් දැනුම් දි තිබෙනවා මේ සම්බන්ධව.

**තීරණය**

අභ්‍යන්තර විගණන නිලධාරි විසින් 2019.07. 01 සිට 2019.12.31 දින දක්වා ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන සැලැස්ම - ( අර්ධ වාර්ෂික ) සඳහා සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- නැත

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**05.01 සභිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05.01.01 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**තීරණය**

2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.02 අම්බලන්ගොඩ නගර සභාව විසින් 2019 ලෝක ළමා දිනය සැමරිමේ උළෙල පැවැත්විම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව විසින් 2019 ලෝක ළමා දිනය සැමරිමේ උළෙල ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

05.01.03 නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ සිදු කිරිම සුදුසු බවට යෝජනා කිරිම.

**තීරණය**

නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.03 නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.04 තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ( මාලා මහත්මියගේ නිවස අසළ ) සහා අරමුදලින් සකස් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ( මාලා මහත්මියගේ නිවස අසළ ) සහා අරමුදලින් සකස් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.05 තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානයේ කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානයේ කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.06 හින්ඇල පාර බොක්කුව ප්‍රතිසංස්කරණය කිරිම සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

හින්ඇල පාර බොක්කුව ප්‍රතිසංස්කරණය කිරිම සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.07 එස්.පී.ඒ. ද සිල්වා මාවත හරස් මාර්ගය ( කාණුව ප්‍රතිසංස්කරණය ඩෙන්සිල් මහතාගේ නිවස අසළ ) සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

එස්.පී.ඒ. ද සිල්වා මාවත හරස් මාර්ගය ( කාණුව ප්‍රතිසංස්කරණය ඩෙන්සිල් මහතාගේ නිවස අසළ ) සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.08 සංඝරාජ මාවත අතුරු මාර්ගය (ධර්මාශෝක විද්‍යාලය පිටුපස ගේට්ටුව අසළ ) සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි.**

**තීරණය**

සංඝරාජ මාවත අතුරු මාර්ගය (ධර්මාශෝක විද්‍යාලය පිටුපස ගේට්ටුව අසළ ) සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.09 හල්වතුර බී.ජී. සුනිල් මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

හල්වතුර බී.ජී. සුනිල් මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.10 කන්ද මාවත ප්‍රධාන කාණු පද්ධතිය අදියර 1 සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

කන්ද මාවත ප්‍රධාන කාණු පද්ධතිය අදියර 1 සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.11 කුලරත්න හරස් පාර කාණු පද්ධතිය ( විලේගොඩ හන්දියේ සිට පීරිස් වෙද මාවත දක්වා වම්පස) සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට යෝජනා කරන ලදි**

**තීරණය**

කුලරත්න හරස් පාර කාණු පද්ධතිය ( විලේගොඩ හන්දියේ සිට පීරිස් වෙද මාවත දක්වා වම්පස) සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.13 කුලරත්න හරස් පාර වම්පසට ඇති පලමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට යෝජනා කරන ලදි**

**තීරණය**

කුලරත්න හරස් පාර වම්පසට ඇති පලමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.14 පින්නදූව තොටුපල පාර සංවර්ධනය කිරීම සහා අරමුදලින් සිදූකිරිම සුදුසු බවට යෝජනා කරන ලදී**

**තීරණය**

පින්නදූව තොටුපල පාර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සහා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.15 ඕකන්ද සිරිල් මහතාගේ නිවස අසළ මාර්ගය හා කාණු පද්ධතිය සහා අරමුදලින් සිදූකිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.**

**තීරණය**

ඕකන්ද සිරිල් මහතාගේ නිවස අසළ මාර්ගය හා කාණු පද්ධතිය සහා අරමුදලින් සිදූ කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.16 තුඩුවමුල්ල නාන තොටුපල සංවර්ධනය කිරිම සහා අරමුදලින් සිදූකිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.**

**තීරණය**

තුඩුවමුල්ල නාන තොටුපල සංවර්ධනය කිරිම සහා අරමුදලින් සිදූ කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සහා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.17 එස්.ජී.ඒ. ද සිල්වා මාවත ලුම්බිණිය අසළ කාණු කොටස සහා අරමුදලින් සිදූකිරිම සුදසු බවට යෝජනා කරන ලදී.**

**තීරණය**

එස්.ජී.ඒ. ද සිල්වා මාවත ලුම්බිණිය අසළ කාණු කොටස සහා අරමුදලින් සිදූ කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සහා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.18 හල්වතුර කසළ අංගණයේ කසල වැසීමේ කටයුතු සඳහා පස් ලබා ගැනීම සහා අරමුදලින් සිදූකිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.**

**තීරණය**

හල්වතුර කසළ අංගණයේ කසල වැසීමේ කටයුතු සඳහා පස් ලබා ගැනීම සහා අරමුදලින් සිදූ කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.01.19 ස්ථාවර තැන්පතු මුදල් ආපසු ගැනීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තැන්පත්වලින් ගැනිම සඳහා මෙන්න මේ ගෙවිම් තිබෙනවා.ගෑස් සඳහා රු.96800/= ,සමුපකාර සමිතියට රු.263644/=,දේශිය ණය (සාප්පුසංකිර්ණයට) රු.291000/= ,දේශිය ණය ආදාහනාගාරය

රු.321000/=,යුනයිඩඩ් මොටර්ස් වෙත රු.73646,එෂියන් ඉලෙක්ට්‍රිකලස් වෙත 102750, LRDC ආයතනයට රු.234772.29 ,සචිත් ඉලෙක්ට්‍රිකල් 139400, තාර දැමීම සඳහා රු.825000/=,රජයේ මුද්‍රණ රු.116000/= ගෑස් සඳහා රු.48400, රජයෙ වාණිජ නීතිගත සංස්ථාව රු.106177/=, පූර්ණා හාඩ්වේයාර් රු.49720/= කි. එමනිසා තැන්පත් මුදල් අවලංගු කර මේ මුදල ගෙවන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ ඇති ස්ථාවර තැන්පතු මුදල් ආපසු ලබා ගෙන ගෙවීම කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02 ගරු උප සභාපතිතුමා විසින් මන්ත්‍රිවරු 7කු අත්සන් කරන ලද යෝජනාව**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිවරු 7කු අත්සන් කරන ලද යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.02.01 තාක්ෂණසේවා නිලධාරින්ගේ සහායට සහ කර්මාන්ත අංශයට වැඩපරික්ෂක කෙනෙක් හැටියටත් , කාර්මික විද්‍යාල වල පුහුණු වන (N.C.T) තිදෙනෙකු දිමනාවක් ලබා දී බඳවා ගැනීම**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, තාක්ෂණසේවා නිලධාරින්ගේ සහායට සහ කර්මාන්ත අංශයට වැඩපරික්ෂක කෙනෙක් හැටියට කාර්මික විද්‍යාල වල පුහුණු වන (N.C.T) තිදෙනෙකු දිමනාවක් ලබා දී බඳවා ගන්නා ලෙස සභාවට යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව මා කටුනායක තාක්ෂණසේවා පුහුණු ආයතනයේ විදුහල්පතිතුමාට දන්වා තිබෙනවා. පුහුණුවන්නන් දෙදෙනෙක් එවන ලෙස.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා කියා සිටිනවා තුන්දෙනෙකුම ගන්නා ලෙස. හිමාල් මහතාගේ සහායට. හිමාල් මහතා හිටියට ලොකු වැඩ කොටසක් කරනවා.එතුමාටත් සහායක් ලෙස. මේ සඳහා දීමනාවක් ලබා දෙන්න. නැතිනම් එන්නේ නැති වෙයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරින් පැමිණෙනවා නම් දීමනාවක් දිය යුතු වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ලොකු වැඩ කොටසක් කරන්න පුළුවනි.මෙය ඉතා ඉක්මනින් සොයා බලා බඳවා ගන්නා හැටියට ඉල්ලා සිටිනවා.

**තීරණය**

තාක්ෂණසේවා නිලධාරින්ගේ සහායට සහ කර්මාන්ත අංශයට වැඩපරික්ෂක කෙනෙක් හැටියටත් , කාර්මික විද්‍යාල වල පුහුණු වන (N.C.T) තිදෙනෙකු දිමනාවක් ලබා දී බඳවා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා සලකා බැලීම

**06.01 2019.06.18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.06.18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව ඉදිරිපත් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කර සිටිනවා

**තීරණය**

2019.06.18 දින පැවති පුස්තාකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.06.24 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.06.24 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව ඉදිරිපත් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කර සිටිනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මුල්‍ය කමිටු වාර්තාවේ ලක්ෂ 75ක මුදලක් ගෙවන්න තිබෙනවානේ.එය මේ හිඟ මුදල් ගෙවීමක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔව්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඇයි ඒ මුදල් මාසයෙන් මාසයට යවා නැද්ද?

**. <u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාසයෙන් මාසයට යවා නැහැ. එකතු වෙච්ච නිසා තමයි ලක්ෂ 75ක් ගෙවන්නේ.ගෙවපු අනුමතිය තමයි මේ ගත්තේ.

**තීරණය**

2019.06.24 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**06.03 2019.06.24 දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.06.18 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව ඉදිරිපත් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කර සිටිනවා

**තීරණය**

2019.06.24 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**06.04 2019.06.20 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.06.20 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඉදිරිපත් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කර සිටිනවා

**තීරණය**

2019.06.20 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**07.** **ටෙන්ඩර් හා මිළ ගණන්**

**07.01** ටෙන්ඩර්:-

**07.02** මිළ ගණන් :-

**07.02.01** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක අමතර කොටස් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තර | Tiulip Computer | Omark Technology 3monware | Sarsi Coputer Brand New Used |
|---|---|---|---|---|
| 01 | G/B441 Mother Board | 6mon.w/used 2900.00 | 3monware 4000.00 | Brand New Used 6900.00 3500.00 |
| 02 | G/B461 Mother Board | G/B14Wor. 6mon.w/used<br><br>2900.00 | 6monware 6500.00 | Brand New Used 12500.00 4900.00 |
| 03 | G/B481 Mother Board | 9500.00 4500.00 | | |
| 04 | Intel D/C Processor | 10700.00 | 8700.00 | 5700.00 |
| 05 | Cooling Fan 1155 | Intel 7th ben 3Year warranty 16900.00 | 3monware 19000.00 | Brand New Used 2000.00 2500.00 |
| 06 | Net work card | 6mon.w/used 750.00 | 3monware 1200.00 | Brand New Used 750 |
| 07 | Ram DDR3 2 G/B | Kingston 2500.00 | 3months 2900.00 | Brand New Used 3900.00 1900.00 |
| 08 | Ram DDR1 G/B | 6mon.w/used 300.00 | 3months 2000.00 | Brand New Used 700.00 1400.00 |
| 09 | Ram DDR3 4G/B | Kingston 4500.00 | - | Brand New Used 7900.00 |
| 10 | Ram DDR44G/B | 3 Year warranty 5300.00 | 6700.00 | 8900.00 |
| 11 | New Casing | 1900.00 | 2400.00 | 1900.00 |
| 12 | Power Supply Unit | 1800.00 | 1800.00 | 1800.00 |
| 13 | DVD Writer | 2750.00 | 2900.00 | 3500.00 |
| 14 | Hard Disk (HDD) ITB | 7700.00 | 8750.00 | 9500.00 |
| 15 | Hard Disk (HDD) ITB | 11250.00 | 12500.00 | 14500.00 |
| 16 | Key Board with Sinhala | 490.00 | 600.00 | 900.00 400.00 |
| 17 | Key Board with Sinhala Letters – USB | 680.00 | - | 600.00 |
| 18 | Mouse USB | 690.00 | 400.00 | 400.00 500.00 600.00 |
| 19 | UPS | 3900.00 | 4750.00 | 4200.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | 4250.00 | | 9900.00 |
| 20 | HP 17 102A Printers | - | - | - |
| 21 | Epson LQ 310Printers | 36960.00 | 39000.00 | 37500.00 |
| 22 | M 302 dw Printers | - | - | - |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක අමතර කොටස් මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් Canon LBP 6030 Print ( 23 අයිතමය සඳහා ) අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Omak Technologies ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් , අනෙකුත් අමතර කොටස් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති Tulip Computer ආයතනය ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය බිත්ති ඔරලෝසු මිලදී ගැනීම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ඩයමන් සහෝදරයෝ | Nestor works | භාෂිණි සුපර්මාර්කට් |
|---|---|---|---|---|
| 01 | බිත්ති ඔරලෝසු | Himark 1000/= | Sonam 900/= | Santee 625 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය බිත්ති ඔරලෝසු මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති භාෂිනී සුපර් මාකට් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය එන්ජින් ඔයිල් බැරල් මිලදී ගැනීම සඳහා මිළ ගණන්**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය එන්ජින් ඔයිල් බැරල් මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති එකම මිළ ගණන සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් ඉදිරිපත් කර ඇති අතර එම ආයතනය රජයේ ආයතනයක් නිසා එම මිල ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

| අංනය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය |
|---|---|---|---|---|
| 01 | SEA40 ඩීසල් එන්ජින් ඔයිල් ලීටර් 210ක් බැරල් | 210L | 40SEA | රු.78200.00 |

**07.02.04 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල පොත් නිකුත් කිරීමේ නීති මාලාව මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | සක්වා ප්‍රින්ටර්ස් | D,R.S. ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | පොත් නිකුත් කිරිමේ කොළයේ නීති මාලාව සහිත උපදෙස් පත්‍රිකාව ( ආකෘතිය අමුණා ඇත)පළල 41cm දිග 71Cm | 3.25 | 3.80 | 4.00 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල පොත් නිකුත් කිරීමේ නීති මාලාව මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ එම මිල ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.05 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පිරිසිදු කාරක ද්‍රව්‍ය සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | නයන රංජන සේල් පොළ | පූර්ණා හාඩ්වේයාර් | හාෂිණි සුපර් මාර්කට් |
|---|---|---|---|---|
| 01 | පීනෝල් බෝතල් | රු.210/= | රු.190/= | - |
| 02 | හාපික් බෝතල් | රු.185/= | රු.270/= | - |
| 03 | කාණු බුරුසු | රු.140/= | රු.215/= | රු.295/= |
| 04 | ටොයිලට් බ්‍රස් | රු.35/= | රු.60/= | රු.50/=(කොහු බ්‍රෂ්) |
| | | රු.570/= | රු.735/= | රු.195/=(ප්ලාස්ටික්) |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පිරිසිදු කාරක ද්‍රව්‍ය සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති නයන රංජන සේල්පොළ ආයතනය ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.06 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ඩී.ආර්.එස්.ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | ලිපි ශිර්ෂ ( සාමාන්‍ය) | 3/75 | 3/80 | 3/10 |
| 02 | ලියුම් කවර ( 9'*4')ප්‍රමාණය | 3/80 | 3/80 | 3/25 |
| 03 | ලියුම් කවර ( 6'*3 ½ ')ප්‍රමාණය | 2/45 | 2/60 | 2/20 |
| 04 | ලියුම් කවර ( 10'*6')ප්‍රමාණය | 6/90 | 7/10 | 5/75 |
| 05 | ලියුම් කවර ( 9'*10')ප්‍රමාණය | 22/50 | 21/75 | 19/75 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.07 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා බිල්පොත් මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | සක්වා ප්‍රින්ටර්ස් | ඩී.ආර්.එස්.ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | භාණ්ඩ ඇණවුම් පොත ( නස 7)පොතට පිටු 50 | 475 | 620 | 650 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා බිල්පොත් මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.08 අම්බලන්ගොඩ නගර සභා ඩබල් කැබ් රථයට අමතර කොටස් සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | NEW Ruhunu Motor Stores | S.M Motors | විජේසූරිය මෝටර්ස් | ඉසුරු මෝටර්ස් |
|---|---|---|---|---|---|---|
| 01 | වැල්වලයින් ඩීසල් එන්ජින් ඔයිල් | ලීටර් 7 | රු.1200/= | රු.1150/= | රු.7300/= | නැත |
| 02 | ඔයිල් පිල්ටර් | 01 | රු.4600/= | රු.4500/= | රු.3190/= | නැත |
| 03 | ඩීසල් පිල්ටර් | 01 | රු.9500/= | රු.9200/= | රු.3190/= | නැත |
| 04 | වයිපර් ආම් (බ්ලේඩ් සමඟ) | 02 | රු.7650/= | රු.7530/= | රු1150/= | නැත |
| 05 | බ්රේන් පැඩ්ස් ජෝඩු ( ඔර්ජිනල් ) | 02 | රු.18950/= | රු.18500/= | | නැත |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ඩබල් කැබ් රථයට අමතර කොටස් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් වැල්වලයින් ඩීසල් එන්ජින් ඔයින් සඳහා අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති විජේසූරිය මෝටර්ස් ආයතනය ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනිම සුදුසු බවටත්, අනෙකුත් අමතර කොටස් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබු එස්.එම්.මෝටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.09 අම්බලන්ගොඩ නගර සභා ඡායා පිටපත් යන්ත්‍රයේ ටෝනර් මිලදී ගැනිම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | දූලාර ස්ටේෂන් | ඔමැක් ටෙක්නොලජී | Lanka Technology Applications (Pvt) Ltd |
|---|---|---|---|---|---|
| 01 | T2309Pෆොටෝ කොපි ටෝනර් | 01 | රු.9800/= | රු.14500/= | රු.12020( බලය ලත් අලෙවි නියෝජිත ) |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ඡායා පිටපත් යන්ත්‍රයේ ටෝනර් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගනන් ඉදිරිපත් කර තිබුණේ දූලාර ස්ටේනර්ස් ආයතනය වුවත් එම ආයතනය විසින් පිරිවිත පැහැදිලිව දක්වා නොමැති නිසාත් , මිළහට මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය වන ලන්කා ටෙක්නොලජී අප්ලිකේෂන් පුද්ගලික සමාගම මහින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වල වැට් වටිනාකමද ඇතුළත් නිසා එම මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත්, ගරු සභාව තීරණය කරන ලදී.

### 07.02.10 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ගංගා වැලි සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | P.H.C.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් | පූර්ණා හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | ගංගා වැලි කියුබ් ( ප්‍රවාහනය සහිතව | රු.12500/= කළුතර රු.20000/= | රු.13000/= | රු.12500/= (භාණ්ඩ ඇණවුම් කිරිමේදි චෙක්පත ඉදිරිපත් යුතුවේ ) චෙක්පත් රහිතව භාණ්ඩ ලබා නොදේ. |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ගංගා වැලි මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන දෙක අතරින් පූර්ණා හාඩ්වේයාර් ආයතනයෙන් බඩු ඇණවුම් කරන අවස්ථාවේදිම චෙක්පත් ඉදිරිපත් කළ යුතු හේතුව නිසා අනෙක් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පී.එච්.සී.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ ආයතනයේ මිල ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

### 07.02.11 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ෆයිල් හෝල්ඩර් සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ලුමිනෙක්ස් බුක්ෂොප් | රෝයල් පොත් මැඳුර | රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව |
|---|---|---|---|---|
| 01 | ෆයිල් හෝල්ඩර් අගල් 4 රතුපාට,කහ පාට,කොළපාට,නිල් පාට,රෝස පාට | රු.234/= | රු.265/= | රු.220 |
| 02 | ගම්ටේප් අගල් 2 ( ලොකු ) | රු126/= | රු.165/= | රු.45/= |
| 03 | ෆැක්ස් රෝල් | රු.225/= | රු.250/= | රු.240/= |
| | | රු.585/= | රු.680/= | රු.505/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ෆයිල් හෝල්ඩර් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අවම මිල ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.12 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ලුම්නෙක්ස් බුක්ෂොප් | රෝයල් පොත් මැදුර | රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව |
|---|---|---|---|---|
| 01 | පුස්තකාලය සඳහා අවශ්‍ය දින ලේබල් | රු210/= | රු.1/60 | රු.1/90 |
| 02 | දෛනික පොත් සටහන් කිරිමේ ලේඛනය | රු6500/= | රු.5750/= | රු.6760/= |
| 03 | පොත් තොග ගණන් ගැනිමේ ලේඛනය | රු.5700/= | රු.4250/= | රු.5500/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ අවම මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.13 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ පැරණි පුවත්පත් මිලදී ගැනිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | R.k. රුවන් | ඩී . සිරිසේන | P.M.වසන්ත | |
|---|---|---|---|---|---|---|
| 01 | පත්තර (පොඩි) | 1kg | රු.12/= | රු15/50 | රු.10/= | රු.9/92 |
| 02 | පත්තර (ලොකු) | 1kg | රු16/= | රු.12/= | රු.9/= | රු.9/92 |
| 03 | ගැසට් පත්තර | 1kg | | රු.9/= | රු5/= | - |
| | | | රු28/= | රු.31/50 | රු.24/= | රු.19/84 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ පැරණි පුවත්පත් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ පුද්ගලයන් අතරින් පැරණි පත්තර මිලදී ගැනීම සඳහා වැඩිම මිළක් ඉදිරිපත් කර ඇති ඩී. සිරිසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළි ගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.14 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පස්, කොරිපස් සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | P.H.C.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | M.M.කන්ස්ට්‍රක්ෂන් | චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් |
|---|---|---|---|---|
| 01 | පස් (රතු) | රු2900/= | රු.3000/= | ලැබී නැත |
| 02 | කොරිපස් | රු.2900/= | රු.3400/= | ලැබී නැත |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පස්, කොරිපස් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ පී.එච්.සී. ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ ආයතනයේ අවම මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.15 කොහුබත් සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | කර්මාන්ත සහකාර අධ්‍යක්ෂ කාර්යාලය ( දොඩන්දූව ගෙවල් සංකීර්ණ පරිශ්‍රය) |
|---|---|---|---|
| 01 | කොහුබත් කියුබ් | 01 | රු.3950/= |

**තීරණය**

කොහුබත් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ කර්මාන්ත සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ මිල ගණන් පමණි. නමුත් එම ආයතනය රජයේ ආයතනයක් බැවින් එම ආයතනයේ මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් , ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.16 මිණුම් පටි මිලදී ගැනිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පූර්ණා වෙළඳ සැල | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් | B.K.S.කම්පැනි |
|---|---|---|---|---|---|
| 01 | මීටර් 50 දිග මිනුම් පටි | 02 | රු.675/=<br>රු.700/=(Great wall) | රු950/= | රු.500/= |
| 02 | Steel tape 7.5m | 03 | රු570/=(Great wall) | රු.550/= | රු.675/= |
| 03 | Steel tape 5m | 03 | රු.275/= | රු.400/= | රු325//= |

**තීරණය**

මිණුම් පටි මිලදී ගැනිම සඳහා මිළ ගණන් ආයතන 03කින් ඉදිරිපත් කර ඇතත් මිණුම් පටි පරික්ෂා කර නිර්දේශ ලබා දීම සුදුසු බවට, ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.17 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය දැව දැන්වීම් පුවරු සැකසීම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | වරගය | හංස එන්ටප්‍රයිසස් | New Lucky Timber Stores | City Timber Stores |
|---|---|---|---|---|---|
| 01 | ගස් කඳකින් සිදු කරන ලද හරස්කඩ කැපුම අගල් 1 ක ඝනකමින් යුතු අඩි 03-3 ½ දිග හා අඩි 1 ½ ක් පමණ විශ්කම්භයක් සහිත දැන්වීම් පුවරු | අව්වට හා ජලයට ඔරොත්තු දෙන ලි වර්ගයේ විය යුතුය | නැත | විෂ්කම්භය අඩි 2 ½ කුඹුක් රු.4000/=<br>තේක්ක රු.2500/=<br>පරමාර රු.1750/= | නැත |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය දැව දැන්වීම් පුවරු සැකසීම සඳහා ආයතන 03කින් මිළ ගණන් කැඳවා ඇති අතර නමුත් මිළ ගණන් ලැබී ඇ ඇත්තේ එක ආයතනයක් මඟින් පමණි. එම අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති New Lucky Timber stores ආයතනයේ මිළ ගණන් පිළිගැනිමත් ,ලී වර්ගය වන පාරමාර ලී වර්ගයේ පුවරු මිලදී ගැනිම සුදුසු බවට , ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.18 අම්බලන්ගොඩ නගර සභාවවේ කසළ බැහැර කරනු ලබන ස්ථානයේ කසළ තුනී කිරිමේ D4 යන්ත්‍රය සැපයීම වෙනුවෙන් මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | M.M.කන්ස්ට්‍රක්ෂන් | P.H.C.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ |
|---|---|---|---|---|
| 01 | කුණු තුනී කරන යන්ත්‍රය D4 බ්‍රැග්ලෝඩරය සල සඳහා | මිටර් පැය 1 | රු.3700/= | රු.3400 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවවේ කසළ බැහැර කරනු ලබන ස්ථානයේ කසළ තුනී කිරිමේ D4 යන්ත්‍රය සැපයීම සඳහා ආයතන දෙකකින් මිළ ගණන් ඉදිරිපත් වී ඇති නමුත් ප්‍රවාහනය සමඟ අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පී.එච්.සි ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ ආයතනයේ මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.19 අම්බලන්ගොඩ නගර සභාවේ දැන්වීම් පුවරු සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනිම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | B.K.S.කම්පැනි | පූර්ණා වෙළඳ සැල | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | 1"*1" Box bar ( Iron) | රු.1325/= | රු1000/=<br>රු1350/= | රු.1450/= |
| 02 | 1/8 Galvanize Sheet | - | රු.11300/=<br>රු.11600/= | රු.5900/= |
| 03 | 2/8 "* ½ "Pop revert | 1/25 | රු.2/= | රු1/50 |
| 04 | 4 ½ " Cutting wheel | රු.110 | රු.60/=<br>රු.140/= | රු.130 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ දැන්වීම් පුවරු සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් 1"*1 Box bar ( Iron) , 2/8 "*1/2 "Pop revert (පොප් රිවට් ) , 4 ½ "cutting wheel යන ද්‍රව්‍ය සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ආයතනය වන්නේ B.K.S කම්පැණි ආයතනය වන අතර , 1/8 Galvanic sheet ( ගැල්වනයිස් ෂීට් ), සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය වන්නේ පූර්ණා වෙළඳ සැලවිසිනි , එම අවම මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.20 අම්බලන්ගොඩ නගර සභාවේ වඩු කාර්මික කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් | පූර්ණා වෙළඳ සැල | B.K.S.කම්පැනි |
|---|---|---|---|---|---|
| 01 | මුලු මට්ටම | 01 | 210/= | 175/= | 185/= |
| 02 | අඩු මිටිය | 01 | 580/= | 400/= | 625/= |
| 03 | නියන ( අඟල් ) 8′ | 01 | 450/= | 160/= | 675/= |
| 04 | නියන ( අඟල් කාල ) 2/8′ | 01 | 375/= | 150/= | 475/= |
| 05 | කියත් ගාන පීර අඟල් 4 | 01 | 250/= | 220/= | 340/= |
| 06 | ඇමරි ගල ( වඩු මැෂින් එකට සවිකළ හැකි | 01 | - | 175/= | 415/= |
| 07 | කටර් අඩු | 01 | 250/= | 570/= | 550/= |
| 08 | ස්පැනර් 12′ | 01 | 750/= | 475/= | 1050/= |
| 09 | යතුරු නො 08 | 01 | 175/= | 100/= | 150/= |
| 10 | යතුරු නො 10 | 01 | 185/= | 120/= | 195/= |
| 11 | යතුරු නො 12 | 01 | 220/= | 180/= | 200/= |
| 12 | මල් ඉස්කුරුප්පු නියන් | 01 | 160/= | 175/= | 260/= |
| 13 | හැන්ඩ් ග්‍රයින්ඩර් | 01 | 4350/= | 4500/= | 4450/= |
| 14 | රවුටර් මැෂින් | 01 | - | 12000/= | 15250/= |
| 15 | ඩ්‍රිල් මැෂින් ඉලෙක්ට්‍රික් | 01 | 6500/= | 6100/= | 6250 |
| 16 | ප්ලැට් නියන් | 01 | 160/= | 175 | 170/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ වඩු කාර්මික කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා ආයතන 3කින් මිළ ගණන් ඉදිරිපත් වී තිබුණත් උපකරණ පරික්ෂා කර බලා නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.21 අම්බලන්ගොඩ නගර සභාවේ අත් ට්‍රැක්ටර් අමතර කොටස් මිළදී ගැනීම සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ප්‍රියන්ත මෝටර්ස් | G.M.මොටර්ස් | D.J. Trading Co (Pvt)Ltd |
|---|---|---|---|---|---|
| 01 | ඔයිල් සීල් | 05 | 3350/= | 1710/= | 1040/= |
| 02 | රේසර් | 20 | 12550/= | 14750/= | 13315/= |
| 03 | හැන්ඩ් ක්ලච් ලිවර් | 02 | 1850/= | 2550/= | 585/= |
| 04 | K.T.S ගියර් බොක්ස් සෙට් | 01 | 450/= | 440/= | 484/= |
| 05 | හැන්ඩ් ක්ලච් කේබල් | 02 | 990/= | 980/= | 494/= |
| 06 | ක්ලච් රේසර් | 01 | 1025/= | 480/= | 655/= |
| 07 | හැන්ඩ් බ්රේක් සෙට් | 01 | 2575/= | 2260/= | 2450/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | කේබල් ටයි " (අඟල් 6) | 05 | 100/= | 50/= | නැත |
| 09 | හැඩලයේ ප්ලාස්ටික් පියන | 01 | 995/= | 950/= | 1130/= |
| 10 | MP90 ගියර් ඔයිල් ලීටර් | 05 | N/A | නැත | නැත |
| 11 | සෙලාස්ටික් ලොකු ගම් | 02 | 625/= | 1260/= ABRO | නැත |
| 12 | ටේලරයේ රේසර් | 04 | - | 4580/= ජපන් | නැත |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ අත් ට්‍රැක්ටර් අමතර කොටස් මිළදී ගැනිම සඳහා ආයතන 3ක් මිළ ගණන් ඉදිරිපත් කර ඇති නමුත් DJ Trading Co (PVT) Ltd ආයතනය විසින් ලබා දි මිළගණන් අතරින් අමතර කොටස් වර්ග 4 ක් නොමැති බව වාර්තා කර ඇති අතර එම මිළ ගණන් ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවත්, ඉතිරි මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන 02ක අතරින් ප්‍රියන්ත මොටර්ස් ආයතනයේ ගියර් ඔයිල් ලීටර් 05 හා ටේලරයේ රේසර් 04 යන ද්‍රව්‍ය නොමැති බවත් එම නිසා , ගියර් ඔයිල් ලීටර් 05 පමණක් නොමැති බව දන්වා ඇති G.M මොටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.22** **අම්බලන්ගොඩ නගර සභාවේ තාර උණු කිරිමට අවශ්‍ය පිටපළු සඳහා මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | New Lucky Timber Stores | City Timber Stores | B.H.Kළී මෝල සහ ලී වෙළඳසැල |
|---|---|---|---|---|
| 01 | තාර උණු කිරිමට අවශ්‍ය පිට පළු ප්‍රවාහනය සහිතව ඝනයාර 01 | 1200/= | නැත | 850/= |
| 02 | තාර උණු කිරිමට අවශ්‍ය පිට පළු ප්‍රවාහනය රහිතව ඝනයාර 01 | 1000/= | නැත | 750/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ තාර උණු කිරිමට අවශ්‍ය පිටපළු සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය වන්නේ B.H.K.වෙළඳ සැල ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන් පිළිගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.23** **අම්බලන්ගොඩ නගර සභා ගරාජයට අවශ්‍ය හයිප්‍රෙෂර් ලීටර් 20 කෑන් , කාර් වොෂ් ( ටීපෝල් ) ලීටර් 10 කෑන් මිළදී ගැනිමට අවම මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමනදාස සර්විස් සෙන්ටර් | විජේසූරිය මෝටර්ස් | උමංගා ලුබ්රිකන්ස් |
|---|---|---|---|---|---|
| 01 | හයිප්‍රෙෂර් ලීටර් 20 කෑන් | 02 | - | ලීටර් 20 800/= | බූලට් 850/= |
| 02 | කාර් වොෂ් (ටීපෝල් ) ලීටර් 10කෑන් | 02 | - | 980/= Calssic | බූලට් 1000/= |
| 03 | භූමිතෙල් ලීටර් 20 | | - | - | - |
| 04 | තිනර් ලීටර් 20 | | - | - | - |
| 05 | ග්‍රීස් ( සිපෙට්කෝ | 02 | - | - | 16300/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කහ පාට කිලෝ 15 කෑන් | | | | Caltex |
| 06 | MD 68 හයිඩ්‍රෙලික් ඔයිල් 20ලීටර් | 12480/ | 12480 | | 12380 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ගරාජයට අවශ්‍ය හයිප්‍රෙෂර් ලීටර් 20 කෑන් , කාර් වොෂ් ( ටිපෝල් ) ලීටර් 10 කෑන් මිළදී ගැනිමට අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ විජේසූරිය මෝටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනිමටත්, ගරු සභාව තීරණය කළ අතර , ග්‍රීස් ( සිපෙට්කෝ කහ පාට) කිලෝ 15 කෑන් 02 හා 68 හයිඩ්‍රොලික් ඔයිල් 20L මිළදී ගැනිම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති උමංගා ලූබ්රියන්ස ආයතනයේ මිළ ගණන් පිළිගැනිමටත් ගරු සභාව තීරණය කරන ලදි.

**08.** **ගෙවීම්**

**08.01** 2019.05.01 දින සිට 2019.05.31 දින දක්වා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් රු.268957.40 ක මුදලක් LRDC SERVICES (PVT) LRD ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**08.02** බින්දුහේවා චින්තක චන්දිමන් ද සිල්වා මහතා වෙත 1%ක ගාස්තු වන රු.305900/= ක මුදලක් නිදහස් කිරිම සුදුසු බවත් , ලොට් අංක 1A, 1B,1C යන ඉඩම් කැබලි ගිනිගල්ගොඩගේ ඩිලානි කරුණානන්ද , බිංදුහේවා ඩිලංක කාවින්ද ද සිල්වා, බිංදුහේවා චමින් ශාලින්ද ද සිල්වා යන අයට හැර වෙනත් පැවරිමක් සිදු කිරිමේදි 1% ගාස්තු ගෙවිය යුතු බවත් ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙහි නගර සභාවට රු.305900/= ක මුදලක් ගෙවිය යුතුයි.එහිදි ඔහු 1% ගාස්තු වශයෙන් ඔහු ඉදිරිපත් කර තිබෙනවා අංක 1 කොටස මාගේ පියා වන බින්දුහේවා බුද්ධදාස මහතා විසින් බින්දුහේවා චින්තක ප්‍රසාද් වන මා හට ඒ කියන්නේ පියා විසින් පුතාට ලබා දී ඇත.1 කොටස මාගේ දරුවන් සඳහා නිවසක් සැදිමට වරිපණම් අංක ඉල්ලුම් කර ඇත.මෙය අපි නිදහස් කරන විට මේ නම්වලට පමණි නිදහස් කරනු ලබන්නේ.මේවා වාර්තාවේ සඳහන් විය යුතුයි. අංක 1A, 1B,1C යන ඉඩම් කැබලි ගිනිගල්ගොඩගේ ඩිලානි කරුණානන්ද , බිංදුහේවා ඩිලංක කාවින්ද සිල්වා,බිංදුහේවා චමින් ශාලින්ද ද සිල්වා යන අයට හැර වෙනත් පැවරිමක් සිදු කිරිමේදි 1% ක ගාස්තු අයකර ගත යුතුයි. එහෙම නොවුණහොත් මෙය විකුණා මුදල් ලබා ගනී. මෙහිදි එක ඔප්පුවක් පමණයි තැගි ඔප්පුවකට තිබෙන්නේ.හදිසියේවත් විකුණනු ලැබුවහොත් එම මුදල් නගර සභාවටත් නැති වෙනවා. එහි වගකිම සම්පූර්ණයෙන්ම ආදායම් පරික්ෂකවරු භාරගත යුතුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය අනිවාර්යෙන්ම කරන්න. නැතිනම් ජනතාව කපටිකම් කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මෙය ප්‍රායෝගික නැහැනේ.ආදායම් පරික්ෂකවරුන්ට මතක තබා ගැනිමට. දැන් මේ වගේ 20ක් පැමිණියහොත් එහෙම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය වරිපණම් ලේකණයේ ලියන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය වරිපණම් ලේඛණයේ නිසි ලෙස ලිවිය යුතුයි. හදිස්සියේ වත් අමතක වුණොත්. මෙය හරියටම ලිවිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය සභාවට ඉදිරිපත් කර ඇත්තේ සභාවේ අනුමතිය ලබා ගත යුතුයි. නිදහස් කරන එවාට. විකිණීමක් නෙමෙනේ.

**08.03** 2019 මාර්තු මස සිට 2019 ජුනි මස දක්වා ලේකම් ආර්.යූ.ඩබ්.ගුණවර්ධන මියගේ දුරකථන දිමනාව සඳහා රු.2000/= ක මුදලක් ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය සභාවට මා යෝජනා කරනු ලබන්නේ ගරු මන්ත්‍රිවරුන්ට ගෙවනු ලබන්නේ රු.1500/= ක මුදලකි.රු.2000/= සීමාවම ගෙවනවාද ? එම රු.1500/= ම ගෙවනාවාද කියන එකයි අදහස් කළේ.චක්‍රලේඛයො තිබුණට මන්ත්‍රිවරුන්ට සිමාවක් දමා ගනු ලැබුවේ මන්ත්‍රිවරුන් විසින්මයි.ඔබතුමියට වුණත් සිමාව දමන්න ගරු මන්ත්‍රිවරුන්ට හැකියාව තිබෙනවා. මිළහට ගිණුම් වාර්තා ඉදිරිපත් කරනවා. නැහැ පොඩ්ඩක් ඉන්න 8 ගෙවීම් තව තිබෙනවා. ගිණුම් වාර්තා ලබා දුන්නේ නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ ගිණුම් වාර්තා උදේ පාන්දර ලබා දෙනවා. හරි ආමාරුයි. මෙය කියවන්න විදියක් නැහැ . උදේ ලබා දුන්නාම. මේවා අනුමත කිරිම සම්බන්ධව මා විරුද්ධ වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් න්‍යාය පත්‍රයට ඇතුළත් නොවු වෙනත් ගෙවීම් වගයක් තිබෙනවා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි නිලධාරින් ගැනත් බැලිය යුතුයි.අපහසුතාවයට පත්වෙනවා හැමදාම.මට ප්‍රශ්නයක් නැහැ. මා දන්නවා මෙතැන වැඩ කෙරෙන්නේ කොහොමද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි නිළධාරින්ට දොස් කියන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොඩ්ඩක් ඉන්න. සභාව හෙට පස්වරු 2.30 වනතුරු කල් තබනවා. මේ ටික කියවාගෙන බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හෙදයි , ප්‍රශ්නයක් නැහැ.

- 2019.07.03 වන දින කල්තබන ලද මාසික සභා රැස්වීමේ වැඩ කටයුතු නැවත 2017.03.04 දින පස්වරු 2.30 ට ආරම්භ කරන ලදී.

**2019.07.04 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව**

සහභාගීත්වය

| | |
|---|---|
| **ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා** | **ගරුසභාපති** |
| **කමල් වැල්ලගේ මැතිතුමා** | **ගරු උප සභාපති** |
| **දිනයාදුර ධර්මදාස මැතිතුමා** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **නන්දන රාජපක්ෂ මැතිතුමා** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය** | **ගරු නගර සභා මන්ත්‍රී** |
| **මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය** | **ගරු නගර සභා මන්ත්‍රී** |

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

ඊයේ දිනයේදි අඛණ්ඩව කල්තබන ලද රැස්වීමෙ වැඩ කටයුතු නැවත ආරම්භ කරනවා.ගරු නගර සභා මන්ත්‍රි ජගත් කුමාර මහතා අත්‍යවශ්‍ය කරුණක් නිසා අද දිනයේ සභාවට නොපැමිණෙන බව දන්වා සිටිනවා.ඒ වගේම ගංහේ සරත් ශ්‍රී ලාල් මහතාත් අත්‍යවශ්‍ය කරුණක් නිසා අද දිනයේ සභාවට නොපැමිණෙන බව දන්වා සිටිනවා. ඒ අනුව ඊයේ දිනයේ නවත්වන ලද ගෙවීම් වල 08.04 සිට නැවත සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

**08.04** ඩි.ජේ. ඔටෝ පුද්ගලික සමාගමට හිමිකම් ඇති වරිපණම් අංක 349 ඉඩමේ මැනිම් කටයුතු වෙනුවෙන් ගාස්තු ගෙවිමට යාමේදි ( නගර සභා ආදායම් ගිණුමේ ඇති නිසා ගෙවිම් කළ නොහැකි නිසා ) ආදායම් ශිර්ෂ මාරුකර පොදු ගිණුමට මාරුකර රු.30000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි රබින් චන්ද්‍රසිරි මහතාට ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.05** 2019 මැයි මස සැලසුම් කමිටුව සඳහා සහභාගි විමවෙනුවෙන් රු.18565.20 ක මුදලක් සැලසුම් කමිටු දිමනා ලෙස ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**08.06** නාගරික මන්ත්‍රිවරුන්ගේ ගමන් වියදම් දිමනා ගෙවිම සඳහා රු.66000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.07** අම්බලන්ගොඩ නගර සභාවට කොන්ත්‍රාත් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.9000/= ක මඅදලක් ගයා ශාන් කන්ට්‍රක්ෂන් ආයතනයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති

එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.08** ගලි බවුසරය සැපයිමට නොහැකි වි ඇති බැවින් ඩබ්.ටී.මෛත්සිරි මහතා විසින් 25% දෙපාර්තමේන්තු ගාස්තුව ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව රු.905/= ක මුදල ඔහු වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.09** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ලිපිද්‍රව්‍ය හා බිල්පත් මුද්‍රණය වෙනුවෙන් රු.26750/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සක්වා ප්‍රින්ටර්ස් ආයකනයට ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.10** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ලේජර් ටේප් (බයිඩින් ටේප් ) ලබා ගැනීම වෙනුවෙන් රු.27540/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ලුම්නෙක්ස් පොත් මැදුර වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධරමදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.11** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා පිරිසිදු කිරිමේ ද්‍රව්‍ය මිලදි ගැනීම වෙනුවෙන් රු.28800/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ටී.එච්. ජයලත් ද සිල්වා මහතා (නයන රංජන සෙල්පොළ) වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.12** අම්බලන්ගොඩ නගර සභාවේ ට්‍රැක්ටර් රථවලට අවශ්‍යා ටයර් හා ටියුබ් මිලදී ගැනිම වෙනුවෙන් රු.192169.92 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි Crown Tyres ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.13** අම්බලන්ගොඩ නගර සභාවේ විදි පහන් නඩත්තුව සඳහා විදුලි උපාංග මිලදි ගැනිම වෙනුවෙන් රු.196400/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එෂියන් ඉලෙක්ට්‍රිකල් වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.14** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ටෝනර් මිලදී ගැනිම වෙනුවෙන් රු.144,500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ඔමැක් ටෙක්නොලජි සෙල්පොළ වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.15** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ලිපිද්‍රව්‍ය මිලදි ගැනිම හා බිල්පත් මුද්‍රණය කිරිම වෙනුවෙන් රු.14150/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.16** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ලිපිද්‍රව්‍ය මිලදි ගැනිම හා බිල්පත් මුද්‍රණය කිරිම වෙනුවෙන් රු.16875/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.17** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ෆොටෝ කෝපි ටෝනර් මිලදී ගැනිම වෙනුවෙන් රු.12020/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ලංකා ටෙක්නොලජි ඇප්ලියන්ස් ආයතනය ( Lanka Technology Appliances (PVT) Ltd )වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.18** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පෙර පාසල් ටීෂර්ට් මිලදී ගැනිම වෙනුවෙන් රු.72000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්.ඩබ්.කෝසල නදුන් මහතා වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.19** අම්බලන්ගොඩ නගර සභාවේ පුස්තකාලයේ වැසිකිළිය වෙනුවෙන් රු.33100/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී සිරි ඉන්ඩස්ට්‍රිස් සමාගම( Sri Siri Industries (Pvt) Ltd) වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.20** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Hand Held Metal Detector මිලදී ගැනිම වෙනුවෙන් රු.24500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ඩිල්කෝ සිකුරටි ඇන්ඩ් ඉන්වෙස්ටිගේෂන් පුද්ගලික සමාගම( DILCO SECURITY & INVESTIGATION (PVT)LTD) වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.21** මානාන ක්‍රීඩාංගණයට පස් දැමීම වෙනුවෙන් රු.310,800/= ක මුදලක් පී.එච්.සී. සී. ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.22** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය කසළ බඳුන් මිලදී ගැනීම වෙනුවෙන් රු.27000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි තරු සේල් සෙන්ටර් වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.23** අම්බලන්ගොඩ නගර සභාවේ විදුලිබලය විසන්ධි කිරිම හේතුවෙන් සභාකටයුතු සිදුකිරිමට අවශ්‍ය විදුලි ජනක යන්ත්‍රයක් කුලි පදනම මත ලබා ගැනීම වෙනුවෙන් රු.10000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි හේමන්ත ඉලෙක්ට්‍රොනික්ස් ආයතනය වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.24** අම්බලන්ගොඩ නගර සභා සේවකයන්ට අවශ්‍ය කාකි නිල ඇඳුම් රෙදි මිලදී ගැනිම වෙනුවෙන් රු.29250/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි G.U. ද සිල්වා වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.25** 2019.07.02 දින කොළඹ පදනම් ආයතනයේ පවත්වන ලද මන්ත්‍රී මණ්ඩල පුහුණුවට සහභාගි වීම වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සඳහා රු.20000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි පී.ඩබ්.අසේල මාධව මහතා වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.26** අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.107990/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.27** අම්බලන්ගොඩ කුලරත්න පාර අතුරු මාර්ගය ( නවාරා පංතිය පාර ) කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.460,907.00/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කේ.ආර්.කේ එන්ටප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## (09) ගිණුම්

**09.01** 2019 මැයි මාසයට අදාළ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා ලැබීම් විග්‍රහය පිළිගතයුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.01 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.490,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.490,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ නගර සභාව විසින් 2019 ලෝක ළමා දිනය සැමරීමේ උළෙල පැවැත්වීම සඳහා රු.815,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව විසින් 2019 ලෝක ළමා දිනය සැමරීමේ උළෙල පැවැත්වීම සඳහා රු815,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.03 අම්බලන්ගොඩ නගර සභාව විසින් නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ සිදු කිරීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.368,810/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව විසින් නිර්පාංශු ගෙවතු වගා වැඩසටහන පොල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ සිදු කිරීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.368,810/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.04** තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ( මාලා මහත්මියගේ නිවස අසළ ) සහා අරමුදලින් සකස් කිරිමේ රු.490,000/= ක ඇස්තමේන්තුව සහාගත කරන ලදී

**තීරණය**

තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම ( මාලා මහත්මියගේ නිවස අසළ ) සහා අරමුදලින් සකස් කිරිමේ රු.490,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.05 තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිමේ රු.120,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිමේ රු.120,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිමේ රු.120,000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී**

**තීරණය**

තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සහා අරමුදලින් සකස් කිරිමේ රු.120,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.07 එස්.ජී.ඒ. ද සිල්වා මාවත හරස් මාර්ගය ( කාණුව ප්‍රතිසංස්කරණය ඩෙන්සිල් මහතාගේ නිවස අසළ ) සහා අරමුදලින් සිදු කිරිම රු.160,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

එස්.ජී.ඒ. ද සිල්වා මාවත හරස් මාර්ගය කොන්ක්‍රිට් කාණුව ඉදිකිරිම (ඩෙන්සිල් මහතාගේ නිවස අසළ ) සහා අරමුදලින් සිදු කිරිම රු.160,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.08 සංඝරාජ මාවත අතුරු මාර්ගය (ධර්මාශෝක විද්‍යාලය පිටුපස ගේට්ටුව අසළ ) සහා අරමුදලින් සිදු කිරිම රු.670,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

සංඝරාජ මාවත අතුරු මාර්ගය (ධර්මාශෝක විද්‍යාලය පිටුපස ගේට්ටුව අසළ ) සහා අරමුදලින් සිදු කිරිම රු.670,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.09 හල්වතුර බී.ජී. සුනිල් මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සහා අරමුදලින් සිදු කිරිම සඳහා රු.1,000,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

හල්වතුර බී.ජී. සුනිල් මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සහා අරමුදලින් සිදු කිරිම සඳහා රු.1,000,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.10 කන්ද මාවත ප්‍රධාන කාණු පද්ධතිය අදියර 1 සභා අරමුදලින් සිදු කිරිම සඳහා රු.820,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය**

කන්ද මාවත කොන්ක්‍රිට් කාණුව ඉදිකිරිම සහා අරමුදලින් සිදු කිරිම සඳහා රු.820,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.11 කුලරත්න හරස් පාර කාණු පද්ධතිය ( විලේගොඩ හන්දියේ සිට පීරිස් වෙද මාවත දක්වා වම්පස) සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.3,500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

කුලරත්න හරස් පාර කාණු පද්ධතිය ( විලේගොඩ හන්දියේ සිට පීරිස් වෙද මාවත දක්වා වම්පස) සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.3,500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.12 පටබැඳිමුල්ල ආදාහනාගාරයේ අභ්‍යාන්තර මාර්ග සංවර්ධනය කිරීම සහා අරමුදලින් සිදුකිරිම සඳහා රු.570,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

පටබැඳිමුල්ල ආදාහනාගාරයේ අභ්‍යාන්තර මාර්ග සංවර්ධනය කිරීම සහා අරමුදලින් සිදුකිරිම සඳහා රු.570,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.13 කුලරත්න හරස් පාර වම්පසට ඇති පලමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා .600,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රි මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

කුලරත්න හරස් පාර කියන්නේ කොහේද දන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කුලරත්න හරස් පාර කරිත්ත කන්ද පැත්තට වෙන්න. මුකුත් ගැටළුවක් තිබෙනවාද?

ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

පෝරඹ පැත්තට නෙමේ නේද?නැහැ.

**තීරණය**

කුලරත්න හරස් පාර වම්පසට ඇති පලමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා .600,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.14 පින්නදූව තොටුපල පාර සංවර්ධනය කිරීම සඳහා .100,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

පින්නදූව තොටුපල පාර සංවර්ධනය කිරීම සඳහා .100,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.15 ඔකන්ද සිරිල් මහතාගේ නිවස අසළ මාර්ගය හා කාණු පද්ධතිය සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.600,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

ඔකන්ද සිරිල් මහතාගේ නිවස අසළ මාර්ගය හා කාණු පද්ධතිය සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.600,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.16 තුඩුවමුල්ල නාන තොටුපල සංවර්ධනය කිරිම සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.250,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

තුඩුවමුල්ල නාන තොටුපල සංවර්ධනය කිරිම සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.250,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.17 එස්.ජී.ජ්. ද සිල්වා මාවත ලුම්බිණිය අසළ කාණු කොටස සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.98000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

එස්.ජී.ජ්. ද සිල්වා මාවත ලුම්බිණිය අසළ කාණු කොටස සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.98000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.18 හල්වතුර කසළ අංගණයේ කසල වැසීමේ කටයුතු සඳහා පස් ලබා ගැනීම සභා අරමුදලින් සිදුකිරිම සඳහා රු.498400/= ක ඇස්තමේන්තුව ගතකරන ලදී.**

**තීරණය**

හල්වතුර කසළ අංගණයේ කසල වැසීමේ කටයුතු සඳහා පස් ලබා ගැනීම  සහා අරමුදලින් සිදුකිරිම සඳහා රු.498400/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**(11)** **වෙනත් කරුණු**

**11.01 විලේගොඩ ග්‍රාමය සිට ප්‍රධාන මාර්ගයට දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් තැනීම පිළිබඳ සාකච්ඡාව සම්බන්ධ වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විලේගොඩ ග්‍රාමය සිට ප්‍රධාන මාර්ගයට දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් තැනීම පිළිබඳ සාකච්ඡාව සම්බන්ධ වාර්තාව යෝජනා කරනවා. මේ සම්බන්ධව තවත් සාකච්ඡාවක් පැවැත්වෙනවා ජුලි මස 11 දින උදේ 10.30ට පැවැත්වේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සේවා ඉංජිනේරුතුමා කලින් දිනය ලබා දුන්නේ ජුලි 09 දහවල් 11.00 ට. නමුත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි එය ජුලි මස 11 වන දින උදේ 10.30 ට වෙනස් කරන්න කැමති වුණා .මේ පිළිබඳ ලිපියක් මඟින් දන්වා සිටින ලෙස ඉල්ලා සිටිනවා .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබුවා.

**තීරණය**

විලේගොඩ ග්‍රාමය සිට ප්‍රධාන මාර්ගය දක්වා දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් තැනීම පිළිබඳව සාකච්ජාව පිළිබඳව වාර්තාව සභාගත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**11.02 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය නවීකරණය කිරිම පිළිබඳ රැස්වීම් වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය නවීකරණය කිරිම පිළිබඳ රැස්වීම් වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය නවීකරණය කිරිම පිළිබඳ රැස්වීම් වාර්තාව සභාගත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**11.03 අම්බලන්ගොඩ නගර සභාවේ කඩ කාමර ටෙන්ඩර් කිරිමේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ කඩ කාමර ටෙන්ඩර් කිරීමේ කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.සභාව සතු පොදු වෙළඳපොළ කඩ කාමර 14,19 ,04,10,13 යන කඩ කාමර 2019.02.18 දින ටෙන්ඩර් කිරීමට ගරු සභාව තීරණය කරන ලදී.ඒ අනුව ටෙන්ඩර් එවීම සඳහා 2019.06.20 දින දක්වා ඉඩකඩ සලසා දී තිබිණි. ඒ අනුව ටෙන්ඩර් ලැබී ඇත්තේ ගණන අඩුවෙනි. එක ටෙන්ඩර් පතකි.ඒ අනුව නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.මේ අවස්ථාවේ අම්බලන්ගොඩ නගරයේ අයට පහසුව සඳහා අපි නගරයේ අයට පමණයි දැන්වීම් පළකරනු ලැබුවේ.මෙය අප පුවත්පත් දැන්වීම් දැම්මානම් ජනතාව ඉල්ලුම් කළයි කියා.ඉලන්නේ නැතිනම් පුවත් දැන්වීම් දමා ලංකාවේ පැමිණෙන ඕනෑම කෙනෙකුට ඉල්ලීමට අවස්ථාව සලසා දිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

අපේ හිටපු නගර සභා මන්ත්‍රී දේවි රුවන් මහතා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ලිපියක් ඉදිරිපත් කර තිබෙනා අංක 13 කඩ කාමරය පිළිබඳ. එතුමා ඉල්ලා සිටිනවා එම කඩ කාමරය පිළිබඳව

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලැබුණා . මා එය වෙනත් කරුණු යටතේ ඉදිරිපත් කර ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය වෙනත් කරුණු යටතේ දමා තිබෙනවා නම් අපි මේ පිළිබඳ තීන්දුවක් ගතහොත් එය ගැටළුවක් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තිබෙනවා. එම නිසා 12.10 ලිපිය මෙයට අදාල නිසා මා කියවනවා.නව ධිවර සංකිර්ණයේ කඩ කාමර අංක 13 ඉහත කඩ කාමර සඳහා ඔබ නගර සභාවෙන් රු.700000/= ක අවම ටෙන්ඩර් මුදලක් නියම කර ඇත. එම මුදල සමාන වාරික 14කින් මසකට රු.50000/= බැගින් ගෙවීමට කඩ කාමරය ලබා දෙන ලෙස ඉල්ලා සිටි.ආර් .පී. දෙව් රුවන් මහතා විසින් ඉල්ලීමක් කර සිටිනවා.

**<u>ගරුඋප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ මෙය ලබා දිය යුතුයි. මොකද වෘත්තියෙන්ම ධිවර කටයුතු සිදු කරන පුද්ගලයෙකි.ඒ අනුව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා සමාන වාරික 14කින් බදු මුදල් සමඟ ගෙවීමට එකඟ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ කඩ කාමර කොතනද තිබෙන්නේ. ඒ කියන්නේ ධිවර සංකිර්ණයේද ? පොදු වෙළඳපොළේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නව ධිවර සංකිර්ණයේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

දැන් පොදු වෙළඳ සංගමයේ තිබෙන කඩ කාමර මේ පැත්තට හරවන්න දෙන්න එපා. එම නිසා තමයි අභාවයට පත් වී තිබෙන්නේ පොදු වෙළඳපොළ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ එක නෙමේ.

**<u>ගරුඋප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය සම්පූර්න ගැටළුවකි.ඒ සමඟම මේ කඩ කාමරය සඳහා කඩ කාමර කුලිය ගෙවිය යුතුයි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කඩ කාමර කුලිය කොහෙමත් ගෙවන්න ඕන. එක්වන් වාරිකය පහසුගෙවීමේ ක්‍රමය යටතේ රු.50000 බැගින් සමාන වාරික 14කින් ගෙවීමට ලබා දෙනවා. ඒ සඳහා අවශ්‍ය ගිවිසුම ගිවිසුම්ගතවී ලබා දීමට සභාව එකඟ වෙනවා.

**<u>ගරුඋප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඉතිරි කඩ කාමර ටෙන්ඩර් කිරිම සඳහා පුවත් පත් දැන්වීම් පලකරන ලෙස ඉල්ලා සිටිනවා.නැතිනම් මේවා ගන්නේ නැහැ. සභාවට විශාල පාඩුවක් මේවා වසා දමා තිබෙන එක.මෙය බලහත්කාරයෙන් අල්ලාගෙන සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හොඳයි ඒ අනුව කටයුතු කරන්නම්.

**තීරණය**

සභාව සතු පොදු වෙළඳපොළ කඩ කාමර 14,19 ,04,10,13 යන කඩ කාමර 2019.02.18 දින ටෙන්ඩර් කිරිමට ගරු සභාව තීරණය කරන ලදී.ඒ අනුව ටෙන්ඩර් එවීම සඳහා 2019.06.20 දින දක්වා ඉඩකඩ සලසා දි තිබිණි. ඒ අනුව ටෙන්ඩර් ලැබි ඇත්තේ ටෙන්ඩර් කරන ලද මුදලට වඩා අඩුවෙනි. එක ටෙන්ඩර් පතකි. ඒ අනුව අංක 13 කඩ කාමරය ආර්.පී දේව් රුවන් මහතා විසින් එක්වන් වාරික මුදල සමාන වාරික 14කින් බදු මුදල් සමඟ ගෙවීමටත් , පොදු වෙළඳපොළ කඩ කාමර අංක 14,19 ත්, නව මාළු වෙළඳ සංකිර්ණය 04,10ත් නැවත පුවත්පත් දැන්වීම පල කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**(12)** **න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු**

**12.01 රතුකුරුස නිවාස හිමියන් විසින් ස්තුති පුද කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පල්ලේතොට, ගොඩහේන රතුකුරුස නිවාස හිමියන් විසින් ස්තුතිය පුද කිරිම.නිවාස 56කින් යුත් අප ගම්මානය ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් නොමැතිව පිඩා විදියි.මෙහිදි අප මුහුණ දි තත්ත්වය හා පරිසර

හානිය වටහාගත් ගරු උප සභාපතිතුමා ඔබතුමා හා සියළුම ගරු නනගර සභා  මන්ත්‍රීවරු සියළු දෙනා දැනුවත් කිරිමෙන් අනතුරුව අම්බලන්ගොඩ නගර සභාව සතු සම්පත් උපයෝගි කර ගනිමින් සිදුවිමට ගිය පරිසර හානිය වලක්වා ගැනිමටත් නියමිත අපදව්‍ය ඉවත් කිරිමට කටයුතු කිරිම පිළිබඳව ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය පුද කර සිටින බව සියළු දෙනා අත්සන් කර ලිපියක් එවා තිබෙනවා.මෙය සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරනවා

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට  රතුකුරුස නිවාස හිමියන් විසින් ස්තුති පුද කිරිම සම්බන්ධ ලිපිය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.02 අම්බලන්ගොඩ , ගොඩහේන රතුකුරුස නිවාස අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අප ප්‍රදේශය පවර ගන්නා ලෙස කරන ලද ඉල්ලිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

රතුකුරුස නිවාස හිමියන් විසින්ම තවත් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අප ප්‍රදේශය පවරා ගන්නා ලෙස ඉල්ලිමක් කර තිබෙනවා.අම්බලන්ගොඩ , ගොඩහේන , පල්ලේතොට රතුකුරුස නිවාස වල පදිංචි අප සැමදෙනා සුනාමිය නිසා නිවාස අහිමි විම වෙනුවෙන් මෙහි පදිංචි අය වේ.මිට පෙර අම්බලන්ගොඩ නගර සභාව යටතේ සියළු සෞඛ්‍ය පහසුකම් යටතේ ජිවත්වූ අය වේ.එහෙත් මෙහි කිසිදු පහසුකමක් නොමැති අප දැනට පදිංචි වි සිටින මේ ප්‍රදේශය අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවට අයත් බල ප්‍රදේශයක් ලෙස සැලකේ. නමුත් මේ ප්‍රදේශය අම්බලන්ගොඩ බල ප්‍රදේශයට අයත් කොටසක් බව නිල නොවන ආරංචි මාර්ග වලින් දැන ගන්නට ලැබේ.එබැවින් නිවාස 56කින් යුත් බිම් ප්‍රදේශය අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට නතුකර ගන්නා ලෙසද අපගේ සියළුම යටතල පහසුකම් සැලසිම සිදුකරන මෙන් ඔබතුමා ඇතුළු සියළුම ගරු නගර සභා මන්ත්‍රීවරුන්ගෙන් බැගැපත්ව ඉල්ලා සිටින බව පවසා සියළුම ජනපද වාසින් අත්සන් කර ලිපියක් එවා තිබෙනවා.ඇත්තටම මේ ප්‍රශ්නය ඉතාමත් දැඩි ප්‍රශ්නයක්.මේ අය සියළුම දෙනා හිටියේ අම්බලන්ගොඩ නගරයේ.පටබැඳිමුල්ල , හිරේවත්ත, හෙප්පුමුල්ල යන කොට්ඨාශ වල තමයි හිටියේ.මේ අයට ඉඩම් ලබා දීම පිළිබඳව ඉඩම් අත්පත් කර දිමේදි ප්‍රාදේශිය සභාවට වැටේ කියන අර්ථය තුල මේ අය අම්බලන්ගොඩ නගර සභාවෙන් බැහැරව තිබෙනවා.නමුත් මේ කොටස මට දැනගන්න තිබෙන විදියට අපේ මායම් කොටස තුළ තමයි තිබෙන්නේ.නමුත් අපේ වරිපණම් ලේඛණයේ මේ කොටස බැහැරවෙලා තිබෙනවා.ඒ නිසා මෙය අපේ තිබෙන ලේඛණත් සමඟ බලා සටන් කළ යුතුයි.මේ ප්‍රදේශ වාසින්ට අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව පහසුකම් සලසන්නේ නැති නිසා ඔවුන් නිතර කරන දෙයක් තමයි කුණුටික බැග්එකට පුරවා ගෙනවිත් පොඩිපාලමේ සිට පොල්වත්ත දක්වා ඇති වෙලට කුණුටික විසිකරන එක.මෙය අම්බලන්ගොඩ ජනතාවට විශාල පාරිසරික ප්‍රශ්නයකි.එම නිසා ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න එදා අපි සභාවෙන් තින්දු කළා අපේ කසළ ගෙනයන ට්‍රැක්ටරය මේ නිවාස වලට තව අඩි 30ක් 40ක් තමයි යාමට ඇත්තේ . එම ප්‍රමාණය ගොස් කසළ ගෙන ආවට කමක් නැහැ කියන තත්ත්වය තුළ.මෙය නොකළොත් ඊට වඩා පරිසර ප්‍රශ්නයකට අපට මුහුණ දෙන්න වෙනවා.එම නිසා මේ ප්‍රශ්නය ඉදිරියට වෙන්න තියෙන දෙය කල්පනා කර බලා තමයි මෙය සිදු කරන්න තිබේන්නේ. මේ ඉඩම ගත්තාම අපගේ අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ මායිම තුල පිහිටා ඇති බව පෙනෙන්නට තිබෙනවා.මෙය ඇත්තටම අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට පවරා ගැනිමට දැනුත් කළ හැකි දෙයක් ලේකම්තුමියණි.මේ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවත් අම්බලන්ගොඩ නගර සභා මායිම් පිළිබඳ ගැසට් එකක් තිබෙනවා . එම නිසා එය බලා ආදායම් පරික්ෂක මහතුන්ගේ වාර්තා ගෙන මෙය පවරා ගැනිමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,ඇත්ත වශයෙන්ම මෙය දීර්ඝ කාලයක් මෙම ඉල්ලීම කරන කතාවකි.සුනාමිව්‍යසනය නිසා අම්බලන්ගොඩ නගරයේ සිටි ජනතාවක් තමයි මේ ප්‍රදේශයේ සිටින්නේ.අද ඒ ජනතාවට විශාල අසාධාරණයකට ලක්වෙලා තිබෙනවා ඒ ප්‍රදේශයට පදිංචියට ගිහින්. මොකද විශේෂයෙන්ම පාසල් දරුවන් ඇතුළත් කිරීමේදි අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාලයට , ධර්මාශෝක විද්‍යාලයට ඇතුළත් විය යුතුව තිබූ දරුවන් අද කුලරත්න විද්‍යාලයටවත් ඇතුළත් කර ගන්නේ ඉතාමත් අසිරුතාවයෙනි මේ ගැටළුව නිසා.ඇත්තටම ගරු සභාපතිතුමනි මෙය අම්බලන්ගොඩ නගර සභා සීමාවේ තිබෙන ඉඩමකි. මෙහි මායිම් වන්නේ මේ නිවාස වලට එහායින් තිබෙන ඇළ මාර්ගයකි.මේ අනුව මගේ නිවස ඉදිරිපිට තිබුණා අක්කර 1 ½ පමණ කැබලි කරන ලද ඉඩම් ප්‍රමාණයක්.මෙය තිබුණේ ප්‍රාදේශීය සභාවට.මා මෙය නගර සභාවට යෝජනා කළ පසු ගාල්ලෙන් පැමිණ පරීක්ෂාකර බලා මෙය අම්බලන්ගොඩ නගර සභාවට අයිති භූමි භාගයක් බව ප්‍රකාශ කළා.අද නිවාස ( ඉඩම් කැබලි 15ක්) පමණ අම්බලන්ගොඩ නගර සභාවට ඇතුළත් වුණා.ඒ නිවාස ඇතුළත් වුණානම් මේ නිවාසත් අම්බලන්ගොඩ නගර සභාවට ඇතුළත් විය යුතුයි. මොකද ඒ අය තීරණය කරනු ලැබුවේ සීමාව ඇළ මාර්ගයයි. හල්වතුර ඇළ හරහා දිවෙන කුඩා ඇළක් තමයි මේ මායිමට සිතියම් කර තිබෙන්නේ.එම නිසි අම්බලන්ගොඩ නගර සීමා බල ප්‍රදේශය තුල තමයි මේ නිවාස සංඛ්‍යාව බිහිවෙලා තිබෙන්නේ.මේ ඉඩම් දෙකම හිටිය පවුල්වල අය මා දන්නා විදියට අම්බලන්ගොඩ නගර සභාවට තමයි ඡන්දය පාවිච්චි කරනු ලැබුවේ.සමෘද්ධි සහනාධාරත් ලබා ගත්තේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි තල්ගස්ගොඩින් තමයි ලබා ගත්තේ.මෙය ග්‍රාම නිලධාරින් දෙදෙනෙකු විසින් කරන ලද ඉතාම ආසාධාරණ ක්‍රියාවකි.එම නිසා මෙය නිවැරදි විය යුතුමයි.ඒ ජනතාවගේ ඉල්ලීම ඉතාමත් සාධාරණයි.ඒ අය ඉල්ලන ඉල්ලීම. මෙය ගරු ප්‍රාදේශීය ලේකම්තුමියත් සමහත් සාකච්ඡා කර ඔබතුමා මේ කටයුත්තට මැදිහත්වී මෙය ඉටුකරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එම ඉඩම් කොටස නගර සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ , ගොඩහේන පල්ලෙතොට රතුකුරුස නිවාස වාසින් විසින් කරන ලද ඉල්ලීමට අනුව එම ප්‍රදේශය අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට පවරා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවත්, නගර සභා මායිම් පිළිබඳව අදාල ගැසට් පත්‍රය බලා ආදායම් පරීක්ෂක මහත්වරුන්ගේ වාර්තාව අනුව එම ප්‍රදේශය පවරා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

## 12.03 පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ද්විතියික නගර ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධ ලිපිය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවන ද්විතියික නගර ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය ස්වදේශ කටයුතු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත උක්ත ව්‍යාපෘතිය සඳහා ඔබ පළාත් පාලන ආයතනය තෝරාපත් කරගෙන ඇති බව සතුටින් දැනුම් දෙන අතර එම ව්‍යාපෘතිය යටතේ ඔබ පළාත් පාලන ආයතනය සඳහා රුපියල් මිලියන 550ක ප්‍රතිපාදන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත වේ.මේ සම්බන්ධව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ කණ්ඩායමක් නුදුරු දිනයේදි ඔබ ආයතනයට පැමිණෙනු ඇත.ඒ අනුව අදාල පාර්ශවයන් හා සාකච්ඡා කර බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු ව්‍යාපෘති හඳුනා ගන්නා ලෙසත් යෝජිත කණ්ඩායමට අවශ්‍ය සහායෝගය ලබාදෙනලෙස කරුණිකව ඉල්ලා සිටින බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින්

ලිපියක් එවා තිබෙනවා.මෙයට අපට ලොකු වැඩසටහනක් කරන්න පුළුවනි.රුපියල් මිලියන 550ක් අපට මේ යටතේ ලැබෙනවා.මේ මුදල වන රුපියල් මිලියන 550 කුමන ආකාරයෙන් වියදම් කරනවාද කියා අද දිනයේ සාකච්ජා කිරිමට අවශ්‍ය නැහැ.මේ මුදල කුමන ආකාරයෙන් නගරය තුළ සංවර්ධනය කළ යුතු කියා යෝජනා ඉදිරිපත් කරන්න කියා සියළුම ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය**

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පළාත් පාලන ආයතන සඳහා රු.මි.550 ක ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා වෙනම සකච්ඡා කර මේ මුදල් කුමන ආකාරයයෙන් නගරයේ සංවර්ධනය සඳහා වියදම් කළ යුතුද යන්න යෝජනා ගරුමන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.04 නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා පිළිබඳ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිදහස් අයුර්වේද බෙහෙත් ශාලාවේ වාර්තාව ඉදිරිපත් කරනවා.මාසය තුළ පැමිණි රොගීන් සංඛ්‍යාව 172කි.විවෘතව තැබු දින ගණන 20කි.රෝගීන්ට නිකුත් කළ ඖෂධවල වටිනාකම රු.15864.42ක් ලෙස ඉදිරිපත් කරනවා.

**තීරණය**

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2019 මැයි මස වාර්තාව ගරු සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.05 අම්බලන්ගොඩ නගර සභාවේ ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳව වූ ස්ථාවර කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවේ අපදාකළමණාකරණ කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභිකයන් පත්කිරිම පිළිබඳ සාමාජිකයන් නම් කිරිම.අම්බලන්ගොඩ නගර සභාවේ අපදා පිළිබඳ ස්ථාවර කාරක සභාව නගර සභා ආඥා පණතේ 129 1 උප වගන්තිය ප්‍රකාරව නගර සභිකයන් පමණක් හා නගර සභිකයන්ට සමාන ප්‍රමාණයක් නගර පුරවැසියන් සමන්විත කමිටුවකින් සමන්විය යුතුය.ඒ අනුව මෙම කමිටුවේ සාමාජිකයන් කවුරු විය යුතුද නිරික්ෂණ මට්ටමේ සාමාජිකයන් කවුරුන් විය යුතුද යන්න පිළිබඳ උපදෙස් පතනවා. නගර සභාවේ ධාරිතාවෙන් අඩක් හා ප්‍රජා මණ්ඩල ධාරිතවෙන් හරි අඩක් ලෙස නම්කර ඇත.දැනට නගර සභාවේ ලියාපදිංචි ප්‍රජා මණ්ඩල 8ක් බව ප්‍රජා සංවර්ධන නිළධාරි විසින් දන්වා තිබෙනවා.ඒ අනුව නගර සභාව සඳහා දැනට ක්‍රියාත්මක කමිටු වලට අමතරව අපදා කළමනාකරණ කමිටුවක් පිහිටුවිමට යෝජනා කරනවා.ඒ අනුව තීන්දු කළ යුතුයි මෙහි නගර සභා ආඥා පණතේ 29 1 වගන්තියට ප්‍රකාරව මෙයට නගර සභිකයන් කිදෙනෙකු නම්කරනවාද? ඒ හා සමාන කොටසක් පිටතින් යෝජනාකරනවාද යන තත්ත්වය යටතේ තමයි යන්නේ.මේ අපදා කළමනාකරණ කමිටුවට ඊළඟ සභාවේදි යෝජනා කරනවාද?ගරු මන්ත්‍රිවරු යෝජනා කරන්න මා හිතනවා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපදා කළමනාකරණ කමිටුව සඳහා සාමාජිකයන් පත්කර ගැනිම ලබන සභාව දක්වා කල්තබන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ප්‍රජා මණ්ඩල හදද්දි අපට ලොකු ගැටළුවක් වෙලා තිබෙනවා. පටබැඳිමුල්ල නිල සෙවණ හදන එකට ලක්ෂ 2ක් පැමිණ තිබෙනවා ගරු විෂයභාර අමාත්‍යතුමාගෙන්. එහිදි ගරු මන්ත්‍රීතුමිය සමඟ ගොස් බලන විට ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි වි නැහැ.ගමේ සමිතියක්ම අනිවාර්යෙන්ම දමන්න කිවුවා. පිට සමිතිවලින් කොන්ත්‍රාත් කරන්න කලින්.එමනිසා ලොකු අපහසුතාවයකට ලක්වෙලා තිබෙනවා එතුමිය ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි කර නැහැ.එම නිසා එම කාර්ය කරගන්න ඉක්මනින් සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඇයි පටබැඳිමුල්ලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි අය ඉන්නවානේ.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ග්‍රාම සංවර්ධන සමිතියේ පුද්ගලික පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.පුද්ගලික ගැටුමක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මා දැන් ප්‍රජා සංවර්ධන නිලධාරිට එය කියා තිබෙන්නේ.මේ මසය ඇතුළත අපි කර දෙන්නම්.පටබැඳිමුල්ලේ අර ළමයි ටික දෙනෙක් සිටිනවා. ඒ ළමයිට මා කිවුවා එකතු වෙලා වැඩය කරන්න කියා.යම් සේවාවක් ඒ අයගෙන් කෙරෙන බව මට පෙනෙනවා.ඒ අනුව වැඩිහිටි පරණ අයට වැඩිය හොඳයි අලුත් ටික.ඒ අය සමාජයේ මේවාට පැමිණිය යුතුයි. අපි බලන්නම් මෙය කර දෙන්න.මා ප්‍රජා සංවර්ධන නිලධාරිට මේ ළමයා හඳුන්වා දුන්නා. මේ ළඟදි ලේ දන්දීමේ ව්‍යාපාරයක් කරනු ලැබුවේ අන්න ඒ ළමයා මා කියන්නේ . පේෂලා මන්ත්‍රීතුමියගේ නිවස ළඟ

**තීරණය**

අම්බලන්ගොඩ , නගර සභාවේ ආපදා කළමණාකරණ කටයුතු පිළිබඳව වූ ස්ථාවර කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරිම ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කළ අතර , එය ලබන සභාව සඳහා ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර , ගරු නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## 12.06 සභා ලිපිකරු මහත්මිය විසින් සභා වාර්තා කටයුතු සිදු කරන පරිගණකය හා උපකරණ සම්බන්ධව කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

සභා වාර්තා සකස් කරනු ලබන පරිගණකය අවස්ථා කිහිපයකදිම වරින් වර ක්‍රියාවිරහිත විය. එම නිසා සභා වාර්තාවේ වැඩ රාජකාරි කටයුතු සිදු කිරිමේදි මා දැඩි අපහසුතාවයකට පත්විය. දැනට අක්‍රිය තත්ත්වයේ පරිගණකය පවති. සභා වාර්තාවේ වැඩ කටයුතු අඛණ්ඩව නිසියාකාරව සිදු කළ යුතු නිසා නව පරිගණකයක් , එම පරිගණක යන්ත්‍රය ලබාදෙනතෙක් දැනට පවතින පරිගණකය අලුත්වැඩියා කටයුතු සිදු කරන ලෙසත්, දැනට මා රාජකාරි කටයුතු සිදුකරනු ලබන්නේ සාමාන්‍ය මේසයක බැවින් දෛනිකව දවස මුළුල්ලේම යතුරුලියන කටයුතු සිදු කරන බැවින් එහිදි යතුරු ලියන කටයුතු සිදු කිරිමට සුදුසු මේසයක් හා පුටුවක් , දැනට මා භාවිතා කරන කාබඩ්එක ක්‍රිඩාභූමි භාරකරු වන අශෝක මහතාගේ කාබඩ් එකක් වන අතර එය ඉඩකඩ මදිබවත් සභාවාර්තාවට අවශ්‍ය ලිපිගොනු , ලිපි , තබා ගැනිමට අවශ්‍ය කාබඩ් එකක් ලබාදෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි ,එය ලබා දෙන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ සභා වාර්තා රාජකාරි කටයුතු සිදු කරන නිලධාරිණිය සඳහා

01. දැනට අක්‍රිය තත්වයේ පවතින පරිගණකය අලුත්වැඩියා කටයුතු සිදු කිරිමත්

02. සභා වාර්තාවේ වැඩකටයුතු අඛණ්ඩව නිසියාකාරව සිදු කිරිම කළ යුතු නිසා ඉතා හොඳ වර්ගයේ නව පරිගණකයක් ලබා දීමත්

03. පරිගණක මේසයක් හා පුටුවක් ලබා දීමත්

04. සභාවාර්තා , ලිපිගොනු ලිපිද්‍රව්‍ය තබා ගැනිමට අවශ්‍ය කාබඩ් එකක් ලබා දිමත් , සුදුසු සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.07 අම්බලන්ගොඩ නගර සභා ශාලාවේ අලුත්වැඩියා කටයුතු කිරිමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනිම සඳහා අවශ්‍ය ලිපිය සභාගත කරන ලදී**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභාවේ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පිළිබද ඉල්ලිමයි. අප නගර සභාවේ අළුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා සභාවේ පුහුණු ශ්‍රමිකයන් සිටින බැවින් ඔවුන් මඟින් මෙය ඉටුකර ගැනිමට වැලි කියුබ් 05, සිමෙන්ති කොට්ට 50, පොට් කොට්ට 50 ආදි ලෙසය.මේ සඳහා ගරු සභාවේන් අනුමත කරන ලෙස ඉල්ලිමස් කර සිටිනවා.සභාවේ දැනට ඉහළ මහළය අලුත්වැඩියා කටයුතු සිදු කරනවා.කොන්ත්‍රාත් දි නෙමේ අලුත්වැඩියා කටයුතු කරන්නේ. සභා සේවකයන් මඟින් තමයි එම වැඩය කරන්නේ.මෙම භාණ්ඩ ගැනිමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ශාලාවේ අලුත්වැඩියා කටයුතු කිරීමට( කපලාරුව සඳහා ) අවශ්‍ය ද්‍රව්‍ය වන, වැලි කියුබ් 05, සිමෙන්ති කොට්ට 50,පොට් කොට්ට 50ක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.08 අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා නිත්‍ය නිලධාරියෙකු පත් කරන තෙක් , ඔබගේ නිත්‍ය තනතුරට අමතරව ඔබ උක්ත තනතුරේ වැඩ භාරගත් දිනයේ සිට ලේකම් තනතුරේ වැඩ බැලිම සඳහා ඔබ පත්කරන බව දකුණු පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි. ඒ අනුව සභාවේ එකඟත්වය ලබා දෙනලෙස ලේකම්තුමියට ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා ආර්.යු.ඩබ්.ජ්. ගුණවර්ධන මිය පත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.09 පළාත් පාලන කොමසාරිස් විසින් යොමුකරන ලද අයාලේ යන සුනඛයන්ගෙන් මහජනතාවට සිදුවන අවහිරතා වැලැක්වීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අයාලයේ යන සුනඛයින්ගෙන් මහජනතාවට සිදුවන අවහිරතාව වැලැක්වීම.අයාලයේ යන සුනඛයින් ඉහළ යාමත් සමඟ මහජනතාවට ඇතිවන පිඩාව වැඩිවීමත් සමඟ රෝගාබාධ නිසා රජයට විශාල වියදමක් දැරීමට සිදුවන බව එම සාකච්ඡාවේදි අනාවරණය විය. මීට අදාලව ආඥා පණතවල් මඟින් අයාලයේ යන සුනඛයින් පිළිබඳ කටයුතු කිරිමට බලතල පැවරි ඇති බව සිහිපත් කෙරේ.1941 අංක 13 ජලභිතිකා රෝගය පිළිබඳ ආඥා පණත 1938 අංක 16 දරණ බල්ලන් ලියාපදිංචි කිරිමේ ආඥා පණත ඉහත තත්ත්වය යටතේ මර්ධනය කිරිම සඳහා පහත සඳහන් පියවර ගන්නා ලෙසද ඔබ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හා පශුවෛද්‍ය නිලධාරි සම්බන්ධ කරගෙන සුදුසු වැඩ පිළිවළක් ආරම්භ කිරිම , අදාල කාර්යයන් සඳහා පහසුකම් ලබා දීම , අදාල පළාත් පාලන ආයතන මඟින් පවත්වාගෙන යන සුනඛ රැඳවුම් මධ්‍යස්ථාන පරික්ෂා කිරිම,පහසුකම් ලබා දීම සිදු කරන කාර්යයන් පිළිබඳ මා වෙත වාර්තා කිරිම දකුණු පළාතේ ජලභිතිකා රෝගය තුරන් කිරිමට ඔබ විසින් දක්වන සහායෝගය ඉතා අඟය කොට සලකන බවට පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිපියකින් දන්වා සිටිනවා. වැඩසටහනක් හදා යොමු කරන්න එයට.

**තීරණය**

අයාලේ යන සුනඛයන්ගෙන් මහජනතාවට සිදුවන අවහිරතා වැලැක්වීම සඳහා වැඩසටහනක් සැදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදි.

**12.10 නව ධිවර වෙළඳ සංකිර්ණයේ කඩ කාමර අංක 13 සම්බන්ධව ආර්.පී දේව් රොහාන් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ලිපිය 11.03 ලිපිය කඩකාමර ටෙන්ඩර් කිරිම ඉදිරිපත් කරන අවස්ථාවේ ඉදිරිපත් කළ අතර එම කඩ කාමරය එක්වන් මුදල වන රු.700000/= ක මුදලකට මසකට රු.50000/= බැගින් සමාන වාරික 14කින් බදුමුදල් සමඟ ගෙවිම සුදුසුයි.

**තීරණය**

ආර්.පි දේව් රොහාන් මහතා විසින් අංක 13 දරණ ධිවර සංකීර්ණයේ කඩ කාමරය සඳහා එක්වන් මුදල වන රු.700000/= ක මුදලකට මසකට රු.50000/= බැගින් සමාන වාරික 14කින් අදාල බදු මුදල් සමඟ ගෙවිමට අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.11 අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරිම. අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාවේ සමාජිකයන් පහත පරිදි වේ.නගර සභා ආඥා පණතේ 29(1) වගන්තියේ ප්‍රකාරව නගර සභාවේ සභිකයන් ගණනට සමාන ගණකින් සමානට සමාන ගණනක් කමිටුවේ සමාජිකයන් ගණනක් සමන්විත විය යුතුය.ඒ අනුව ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයන් කවුරුන් විය යුතුදැයි දැන ගැනිමට සභාවට ඉදිරිපත් කරනවා.නගර

සභාවේ ඒ සඳහා ගරු මන්ත්‍රීවරු නමදෙනෙක් සහභාගි වෙනවා.නගර වැසියන් දහදෙනෙකු සහභාගි වෙනවා.නිරීක්ෂණ මණ්ඩලය පහළොස්දෙනෙකු සහභාගි වෙනවා.මේ සම්බන්ධවත් තීන්දුව ගැනීම ඉදිරි සභාවට යොමු කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කළ අතර , එය ලබන සභාව සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## 12.12 සිසු නැණ ප්‍රදීප දෙවන වාර සඳහා 6,7,8,9,10,11 ශ්‍රේණි සිසුන් සඳහා ගණිත වැඩමුළුව -2019 සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සිසු නැණ ප්‍රදීප දෙවන වාර සඳහා 6,7,8,9,10,11 ශ්‍රේණි සිසුන් සඳහා -2019 වර්ෂය සඳහා ගණිත වැඩමුළු පැවැත්වීම. අම්බලන්ගොඩ ප්‍රදේශයේ මෙවර 6-11 ශ්‍රේණිය දක්වා විභාගයට පෙනී සිටින දූ දරුවන් වෙනුවෙන් ගණිත වැඩමුළු පැවැත්වීම සඳහා ඔබතුමාද සහභාගි කරවීමට අපේක්ෂා කරයි. මෙම වසරේ මේ වැඩසටහන අලුත්ම වැඩසටහනක් වන අතර සහභාගි වන දරුවන්ට සහතික පත්‍ර පිරිනැමීම අයකිරීමකින් තොරව නොමිලේ පැවැත්වෙන මෙම වැඩසටහනට ඔබතුමාගේ සම්පූර්ණ සහාය සහ සහතික කෙරෙහි ඔබතුමාගේ වටිනා අත්සනද බලාපොරෝත්තුවේ.මේ වැඩසටහන ඔබතුමාගේ ආශිර්වදයෙන් ජුලිමස 08 වෙනදින ආරම්භ කිරීමට බලාපොරෝත්තු වේ.ඒ සඳහා ශාලා පහසුකම් ලබා දී ඇත්තේ සුවන රෝහල ඇති සිරිකත සුප්‍රිම් ආයතනය බව දන්වා සිටි. මේ වැඩසටහන ප්‍රවිණ ශිෂ්‍යාත්ව දේශක නදුන් තුෂාර වන මහතා විසින් බව දන්වා ඇත.හැකි ඉක්මනින් මේ සඳහා සහයෝගය බලාපොරෝතුත වේ. එය ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සහයෝගය සම්පූර්ණ ලබා දෙන්න. අපේ කළුවඩුමුල්ල ග්‍රාමයටත් පුළුවන් නම් එතුමා හරහා අවස්ථාවක් ලබා දෙන්න.

**තීරණය**

2019 සිසු නැණ ප්‍රදීප දෙවන වාර සඳහා 6,7,8,9,10,11 ශ්‍රේණි සිසුන් වෙනුවෙන් පැවැත්වෙන වැඩමුළුව සඳහා අවශ්‍ය සහාය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.13 සිසු නැණ ප්‍රදීප 5 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාත්ව සිසුන් සඳහා වැඩමුළුව -2019 සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සිසු නැණ ප්‍රදීප 5 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාත්ව සිසුන් සඳහා වැඩමුළුව 2019 වර්ෂය සඳහාය. මීට කලිනුත් පෙර වර්ෂවල මේ කාර්ය වෙනුවෙන් සහයෝගය ලබා දී තිබෙනවා.අම්බලන්ගොඩ ප්‍ර දේශයේ මෙවර ශිෂ්‍යාත්ව විභාගයට පෙනී සිටින දූදරුවන්වෙනුවෙන් අධ්‍යාපනය සම්බන්ධ සම්මන්ත්‍රණ මාලාව සඳහා ඔබතුමා සහභාගි කරවා ගැනීමට අපේක්ෂා කර සිටි.ගියවසරේද ඔබතුමාගෙන් ලැබුණු සහයෝගය අපේක්ෂා කරන අතර මේ වසරේද මේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමාගේ සහභාගිත්වය අපේක්ෂා කර සිටිනවා.සහභාගි වන සියළුම දරුවන්ට නොමිළේ පැවැත්වෙන අතර අම්බලන්ගොඩ නගරයේ පොලිසියේ රථවාහන අංශයේ සහයෝගයද ලබා ගැනීමට අපේක්ෂා කරනවා.මේ වැඩසටහන

ඔබතුමාගේ ආශිර්වාදයෙන් අම්බලන්ගොඩ ප්‍රදේශයේ පැවැත්වීමට බලාපොරෝත්තු වේ.ජුලි 06 වෙනි සෙනසුරදා සවස 2.00-5.00 දක්වා පැවැත්වීමට අපේක්ෂා කරයි. මේ කටයුත්ත සඳහා ශාලා පහසුකම් ලබාදෙනු ලබන්නේ සුවන හා සිරිකත සුප්රිම් අධ්‍යාපන ආයතනය බව දන්වා සිටි .පසුගිය වසරේ සිදුකර අත්පත්‍රිකා ද අමුණා ඇත.මේ සඳහා ඔබගේ සහායෝගය හැකි ඉක්මනින් බලාපොරෝත්තුවන බව නදුන් තුෂාර මහතා විසින් දන්වා ඇත.5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා . පසුගිය වසරේත් අප කළා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාවක්.සියළු වියදම් ඒ අය දරනවා. අපට තිබෙන්නේ සහාය දක්විමට පමණි.ඒ සඳහා සහාය අවශ්‍යා සහාය දැක්විය යුතුයි.

**තීරණය**

2019 සිසු නැණ ප්‍රදීප 5 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යාත්ව සිසුන් වෙනුවෙන් පැවැත්වෙන වැඩමුළුව සඳහා අවශ්‍යා සහාය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.14 2019.06.24 දින කොට්ඨාශ අංක 13 හි කොටසක් වන තල්ගස්ගොඩ ප්‍රදේශය ආවරණය කරමින් පවත්වා හිඟ වරිපණම් එකතු ජංගම සේවයේ ආදායම් විස්තරය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

හිඟ වරිපණම් එකතු කිරිමේ තල්ගස්ගොඩ ප්‍රදේශයේ ආදායම් විස්තරය.2019.06.29 දින ජංගම සේවයෙන් කාර්යාලයට ලැබුණු මුදල රු.78628. 2019.06.29 දින ක්ෂේත්‍රයේ එකතු කරන ලද මුදල රු.277389.26කි 2019.06.29 දින ජංගම සේවයෙන් එකතු කරන ලද මුදල රු.355017.26කි. මෙම වැඩසටහනට අදාලව යවනු ලබන ලිපිවලට අනුව 2019.07.01 දින වන වට කාර්යාලයට ගෙවා ඇති මුදල රු.81063.06 කි.ජංගම සේවයට අදාලව මේ වන විට අදාලව ලැබි **ඇති මුළු මුදල රු 436080.32කි**. මෙපමණ මුදලක් ලැබි ඇත. මෙය සභාවේ දැනුවත් කිරිම සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය සභාපතිතුමාගේ විශේෂ දැනුවත් කිරිමක් ලෙස ක්‍රියාත්මක වන වැඩසටහනකි.මේ සඳහා මා හිතන්නේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් විශාල කාර්ය භාර්යක් ඉටු කළා. එම නිසා සභාවේ ගරු මන්ත්‍රිවරු වශයෙන් මේ සඳහා සහභාගි වු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතිය පුද කරනවා.මෙවැනි ජංගම සේවයක් පැවැත්විම නිසා ජනතාවට විශාල සේවයක් සිදු වෙනවා.කාර්ය බහුල ජිවිතයක් ගත කරන ජනතාව මෙවගේ සේවයක් ලබා දුන්විට ජංගම සේවය දමා තිබු කාර්යාලයේ මුදල් ගෙවිමට පෝලිමේ සිටියේ.එම නිසා අනෙක් කොට්ඨාශවලටත් මෙය ක්‍රියාත්මක වුවහොත් නගර සභාවේ තිබෙන හිඟ වරිපණම් අයකරගත හැකියි.එම නිසා මෙය ක්‍රියාත්මක කිරිම ඉතාමත් වැදගත් කටයුත්තක් ලෙස අප දකිනවා.මෙහි මා දකිනවා තල්ගස්ගොඩ කොට්ඨාශ අංක 13 ලෙස තමයි සටහන් වෙන්නේ. එම නිසා එය නිවැරදි විය යුතුයි. දැන් භාවිතා වන්නේ කොට්ඨාශ අංක 02 ලෙසයි.සිවා නිර්ණ අනුව තල්ගස්ගොඩ ප්‍රෙද්ශය කොට්ඨාශ අංක 02 ලෙස නිවැරදි විය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මාත් දැනුවත් වුවා තල්ගස්ගොඩ ප්‍රදේශයේ එම කටයුත්ත පිළිබඳව.උප සභාපතිතුමා ප්‍රකාශ කළ පරිදි මටත් සිදුවෙනවා කාර්ය මණ්ඩලයට ඒ සඳහා ස්තුතිය පුද කිරිමට. අපේ ගමේත් ඉදිරියට පවත්වයි.මේ සඳහා අපි උපරිම සහායෝගය ලබා දෙනවා.නැවත වරක් ස්තුතිය පුද කරනවා මේ සඳහා සුවිශේෂි සේවාවක් ඉෂ්ඨ කිරිම වෙනුවෙන්.

**තීරණය**

2019.06.24 දින කොට්ඨාශ අංක 13 හි කොටසක් වන තල්ගස්ගොඩ ප්‍රදේශය ආවරණය කරමින් පවත්වා හිඟ වරිපණම් එකතු ජංගම සේවයේ ආදායම් විස්තරය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.15 පෝරඹ වලව්ව පාර නගර සභාවට පවරා දිම සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පෝරඹ වලව්ව පාර නගර සභාවට පවරා දිම සම්බන්ධව පැවරුම් නියෝග සහිත ලිපි නගර සභාවට භාර දී තිබෙනවා.ඒ අනුව එම පාර පවරා ගත යුතුයයි යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, වලව් වත්ත පාර ගම්පෙරළිය වේගවත් කිරිමේ වැඩසටහන සඳහා ඉදිරිපත් කළා. එම මාර්ගය ගම්පෙරළිය මගින් හැදුවා. ඒ අතුරු මාර්ගයක් තමයි මේ ඉදිරිපත් කර ඇත්තේ.

**තීරණය**

පෝරඹ වලව්ව පාර නගර සභාවට පවරා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.16 පී.එච්.ආර්. සුමනාදාස මාවත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරිම සම්බන්ධව කේ .ආර්.කේ එන්ටප්‍රයිසස් ආයතනය අදාළ කොන්ත්‍රාත්තුව භාර ගැනිමට නොහැකිබව දන්වා තිබිම සම්බන්ධව ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පී.එච්.ආර්. සුමනාදාස මාවත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරිම සම්බන්ධව කේ .ආර්.කේ එන්ටප්‍රයිසස් ආයතනය අදාළ කොන්ත්‍රාත්තුව භාර ගැනිමට නොහැකිබව දන්වා සිටිම.ඉහත කර්මාන්තය අප ආයතනයට කිරිමට නොහැකි බව දන්වා සිටිනවා.

ගරු සභාපතිතුමනි, එහෙම දෙනවා නම් ඒ අය බ්ලැක් ලිෂ්ට කළ යුතු වෙනවා.එහෙම කර ඒ අය බැහැ කියනවා නම් මොනවා හරි තීරණයක් ගත යුතු වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එහි සිදුවි ඇත්තේ මෙයයි.ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් නගර සභා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවට වඩා රු55515.62 ක මුදලක් ඉක්මවා ඇති බැවින් ප්‍රතික්ෂේප කර ඇත. නගර සභා ඇස්තමේන්තුවට උක්ත කාරණය කිරිමට නොහැකි බව දැනුම් දි ඇත. ටෙන්ඩර් කරන්න. නැතිනම් මේ සඳහා අනුමත සමිතියක් ලබා දෙන්න

**තීරණය**

පී.එච්.ආර්. සුමනාදාස මාවත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරිම සම්බන්ධව කේ .ආර්.කේ එන්ටප්‍රයිසස් ආයතනය අදාළ කොන්ත්‍රාත්තුව භාර ගැනිමට නොහැකි බව දන්වා තිබිම සම්බන්ධව මෙය නැවත ටෙන්ඩර් කිරිම , නැතිනම් අනුමත සමිතියක් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.17 අම්/නස/02/03 විෂයෙහි රාජකාරි කටයුතු කරන නිලධාරි මහත්මියගේ පරිඝණකය සඳහා මොනිටර් එකක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඩී.එච්.ෂෙහාරා මධුවන්ති (කළමනාකාරණ සහාකාර ) නව Monitor එකක් ලබා ගැනීම . 2.3 විෂයෙහි රාජකාරි කරන මාගේ Monitor එක ක්‍රියා විරහිත වූ අතර අලුතින් නව Monitor එකක් ලබා ගැනීමට ඔබතුමාගේ අවසර ඉල්ලා සිටි. එය අළුත්වැඩියා කටයුතු සිදු කළ නොහැකි බව තොරතුරු තාක්ෂණසේවා නිලධාරිගෙන් දැන ගතිමි.ඒ සඳහා ඇයට නව Monitor එකක් ලබා දෙන ලෙස ඉල්ලිමක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**

එය ලබාදෙන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එය ලබා දෙන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ අම්/නස/02/07 විෂයෙහි රාජකාරි කටයුතු කරන නිලධාරි මහත්මියට නව Monitor එකක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.18 වෙලබොඩවත්ත ඉඩමට ප්‍රවේශ මාර්ගය නගර සභාවට පැවරිම සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වෙලබොඩවත්ත ඉඩමට ප්‍රවේශ මාර්ගය නගර සභාවට පවරා දිමට අදාල පැවරුම් නියෝග නගර සභාවට ඉදිරිපත් කර ඇත.වරිපණම් ගෙවනු ලබන පිටපත් අමුණා ඇත.මෙහි ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කවුද මෙය යොමු කර ඇත්තේ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සාම විනිසුරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ පැවරුම් නියෝග වල තවත් ගරු එක් මන්ත්‍රීවරයෙකුට කියා අත්සන් කර ගන්න. ඉදිරි කටයුතු සඳහා යොමු කරනවා.

**තීරණය**

වෙලබොඩවත්ත ඉඩමට ප්‍රවේශ මාර්ගය නගර සභාවට පැවරිම සඳහා ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝගවලට අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.19 ක්‍රීඩා අරමුදල් ගිණුම අහෝසිකර එහි මුදල පොදු ගිණුමට මාරු කිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විගණන විමසුම් වලදි ලැබි තිබෙනවා ක්‍රීඩා අරමුදලක් පවත්වාගෙන යන බව.එය ක්‍රීයාකාරි නොවන නිසා එහි ශේෂය පොදු ගිණුමට මාරු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය යවත්කාලින කළානම් හොඳයි.පොදු ගිණුමට මාරු කරනවාට වඩා. මොකද මොනවාහරි ප්‍රශ්නයක් එහෙම ඇතිවෙයි. ක්‍රීඩකයන්ට මොනවාහරි සහනයක් ලබා දෙන තත්ත්වයක් ඇති වුවහොත් එහෙම අපට පොදු අරමුදල් ගිණුම් ගැනිමට නොහැකි තත්ත්වයක් ඇති වෙයි.ඊට වඩා හොඳයි මෙය යාවත්කාලින කර පවත්වාගෙන යන එක.එහෙම නැති වුණොත් එහෙම ක්‍රීඩකයෙකුට මොනවා හරි සහනයක් දෙන්න සිදු වුණොත් එහෙම .අම්බලන්ගොඩ කියන්නේ මුළු ලෝකයෙම ක්‍රිඩකයන් බිහි වු නගරයකි.එහෙම නගරයක ක්‍රීඩා අරමුදලක් පිහිටුවා තිබිම ඉතා වැදගත් දෙයක් ලෙස තමයි දකින්නේ.අපට ක්‍රිඩකයෙකුට මොනවාහරි අධාර මුදලක් කරන්න සිදු වුණොත් එහෙම අපට ඒ අරමුදල තිබිය යුතුයි.එය පොදු ගිණුමට හැරෙව්වොත් එහෙම අපට ක්‍රීඩකයන්ට සහනයක් ලබා දෙන්න බැරිවෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැනට මෙම අරමුදලේ තිබෙන්නේ රු.4700/=කි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒක තමයිත එම රු.4700/= ක මුදල හරි යාවත්කාලින කර තබා ගැනිම ලොකු දෙයක් ලෙස තමයි දකින්නේ.මුදල නෙමේ වටින්නේ . අම්බලන්ගොඩ නගරයෙන් බිහි වු ක්‍රීඩකයන්ට අම්බලන්ගොඩ නගරයේ ක්‍රිඩා අරමුදලක් තිබෙන එකයි වටින්නේ.එම නිසා එම මුදල එලෙස තිබිමට හරින ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ නව ගණකාධිකාරිතුමියක් සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම ගැටළුවක් නැති නිසා මෙම ගිණුම පවත්වාගෙන යාම සම්බන්ධව මෙය යාවත්කාලින කර එය පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා</u>**

ගරු උප සභාපතිතුමා ගෙන එනු ලැබු යෝජනාවට හා තීරණය යන කරුණු දෙකටම මා එකඟ වෙනවා.එමෙන්ම මා යෝජනා කර සිටිනවා මෙම ගිණුම යාවත්කාලින කරන ගමන් මෙම ගිණුමේ ශේෂය වැඩි කිරිමට මොනවාහරි ක්‍රමවේදයක් නගර සභාව මඟින් සිදු කළ යුතු බවට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම ගිණුම අපි හදනු ලැබුවේ අපි පසුගිය කාලයේ සිදු කළා නගර සංවර්ධන ක්‍රිඩා උළෙලක්. අපි එම ක්‍රිඩා උළෙල සඳහා මුදල් සපයා ගනු ලැබුවේ අනුග්‍රහක හවතුන්ගෙනි.ඉතිරි වන මුදල් අපි මෙයට යොදා තිබුණා.

ලෝක ළමා දිනය වුණත් මෙයට ඉතිරිවන මුදල් යොමු කරනවා.ඒ විදියට තමයි මෙය පවත්වාගෙන යනු ලැබුවේ. මේ තිබෙන්නේ නගර සභාවේම මුදල් කියන්නත් බැහැ.අනුග්‍රහකයින් විසින් ලබා දුන් මුදල්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා</u>

ගරු සභාපතිතුමනි, අපගේ නගර සභාව තුළ ක්‍රිඩාව පිළිබඳව එවැනි අරමුදලක් තිබෙන එක හොඳයි.මෙය ලොකු ප්‍රයෝජනයක් වෙනවා. ක්‍රීඩාව තුළ අම්බලන්ගොඩ නගරය නම් දරා තිබෙනවා.ජාත්‍යාන්තර ක්‍රිඩකයින් බිහි වුණා.එසෙම දුප්පත් ක්‍රිඩකයකු බිහි වූ විට දැන් ඔය ක්‍රීඩා ගිණුමේ තිබෙන්නේ රු.4741.29 ක මුදලකි. මා දැන ගැනිමට කැමතියි මෙම ගිණුමේ පවතින ශේෂය මදි නිසා එවැනි කාර්යයක් කිරිමට සිදුවුවහොත් එය කෙසේ කරන්නේද කියා.උදාහරණයක් ලෙස ගතහොත් පසුගිය කාලයේ කුලරත්න විද්‍යාලයෙන් බිහිවූ නිපුන් රන්සික ක්‍රීඩකයා. දුප්පත් දරුවෙක්. අන්න ඒ වගේ අවස්ථාවක එවැනි කෙනෙකුට පිහිට වෙන්නේ කෙසේද කියා දැන ගැනිමට කැමතියි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අපේ පණත යටතේ එහෙම දෙයක් දෙනවා නම් අදාල මුදල අනුමත කළාට පසු අදාල විෂයභාර අමාත්‍යතුමාගෙන් අනුමතිය ගත යුතුයි.දැනට තිබෙන තත්ත්වය අනුව ගරු ආණ්ඩුකාරතුමාගෙන් අනුමතිය ලබා දෙන්න පුළුවනි . පණතේ ප්‍රතිපාදනයක් සලසා නැහැ එවැනි දෙයකට මුදල් දෙන්න.නමුත් අපට ක්‍රීඩාව දියුණු කිරිමට කටයුතු කරන්න පුළුවනි.පුද්ගලයෙකුට මුදල් ලබා දෙන්නේ පළාත් සභාව මඟිනි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ පවතින ක්‍රීඩා අරමුදල් ගිණුම යාවත්කාලින කිරිම ( ක්‍රියාකාරි කිරිම ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.20 2019.05.25 හා 2019.06.29 යන දෙදින තුළ හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන් 02ක් කොට්ඨාශ අංක 13හි කෙරමිණිය ප්‍රදේශය හා තල්ගස්ගොඩ ප්‍රදේශය ආවරණය කරමින් පැවැත්විම සම්බන්ධව ගෞරව පූර්වක ස්ත්තුතිය පුද කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරනවා ලිපියක් 2019.05.25 හා 2019.06.29 යන දෙදින තුළ හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන් 02ක් කොට්ඨාශ අංක 13හි කෙරමිණිය ප්‍රදේශය හා තල්ගස්ගොඩ ප්‍රදේශය ආවරණය කරමින් පැවැත්විණි. මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීමට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා ඇතුළු ගම්වාසින් ගරු සභාපතිතුමා , ලේකම්තුමිය ඇතුළු සියළුම නිලධාරින්ට ගෞරව පූර්වක ස්ත්තුතිය පුද කර සිටින පවට දැනුම් දෙනවා.

**තීරණය**

2019.05.25 හා 2019.06.29 යන දෙදින තුළ හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන් 02ක් කොට්ඨාශ අංක 13හි කෙරමිණිය ප්‍රදේශය හා තල්ගස්ගොඩ ප්‍රදේශය ආවරණය කරමින් පැවැත්විම සම්බන්ධව ගෞරව පූර්වක ස්ත්තුතිය පුද කිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.21 අම්බලන්ගොඩ නගර සභාව සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගියිම් කමිටු වාර්තාව සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙනවා. Canoan IR 45335I වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රය රු.45000/= ක මුදලකට ලබා ගැනිමට නිර්දේශ කර තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් පොඩි යන්ත්‍රය ගෙන වසරක් පමණ තමයි වෙන්නේ.මෙය ඉතා හොඳම එකෙන් ලබා ගන්න. මේ හේතුව නිසා තමයි මේ සභා වාර්තා ප්‍රමාද වන්නේ.මෙය සභා කටයුතු සඳහා තබා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය තාක්ෂණික ඇගයීම් කටයුතු වාර්තාව අනුව අවශ්‍ය ඡායා පිටපත් යන්ත්‍රය ලබා ගන්න

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුව එය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

**12.22 අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ 2019.07.11 දින පැවැත්විමට නියමිත ජංගම සේවයක් පැවැත්වීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලිමක් තිබෙනවා. 2019.07.11 දින ජංගම සේවයක් පැවැත්වීමට නියමිත බැවින් එම ජංගම සේවය මඟින් ප්‍රදේශයේ අක්‍රිය වී ඇති විථි පහන් නඩත්තු කිරිම සඳහා සහ මේ දිනවල පවතින ඩෙංගු උවදුර මැඩලීම සඳහා කැළිකසල එකතු කිරිම සඳහා කැළිකසල එකතු කිරිමට ට්‍රැක්ටරයත් රියදුරු සමඟ සේවක මහතුන් තිදෙනෙකුත් , විථි පහන් රථය සහ විදුලි කාර්මික මහතා සහ සහයක මහතාත් , ඉහත කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ලබා දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලිමක් කර ඇත.දැන් අපේ වැඩිපුර ට්‍රැක්ටර් රථයක් නම් නැහැ. එය ලබා දුන්නොත් එදා දිනයේ අදිනු ලබන කසළ ඇදිම නවතිනවා.මෙය අපගේ යාබද සහෝදර පළාත් පාලන ආයතනයක් නිසා මෙය ලබා දෙන්න. එම නිසා විදුලි පහන් රථය සහ රියදුරු මහතා ලබා දෙන්න. අවශ්‍ය තෙල් පහසුකම් ඒ අයට ලබා දෙන්න කියා.

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ 2019.07.11 දින පැවැත්විමට නියමිත ජංගම සේවය සඳහා විථිපහන් රථය හා රියදුරු මහතාත් , ඔවුන් මේ සඳහා අවශ්‍ය තෙල් පහසුකම් සපයා ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**12.23 මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලයේ අළුත් වැඩියා කටයුතු සිදු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලයේ අළුත් වැඩියා කටයුතු සිදුකිරිමේ කර්මාන්තය සඳහා . තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන නොමැත. මෙය නැවත ටෙන්ඩර් කිරිම සුදුසුයි. මෙම මුදල වැඩියි.

**තීරණය**

මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලයේ අළුත් වැඩියා කටයුතු සිදු කිරිමමේ කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන නොමැති අතර නැවත ටෙන්ඩර් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.24** **වැසි ජලය බැස යෑම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ පනියන්දූව පාරේ පදිංචිකරුවන් වන අපහට වැසිජලය බැස යාමට මාර්ගයක් නොමැති බැවින් කාපට් කිරිමට පළමුව බට දමා මේ ප්‍රශ්නය විසඳා ගැනීමට අප කටයතු කළ අතර ඔබතුමාගේ අණ පරිදි එම බට අද දිනයේ ගලවා දමන බැවින් අපහට ජලය බැස යාමට මාර්ගයක් නොමැති බැවින් ඉමහත් අසරණ තත්ත්වය පත්වී ඇත. එම නිසා පාර දෙපස කාණු පද්ධතිය ඉදිකොට හෝ සාධාරණව ප්‍රශ්නය විසඳා දෙනමෙන් ගම්වැසියන් කිහිපදෙනෙකු විසින් අත්සන් කර ඉල්ලා සිටිනවා. පනියන්දූව පාරේ ජලය බැස්සවීම සඳහා අනවසරව කඩා බට වගයක් දමා තිබෙනවා .

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

අපෙන් අවසර නැතුවද

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ සම්බන්ධව එක් පුද්ගලයෙකු සම්බන්ධයෙන් පැමිණිල්ලක් පැමිණියා. එහිදි එම පැමිණිල්ල සම්බන්ධයෙන් මේ බට ඉවත් කල විට ඒ පුද්ගලයා ඇවිත් කියපු දෙයක් තමයි ඇයි මගේ විතරක් ඉවත් කරන්නේ. ඉන්පසු සාධාරණ නම් අනෙක් එවත් ඉවත් කරන්න කියා නියෝග කළා.මා මේ නිරික්ෂණය කිරිමට ලේකම්තුමිය ඇත්තටම මෙතැනට යැව්වා.එතුමිය ප්‍රකාශ කළා මෙයට විසඳුමක් ලබා දිය යුතු බව.මේ තිබෙන බට වුණත් නිසි ප්‍රමිතියකට නෙමේ තිබෙන්නේ.මෙය දමනවානම් අපගේ තාක්ෂණසේවා නිලධාරින් හරහා නොමැතිව දැම්මට ඉඩ නොදෙන ලෙස මා වෙත දන්වා තිබෙනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, නිවෙස්වල ජලය බැස්සවීමට නොහැකිනේ මාර්ගයට.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

තාක්ෂණ සේවා නිලධාරි මහත්මයාණෙනි, මෙහි කාණුවක් නිර්මාණය කරන්න බැරිද?මේ සඳහා ජනතාවට විසඳුමක් දිය හැකිද ? දැනට මොකක්ද කරන්න ඕන.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මෙහි කාණුවක් යනවා නම් ෂැලැබ් දමා හරි වැසිමට වෙනවා. මොකද පාර පටු නිසා.එක තැනක් තිබෙනවා පාර ගොඩක්ම පටු.එක වාහනයක් තමයි ගමන් කිරිමට හැක්කේ . වාහන දෙකක් මාරුවිමට නොහැකියි.මේ සඳහා සවිමත් ෂැලැබ් දැමිය යුතුයි . වාහන ගමන් කිරිමට පුළුවන් විදියට.

__ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මට හිතෙන්නේ අපට මෙහි සැලැස්ම ඉල්ලා බැලිය හැකියි . ඒ අයගේ කොතනින්ද කාපට් එක අවසන් වන්නේ.එම සැලැස්ම ගෙන අපට බැලිය හැකියි කොපමණ ප්‍රමාණයක් කාණුව දැම්මට ඉතිරි වෙනවාද කියා. එහෙම නම් අපට මෙහි කාපට් කළ පසු කාණු දැම්මට දෙන්නේ නැහැනේ.ඒ අයගේ රාජකාරි මට්ටමින් සැලැස්ම ඉල්ලා බලන්න.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මෙහි නිවාස හිමියන්ගෙන් ඉල්ලා ගැනීමට නොහැකි අපට කාණු දැම්මට මාර්ගය.අපි තාප්ප ඉදිකළ තැන්වල කාණු හදා තිබෙනවා.ඒ අයට  අවශ්‍යතාවයක් නැතිනම් අපිටත් අවශ්‍ය නැහැ කාණු ඉදිකිරිමට.අපි කාණුව ඉදිකිරිමට මුදල් ලබා දෙන්නම්. මේ සඳහා නිවැසියන්ගේ කැමැත්ත ලබා ගන්න.කාපට් එක යනවා නම් මාර්ගයේ යම් කොටසක් ඉතිරි කරගත හැකියි කාණු සඳහා.මෙය සාකච්ඡා කර බලන්න.මේ සඳහා නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා හවුල් කරගෙන සාකච්ඡා කරන්න.

**තීරණය.**

පනියන්දුව ගම්වාසින් විසින් ඉල්ලා සිටින වැසි ජලය බැස යෑම සම්බන්ධව කරන ඉල්ලිමට අනුව කාණු ඉදිකිරිම සඳහා නිවැසියන්ගේ කැමැත්ත ලබා ගැනිම සඳහා ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාත් ගම්වැසියන් සමඟ සාකච්ඡාවක් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**වෙනත් කරුණු**

__ගරු නගර සභා මන්ත්‍රී අජිත් ලසන්ත කුමාර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේධානන්ද පාර ගැන ලිපියක් යොමු කරනවා.ජනක හේට්ටිතන්ත්‍රි 9/15, මේධානන්ද මාවත , අම්බලන්ගොඩ.ගරු සභාපතිතුමා, අම්බලන්ගොඩ , නගර සභාව.පාර නගර සභාවට පවරා දීම සම්බන්ධවයි.ඉහත ලිපිනයේ පදිංචි මා අම්බලන්ගොඩ නගර සභාවේ හිටපු උප සභාපති විනි හෙට්ටිතන්ත්‍රි මාගේ පියා වේ. එම පාරේ පදිංචිකරුවන්ට නිවෙස්වලට පිවිසිමට පාරක් නොමැති බැවින් මාගේ පියාගෙත් පදිංචි කරුවන්ගේ ඉල්ලිම මත පියාට අයිති ඉඩම් අයිතිය ලබා දුනි.එම නිසා මාගේ සහෝදරයින් වන තුසිත හෙට්ටිතන්ත්‍රි,ජනක හෙට්ටිතන්ත්‍රි, ලසිත හෙට්ටිතන්ත්‍රි,ජනිත හෙට්ටිතන්ත්‍රි යන අය වන මෙම පාර නගර සභාවට පවරා දීමට විරුද්ධ බව දන්වා සිටි. තවද මෙම පාරේ පදිංචිව සිටින මා නගර සභාවට මෙම පාර පවරා ගැනිමට දැඩිසේ විරුද්ධ බව දන්වා සිටි.මෙයට විශ්වාස ජානක හෙට්ටිතන්ත්‍රි විසින් ලිපියක් එවා ඇත.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පවරා දීමට විරුද්ධව ලිපියක් හමුවුයේ නැහැ. කෝ බලන්න .මීට අදාල ලිපි ගොනුව ගෙනත් තිබෙනවාද? මේ පාරේ ජානක හෙට්ටිතන්ත්‍රි කියා කෙනෙක් සිටිනවාද? එහෙම නම් මෙයත් පරික්ෂා කර ලබන සභාවට වාර්තාවක් ලබා දෙන්න.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මට රිති ප්‍රශ්නයක් තිබෙනවා.දිගින් දිගටම මේ සභාවට එකම කරුණ ගෙන එනු ලබනවා. දැන් ගිය සභාවටත් මෙය ගෙන එනු ලැබුවා. දැන් මේ සභාවටත් යොමු කරනවා.මා ඉල්ලිමක් කර සිටිනවා මේ පාර ගැන මාස 06ක් යනතුරු කිසිම දෙයක් ගෙන එන්න එපා කියා.මේ ගරු සභාව මරණාධාර සමිතියක් නෙමේ.මෙය ගරුත්වයක් තිබෙන සභාවක්. අම්බලන්ගොඩ නගර සභාව කියන්නේ.මෙයට මාසෙන් මාසයට එකම ලිපිය එවනවා.දැන් මේ සඳහා පිරිසක් මෙය හදන ලෙස ඉල්ලා සිටිනවා. තවත් පිරිසක් මෙයට විරුද්ධ බව ප්‍රකාශ කරනවා.එක් පුද්ගලයෙක් විරුද්ධ වුවත් පාර කරන්න බැහැ.මේ පාර සම්බන්ධව මාස 6ක් යනතුරු මේ සභාවට යෝජනාවක් හෝ ලිපියක් ඉදිරිපත් කිරිම නොකරන ලෙස මා යෝජනා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මට අපගේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා සමඟ කිසිම ප්‍රශ්නයක් නැහැ.ගරු පළාත් පාලන කොමසාරිස්තුමා ඔබතුමා දැනුවත් කර තිබෙනවා.ගරු සභාවටත් ලිපියක් ලැබි තිබෙනවා පාර පවරනවා කියා.නිවෙස් හිමියන් 5කු අත්සන් කර විෂයභාර ගරු අමාත්‍යතුමා හා පළාත් පාලන කොමසාරිස්තුමාත් හැල්ලුවට ලක් කිරිමකි. මෙහි විශාල ගැටළුවක් තිබෙනවා ඔබතුමාට.ගරු සභාපතිතුමා විදියට අඩුම ගණනේ මේ සම්බන්ධව සාකච්ඡාවක් හරි ලබා දෙන්න.විෂයභාර මන්ත්‍රිතුමාගේ පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රිවරයෙක් විදියට අපිත් හරි අසරණයි.මොකද ගම්පෙරළිය වැඩසටහන යටතේ පළාත් පාලන ආයතන වලට මුදල් ලැබෙන විට මෙතුමාගේ මේ ප්‍රශ්නය උඩ අපිටත් මුදල් ලැබෙන්නේ නැහැ.එහි ලොකු ගැටළුකුත් තිබෙනවා.මෙය කිරිම පිළිබඳ මා පුද්ගලිකව මා ඔබතුමා සමඟ ගැටුමක් නැහැ.මා අගය කරනවා මෙතුමාගේ පෞද්ගලික මුදල් වලින් මෙය කිරිම ගැන.එය කිරිමට ඉදිරිපත් වීම සම්බන්ධව.තවත් කරුණක් තමයි පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා එවන ලද මුදල් තිබියදි ඇස්තමේන්තුගත කර තිබියදි මෙය මා අනුමත කරන්නේ නැහැ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරයෙක් ලෙස .එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරු සියළුදෙනාම අනුමත කරන්නේ නැහැ මේ සම්බන්ධව.මෙහි පක්ෂ පාට භේද වැඩක් නැහැ . දේශපාලන කතන්දර වැඩක් නැහැ. විෂයභාර අමාත්‍යතුමා එවන ලද මුදල් වලින් මෙය සැදිය යුතුයි කියන දැඩි තීරණයේ අපි ඉන්නවා.මෙය ක්‍රියාත්මක නොවුණහොත් මීට වඩා දෙයක් අපට ක්‍රියාත්මක කරන්න වෙනවා.ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ සම්බන්ධව තීරණයක් ගන්නා ලෙස.

ගරු නගර සභා මන්ත්‍රී අජිත් ලසන්ත කුමාර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , ගමේ පුද්ගලයෙක් විරුද්ධ වි තිබෙනවා මේ සඳහා. පවුලේ 6කු විරුද්ධ වි තිබෙනවා මේ සඳහා.මේ අයගේ ඉඩමෙන් තමයි මේ පාර දි තිබෙන්නේ.අඩි තුනක පාරක් මෙහි තිබි ඇත්තේ.මේ නිවෙස්හිමියන්ට යන්න ඕන නිසා තමයි මේ පාර දි තිබෙන්නේ.එම නිසා මේ අය නගර සභාවට පාර පවරන්න කිසිසෙත්ම කැමති නැහැ.මේ පාර 60% ක් අයිති ඒ අයට.තාත්තා ජීවතුන් අතර සිටිනකන් කිව්වේ මගේ පාර කියා.මා කාටවත් ලියලා දෙන්නේ නැහැ. නගර සභාවට පවරන්නේ නැහැකියා.හිටපු උප සභාපතිකෙනෙක් අම්බලන්ගොඩ නගර සභාවේ.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ගරු උප සභාපතිතුමාගේ යෝජනාව ස්ථිර කරනවා.මෙය නිතරම මෙය තුවාලයක් වගේ පැරි පැරි යනවා.මටත් හිතෙනවා විශේෂ සාකච්ඡාවක් හරි තබා මේ ප්‍රශ්නය විසඳාගත යුතු බව.එහෙම නැතුව මේ සභාවට නිතරම මෙය ගෙනඑන එක වදයක් වෙනවා. සභාවේ කාලය නාස්ති වෙනවා.මේ සඳහා නිත්‍යානුකුල පියවරක් ගන්නා ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.යම් යම් අය සතුටු කිරිම නෙමේ.නිත්‍යානුකුලව සොයා බලා නිත්‍යානුකුලව පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.අපිට එදා

පැවති වැඩමුළුවේදී පැවසූ පරිදි අපට මේවාට මුදල් ගෙවන්නයි, මේවාට වගකියන්නත් අපට සිදුවෙයි.ඒ අනුව නිත්‍යානුකූල නීතිමය අනුගමනය කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී අජිත් ලසන්ත කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මේ පාර කලින් සභාවට පවරා තිබෙනවා නේද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ කලින් පවරා නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙතුමා කතා කළාට මේ පාර ගන්න කිසිම අවශ්‍යතාවයක් නැහැ. මේ පාර පවරා නැහැ. මා ගිය සභාවේ මේ පාර සම්බන්ධ ලිපියක් අයින් කර දැමුවා. මෙහෙම ගන්න රපා. මේ සභාවට කිසිම අයිති නැති දෙයකි මේ කතා කරන්නේ.නගර සභාවට පැවරීම සඳහා දෙනු ලබන අයදුම්පත්‍රවල නගර සභා මන්ත්‍රීවරු දෙදෙනෙකු අත්සන් කළ යුතුයි.එකම මන්ත්‍රීවරයෙක්වත් අත්සන් කර නැහැ.හිටපු මන්ත්‍රීවරයෙක් අත්සන් කර තිබෙනවා. එය නිත්‍යානුකූල නැහැ.එම නිසා මෙය ගන්න එපා. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මෙය ගන්න එපා කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව අපි සම්පූර්ණ නිත්‍යානුකූලව තමයි කටයුතු කරන්නේ.මේ සම්බන්ධව අපි ගරු අමාත්‍යතුමාටත් දන්වා තිබෙනවා. මේ පාර නිසි විදියට සභාවට පවරා දී නැති බව.එම නිසා මෙය අපට ඉෂ්ඨ කිරීමට නොහැකි බව දන්වා තිබෙනවා.හැබැයි ඔබතුමාලා ඔය මාස 6කට වරක් කතා කරන්න කියන එක තිබෙන්නේ යෝජනා වාරයේ විතරයි.ලිපි සම්බන්ධව එහෙම සඳහනක් නැහැ.එම නිසා මේ ලිපිය ඉදිරිපත් කරනු ලැබුවේ මා නොවේ.අපේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාමයි.එතුමාට පැහැදිලි කරගැනීමට ඉදිරිපත් කර නිසා මා එය යොමු කළා.නමුත් යෝජනා වාරයේ යෝජනාවක් දැමුවානම් මා ප්‍රතික්ෂේප කරනවා.දැනට මේ සම්බන්ධව අදාල අමාත්‍යතුමාට දන්වා තිබෙනවා.ගරු අමාත්‍යතුමාට අවශ්‍ය නම් නීතිය කඩා වෙනත් ආයතනයක් ලවා මෙය ඉටුකරගත හැකියි.හැබැයි එය කරන්නේත් නීතිවිරෝධීව තමයි ගරු අමාත්‍යතුමා.මේ වගේ ක්‍රම සහ විධි පාවිච්චි කරනවා.එ විදියට කළ හැකියි.

පෙරවරු 03.50 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් විය.

රණසි උත්පල ගුණවර්ධන මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2019.07.31 වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය